සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

## 2017

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
වාර්ෂික වාර්තාව - 2017

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

CONCEPT, LAYOUT & DESIGN
කලාව
613/3, High Level Road, Gangodawila,
Nugegoda, Sri Lanka.
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

**වාර්ෂික වාර්තාව 2017**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
1 වන මහළ, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05
දුරකථන: 011 2581704 / ෆැක්ස්: 011 2806832
විද්‍යුත් තැපෑල: finance@etfb.lk / වෙබ්: www.etfb.lk

# පටුන පෙළගැස්ම


## 01 ආයතනික දළ විශ්ලේෂණය

| | | |
|---|---|---|
| 1.1 | මෙම වාර්තාව පිළිබඳ කරුණු | 7 |
| 1.2 | අප කවුරුන්ද යන වග | 8 |
| 1.3 | අපගේ වගකීම්හී ප්‍රස්තුතය | 8 |
| 1.4 | ආයතනික සමාලෝචනය | 10 |
| 1.5 | කාර්ය සාධනයේ සුවිශේෂ අවස්ථා | 13 |
| 1.6 | 2017 කරුණු සම්පිණ්ඩනය | 16 |
| 1.7 | 1981 සිට 2017 දක්වා විශේෂ කඩඉම් | 18 |
| 1.8 | පසුබිම් විග්‍රහය | 20 |

## 02 සාංගමික භාරකරත්වය

| | | |
|---|---|---|
| 2.1 | අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 26 |
| 2.2 | සභාපතිවරයාගේ සමාලෝචනය | 28 |
| 2.3 | අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 30 |
| 2.4 | පාලන වාර්තාව | 32 |
| 2.5 | අවදානම් කළමනාකරණ වාර්තාව | 37 |

## 03 මූල්‍ය තොරතුරු

| | | |
|---|---|---|
| 3.1 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 43 |
| 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 45 |
| 3.3 | කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 46 |
| 3.4 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 48 |
| 3.5 | ආයෝජන පිළිබඳ ප්‍රකාශය | 49 |
| 3.6 | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 51 |

## 04 පරිපූරක තොරතුරු

| | | |
|---|---|---|
| 4.1 | විගණකාධිපති වාර්තාව 2017 සහ මණ්ඩලීය නිරීක්ෂණ | 88 |
| 4.2 | සංඛ්‍යා ලේඛනමය ඇමුණුම් | 353 |
| 4.3 | වෙනත් ඇමුණුම් | 357 |



01

# ආයතනික දළ විශ්ලේෂණය

# මෙම වාර්තාව පිළිබඳ කරුණු

මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ 37 වන වාර්ෂික වාර්තාවයි. 2017 වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් සිය ප්‍රතිලාභීන් වෙත හා අනෙකුත් පරදු දරන පාර්ශව වෙත ආයතනය විසින්  අගය උත්පාදනය කර දෙනු කර දෙනු ලැබ ඇති ආකාරය පිළිබඳ පරිපූර්ණ සවිස්තයක් මෙම වාර්තාව මගින්සැපයේග කෙටි, මධ්‍යම හා දිගු යන කාල පරාසය මුළුල්ලේ අප අපගේ කීර්තිමත් පරදු දරණ පාර්ශව කරුවන් සමග එක්ව ආයතනයේ අගය උත්පානය නැංවීමෙහිලා අප කළ අද්විතීය මෙහෙවර බෙදා හදා ගැනීම මෙම වාර්තාවෙහි අභිලාෂයයි. එමගින් අරමුදලේ උපාය මාර්ගය, පාලනය හා කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සංනිවේදනයක් ගෙනහැර දක්වනවා මෙන්ම ආයතනයේ මූල්‍යමය කාර්ය සාධනය හා ඒ තුළින් ආයතනය විසින් ජනනය කරනු ලබන සමාජමය මං සලකුණු අතර සබඳතාව ද නිරූපණය කරයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලැබ තිබේ. පොදු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ඨ චර්යා ආචාර ධර්ම පද්ධතියට අනුවත්, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට අනුකූලවත් ආයතනය විසින් කටයුතු කරනු ලැබිය යුතු ආකාරය ආයතනික පාලනය පිළිබඳ වාර්තාව මගින් සාකච්ඡා කර ඇත.

මෙම වාර්තාව තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දෙයාකාර දත්ත සමන්විත වන අතර සංසන්දනය කිරීම් හා වැඩිමනත් විශ්ලේෂණ හැකි සෑම අවස්ථාවකදීම පහසුවෙන් ගෙනහැර දැක්විය හැකි පරිදි ගුණාත්මක තත්වයේ දත්ත සැපයීම අපගේ අභිප්‍රාය වනු ඇත. මූල්‍ය ප්‍රකාශ හා ඊට සම්බන්ධ සටහන් රජයේ විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන අතර ඒවා සහතික කරනු ලැබීමේ වාර්තාවක්ද මෙම වාර්ෂික වාර්තාව තුළ අඩංගුවේ.

2017 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වන අරමුදලේ ප්‍රධාන කාර්යාලය හා එහි ශාඛා ජාලය හරහා ක්‍රියාත්මක වන මෙහෙයුම් කටයුතු පිළිබඳව 2017 වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කරුණු මගින් ආවරණය කෙරෙන අතර මෙම වාර්තාව හා ආසන්නතම වාර්තාව වන 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් කාල පරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක දත්ත 2017 වර්ෂයට අයත් මෙම වාර්ෂික වාර්තාව පුරා නිරූපණය කර ඇත. අප ආයතනයට මෙන්ම එහි පරදු දරන ප්‍රමුඛ පාර්ශවකරුවන්ටද වැදගත් වන්නා වූ කරුණු කාරණා පිළිබඳව අවධාරණය කරමින් මෙම වාර්තාවේ අන්තර්ගතය ගොඩනංවා ඇත.

# අප කවුරුන්ද යන වග

1980 අංක 46 දරන පනත යටතේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්ථාපිත කරන ලද අතර 1981 මාර්තු මස 01 වන දින සිට එම මණ්ඩලය සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද්දේය. කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරනු ලැබූ මෙම අරමුදල් මණ්ඩලය මේ වන විට ක්‍රියාත්මක වනුයේ සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයීය බලසීමාව යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොලබන රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිතයන්ගේ සහ පෞද්ගලික අංශයේ සියලුම සේවා නියුක්තිකයන් මෙම අරමුදලේ සාමාජික සාමාජිකාවන් වන අතර ඔවුන් සේවයේ නියුතු ආයතනයන්හී ඔවුන්ගේ සේවායෝජකයන් විසින් එකී සේවක සේවිකාවන්ගේ දළ ඉපැයීම්වලින් 3% ක්වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත මාසිකව ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. ඒ අනුව, සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, සේවකයා / සාමාජිකයා වෙනුවෙන් අදාළ සේවා යෝජකයා විසින් පමණක් දායක වීම් සිදුකරනු ලබන අතර එබැවින් මෙම අරමුදල සාමාජිකයා හෝ සාමාජිකාව විසින් දායක මුදල් ගෙවනු නොලබන දායකත්ව ක්‍රමයක් වන්නේය. රටේ ආර්ථිකය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් සලසා දෙන ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සහ විගමනික ශ්‍රමිකයන් ස්වේච්ඡාවෙන්ම මෙම අරමුදලෙහි සාමාජිකත්වය ලබා ගැනීම ඉහළ නැංවීම උදෙසා විශේෂ අවධානයක් යොමු කර තිබේ.

**මණ්ඩලයේ අරමුණු**

(අ) මූල්‍ය සම්පාදනය හා ආයෝජනය යන කාර්යයන්හී නිරතවීම තුළින් සේවක හිමිකම, සේවක සුභසාධනය හා ආර්ථික ප්‍රජාතන්ත්‍රය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යවසායන්හී කොටස් හිමිකාරිත්වය අත්කර ගැනීම තුළින් කළමනාකරණයෙහිලා සේවක සහභාගිත්වය වැඩිදියුණු කිරීම;

(ඇ) සේවා නියුක්තිකයන්ට සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී තමන් විසින් කරන ලද දායකත්වයකින් තොර ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධිවිධාන සලසා දීම; සහ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

# අපගේ වගකීම්හී ප්‍රස්තුතය

## අපගේ දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශීලී හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

## අපගේ මෙහෙවර

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශීලී හා විචක්ෂණශීලී භාරයක් වීම.


## අපගේ සාරධර්ම

- නිර්මාණශීලී, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහඳශිලි සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ
- තෘප්තිමත් පාරිභෝගිකයින්





# ආයතනික සමාලෝචනය




භාරකරුවකුගේ හෙවත් ආරක්ෂකයෙකුගේ කාර්ය භාරය සාක්ෂාත් කිරීම සඳහා වූ මනාව සැදුම්ලත් සම්මුතිගත ආයතනික ව්‍යුහයක් ස්වකීය වර්තමාන සේවා සන්දර්භය තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හිමිකර ගනු ලැබ ඇත. මණ්ඩලීය කළමනාකරණයේ අභිලාෂය වනුයේ, මෙම ආයතනය අනාගතයේදී වඩාත් ඵලදායී ආයතනයක් වනු පිණිස එම අරමුණ කරා මෙහෙයවීමයි. මණ්ඩලයේ සංවිධානමය ව්‍යුහය පිළිබඳව පනත තුළින් නිශ්චිත කිසිවක් ප්‍රකාශ නොවේ. එසේ වුවද, පනතේ 5 වන වගන්තිය යටතේ සඳහන් කරනු ලැබ ඇත්තේ මණ්ඩලයට ස්වකීය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා නීති රීති සම්පාදනය කර ගත හැකි බවය.අරමුදලේ කටයුතු කළමනාකරණය කිරීමේ සමස්ථ වගකීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික සාමාජිකාවන් 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් 4 දෙනෙකු අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර මුදල් හා වෙළඳ විෂයන් භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙකු බැගින් වූ සාමාජිකයන් දෙදෙනෙකු ද, ලංකා හාම්පුතුන්ගේ සංගමය මගින් නම් කරනු ලබන ලබන එක් සමාජිකයෙකුද, සාමාජික සංඛ්‍යාව 100,000 කට වැඩි සේවක පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිති අතුරින් සාමාජිකයන් දෙදෙනෙකුද තවදුරටත් ඊට ඇතුළත් වේ.

මණ්ඩලයේ සභාපතිවරයා අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි තෝරාගනු ලබන අතර පනත මගින් විධිවිධාන සලසා ඇති පරිදි ඔහු අදාළ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද කටයුතු කළ යුතු වන්නේ ය. සේවා යෝජකයන්ගෙන් බහුතර පිරිසක් බස්නාහිර පළාත කේන්ද්‍රකර ගනිමින් සේවය කළ හෙයින් ආරම්භයේදී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මධ්‍යගත ආයතනයක් ලෙස ව්‍යුහගත කොට ක්‍රියාත්මක කෙරිණි. වැඩි සඵලතාවක් සහිත ප්‍රදේශ තුළ ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල සේවා ජාලය ආශ්‍රිත ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ සටහන නිම කරනු ලැබීමෙන් පසුව බලාත්මක කිරීමේ කටයුතුවල හා නීතිමය කටයුතුවල සීඝ්‍ර සංවර්ධනයක් සිදු විය.පසු කාලීනව, හිමිකම් ඉල්ලුම්පත් භාර ගැනීම, හිමිකම් ගෙවීම සහ සාමාජික සාමාජිකාවන් දැනුවත් කිරීම ආදී බොහෝමයක් සාමාජික කටයුතු විමධ්‍යගත කරන ලදි.

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කෘත්‍යාත්මක කාර්ය ක්ෂේත්‍රයන් මෙහෙයුම් කටයුතු සහ සහායක සේවා යනුවෙන් පුළුල් වශයෙන් බෙදිය හැකි ය. මෙහෙයුම් කටයුතු හඳුනා ගැනෙනුයේ රැස් කිරීම් හා සේවායෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන වශයෙනි. පරිපාලන හා මානව සම්පත්, මුදල්, තොරතුරු තාක්ෂණ සහ අභ්‍යන්තර විගණන කටයුතු සහායක සේවා වශයෙන් හඳුනාගනු ලැබ තිබේ.

පනතෙහි නිශ්චිතව සඳහන් පරිදි, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීමේ බලය සභාපතිවරයා සතුව ඇත. සාමාන්‍යාධිකාරී වරයා සහ අතිරේක සාමාන්‍යාධිකාරී වරයා ප්‍රධාන විධායක නිලධාරී වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරනු ඇත. එක් එක් කෘත්‍යාත්මක කාර්ය ක්ෂේත්‍රයක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයෙකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. සභාපතිවරයාගේ / ප්‍රධාන විධායක නිලධාරී වරයාගේ කටයුතුවලට සහය වනු පිණිස ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක්ද ස්ථාපනය කර ඇත.ඒ අනුව බලන කළ ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය සහතික කරනු පිණිස සර්වග්‍රාහී ආයතනික ව්‍යුහයක් සකසනු ලැබ තිබේ.

# මණ්ඩලයට අයත් කොට්ඨාශවල / අංශවල / ඒකකවල කර්තව්‍යයන්



## 1 රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාශය

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවක සේවිකාවන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යයන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

## ආයෝජන අංශය 2



ආයෝජන අංශය මණ්ඩලයේ ආයෝජන කාර්යභාරය කළමනාකරණය කිරීම අරබයා පිහිටුවනලද ආයතනයට අයත් දැඩිව සහ බද්ධ වූ ව්‍යාපාරික ඒකක වලින් එකකි. මෙම ඒකකයෙහි ප්‍රමුඛ අරමුණ වනුයේ, ආයෝජන තුළින් හැකි උපරිම ලාභ සලසා ගන්නා අතරම ඒවායේ ආරක්ෂාව සහතික කරමින් ද්‍රවශීලතා මට්ටම පවත්වාගෙන යාමයි. ආයෝජන තීරණ වලට එළඹීම පිණිස වන්නා වූ සියලු කරුණු ග්‍රහණය කර සෑදූ ආයෝජන ප්‍රතිපත්තියක් ආයෝජන අංශය සතුය.




## 3 සාමාජික සේවා අංශය

මෙම අංශයට අයත් ප්‍රධාන කර්තව්‍යයන්හීලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජික සාමාජිකාවන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සමාජික සාමාජිකාවන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තරගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

## මුදල් අංශය 4



මුදල් අංශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හීලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙළ කිරීම යනාදී කටයුතු අන්තර්ගත වේ.



## 5 පාලන හා මානව සම්පත් අංශය

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවු නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් අංශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදිනු ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවු පුහුණුවලබා දීම සඳහාත් විවිධ මුල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

## තොරතුරු තාක්ෂණ අංශය 6



අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ අංශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

## 7 විගණන හා සහතිකායන අංශය



ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්,එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වරයා වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත් භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායි මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය.

## නීති අංශය 8



මණ්ඩලයට අදාළ වන්නාවූ සියලුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) වරයාගේ අධීක්ෂණය යටතේ නීති අංශය කටයුතු කරන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සබඳතා) වරයා වෙත ඔහු/ඇය වාර්තා කරයි.

## 9 සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය



වාර්ෂික පදනමක් මත සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙනුවෙන් ආයතනික සැලැස්මක් පිළියෙළ කිරීමත්, එය අභිමන්ත්‍රණය කිරීම, යාවත්කාලීන කිරීම හා ප්‍රතිශෝධනය කිරීමත්, එක් එක් වර්ෂයේ ජනවාරි මස 1 වන දින වන විට ක්‍රියාත්මක කිරීම පිණිස නව සැලැස්මක් ලබා දීමත්, ඊට අමතරව, මාසික/ කාර්තුමය/ වාර්ෂික පදනමක් මත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ආයතනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තා කිරීමත්, අමාත්‍යාංශ, පාර්ලිමේන්තුව හා අනෙකුත් ආයතන වෙත කාලානුරූපී අයුරින් අවශ්‍ය නිවැරදි කිරීම් හා ව්‍යවස්ථාපිත වාර්තා කිරීම් සිදු කිරීමත්, මණ්ඩලයේ කළමනාකරණය සඳහා පාලනාධිකාරියට අවශ්‍ය ඵලදායි තීරණ ගැනීම පිණිස ඉවහල් වන්නාවූ පර්යේෂණ ඵලදායි ලෙස කලට වේලාවට පැවැත්වීමත් සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ.

## සංඛ්‍යා ලේඛන අංශය 10



ඵලදායී ලෙස  තීන්දුවලට එළඹිය හැකි වනු පිණිස අදාළ සියලු දෙනා වෙත තථ්‍ය කාල දත්ත සමුදායක් ලබා දීමත්, අවශ්‍ය දත්ත පිළිබඳව ප්‍රවනතා විග්‍රහයක් පිළියෙළ කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීමත්, කාලානුරූපී පදනමක් මත ඉදිරි වර්ෂ සඳහා පුරෝකථන හා සැලසුම් ඉදිරිපත් කිරීමත්, වාරමය වශයෙන් කළමනාකාරීත්වයට තීරණ ගැනීම පිණිස අවැසි වන්නාවූ වැදගත් සංඥා සපයා දීමත්, ජාතික ක්‍රම සම්පාදනය සහ එය ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ආයතන වෙත කාණ්ඩගත හා සුවිගත තොරතුරු ප්‍රචලිත කර හැරීමත් සංඛ්‍යා ලේඛන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ.

# කාර්ය සාධනයේ සුවිශේෂ අවස්ථා

ආයෝජන ආදායම:
රු. බි. 20

ආයෝජන මත ලාභය:
11%

ලාභය:
රු. බි. 24.4

මුළු වත්කම්:
රු. බි. 279

මුළු සේවා නියුක්තයන් ගණන:
994

සාමාජික අරමුදල:
රු. බි. 274


ශාඛා:
19

ගෙවූ මුළු ප්‍රතිලාභ සහ ආපසු ගෙවීම්:
රු. බි. 17.2


වටිනාකම් උත්පාදනය

## සාමාජික දැක්ම


**පොලිය හා ලාභාංශ (රු.බි)**




**ආදායමට අනුව වියදම් (රු.මි.)**




## ආයෝජන කළඹ 2017





# සේවා නියුක්තික දැක්ම


### සේවා නියුක්තික ශීර්ෂ ගණනය (සංඛ්‍යාව)




### පුහුණු හා සංවර්ධන පිරිවැය (රු.මි.)





### මුළු කාර්ය මණ්ඩල පිරිවැය (රු.මි.)




## රජයේ දැක්ම

**රජයට ගෙවන ලද බදු (රු.මි.)**





**රජයේ සුරැකුම්පත්හි මුළු ආයෝජනය (රු.මි.)**




## ජනප්‍රජා දැක්ම

**ප්‍රතිලාභ යෝජනා ක්‍රම (රු.බි.)**





# 2017 කරුණු සම්පිණ්ඩනය

**2017 වර්ෂය තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සවිමත් කාර්ය සාධනයක් වාර්තා කළ අතර බොහෝ වැදගත් ජයග්‍රහණ දිනා ගත්තේය. එබඳු ජයග්‍රහණ සමරහක් පහත ඉස්මතු කර දක්වා ඇත.**

- වසර වෙනුවෙන් සේවා යෝජකයන් විසින් එවන ලද මුළු දායක මුදල් ප්‍රමාණය රු.බිලියන 22.8 ක් වශයෙන් ගණනය වූ අතර ඉකුත් වසර හා සසඳන කළ එම ප්‍රමාණය 12 % ක වැඩිවීමක් වුයේය.

- මෙම වසරේදී උපයන ලද මුළු ආයෝජන අදායම රුපියල් බිලියන 28.1 ක් වූ අතර, එය පසුගිය වසරේදී උපයන ලද රුපියල් බිලියන 24.0 හා සැසඳීමේදී 17% ක වර්ධනයක් පෙන්නුම් කල අතර, සමාලෝචිත වර්ෂාවසානයේදී ආයෝජන කළඹේ වටිනාකම රුපියල් බිලියන 235 සිට රුපියල් බිලියන 262 ක් දක්වා වර්ධනය විය.

- රු. බිලියන 20.4 ක් වශයෙන් ඉකුත් වසර තුළ මණ්ඩලය ඉපැයූ ශුද්ධ ලාභය සමාලෝචිත වසර තුළ රු. බිලියන 24.4 ක් වූයේ ය.

- අරමුදලට අයත් මුළු ශුද්ධ වත්කම් වටිනාකම වසර අවසානය වන විට රු. බිලියන 279 ඉක්මවීය.

- 2017 වර්ෂය සඳහා සිය සාමාජිකයන් වෙත 9% ක් වූ මුළු ප්‍රමාණයක පොලී හා ලාභාංශ අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලයට හැකි විය. රාජ්‍ය බැංකු මගින් ස්වකීය ගණුදෙනුකරුවන් හට පිරිනමනු ලබන ඉතුරුම් අනුපාත හා සසඳන කළ ආකර්ෂණීය අනුපාතයකි.

- මුළු අදායමෙහි ප්‍රතිශතයක් වශයෙන් මෙහෙයුම් වියදම් අළලා 2016 දී වාර්තා වූ 7.2% ක් වූ ප්‍රමාණය 2017 වසර තුළ 6.6% ක් දක්වා පහත වැටී ඇත. මෙය කාල පරිච්ඡේදය සඳහා ආයතනයේ වර්ධිත මෙහෙයුම් කාර්ය සාධනය තුළ දිස්වූ පිළිබිඹුවකි.



- ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය, වව්නියාව හා නුවරඑළිය යන නගරවල නව ප්‍රාදේශීය කාර්යාල 02ක එකතුවීමත් සමග වසර තුළ නොකඩවා ඵලදායී ලෙස ක්‍රියාත්මක විය. හිඟහිට ඇති දායක මුදල් හා අධිභාරත්, නෛතිකව ලැබිය යුතු මුදල් ප්‍රමාණත් අයකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොදවන ලද්දේ ය.

- සාමාජික සාමාජිකාවන් වෙත කාර්යක්ෂම සේවයක් ලබා දෙමින් ගම්පහ, මහනුවර, මාතර, බදුල්ල හා කුරුණෑගල යන ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ විමධ්‍යගත හිමිකම් ගෙවීමේ වැඩසටහන සාර්ථක අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදි.

- සේවා යෝජකයන් විසින් ප්‍රධාන කාර්යාලය වෙත චෙක්පත් මගින් මාසිකව කරනු ලබන දායක මුදල් ගෙවීම්වලට අමතර වශයෙන් අපගේ ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය මෙන්ම ලංකා බැංකුවේ නගර කාර්යාලයේ ස්ථාපිත රැස්කිරීම් කාර්යාලය ඔස්සේ ද ගෙවීම් සිදුකළ හැකි විය.

- සමාලෝචිත වසර තුළ 'EISA' (සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පරීක්ෂණය සහ ක්‍රම පරිපාලනය) ව්‍යාපෘතිය සාර්ථක අයුරින් දියත් කෙරිණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ, දායක මුදල් රැස්කිරීම් විෂයෙහි ආවරණය පුළුල් කරනු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වේගවත් කිරීමයි.

- ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) ශිල්පීය හා මූල්‍ය සහය ඇතිව මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදි.

- 2016 වසර තුළ කොටස් හිමිකම් ආයෝජනය මත ඉපැයුම් ලෙස ගණනය වූ රු. මිලියන 552 හා සසඳන කළ, පසුබටව පැවති වෙළඳපළ තත්වයන් මධ්‍යයේ වුවද, එකී ආයෝජන මත ඉපැයුම් ප්‍රමාණය රු මිලියන 972 ක් වශයෙන් ලබා ගැනීමට මණ්ඩලයට හැකි විය.

# විශේෂ කඩඉම්

## 1981 සිට 2017 දක්වා

**1986**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
**රු. 100,000/-**

**1989**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
**රු. 200,000/-**

**1991**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
**රු. 300,000/-**

**1992**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය :
**රු. 18,000/-**

**1994**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය :
පහ වසර ශිෂ්‍යත්ව :
**රු. 15,000/- බැගින් ශිෂ්‍යත්ව 9,000**

**1997**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ
වියදම් ප්‍රතිපූර්ණය :
පහ වසර ශිෂ්‍යත්ව :
"ශ්‍රම සුව රැකවරණ" රෝහල්ගතවීමේ
වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
**වසරකට රු. 25,000/- බැගින්**
**රු. 50,000/- ක උපරිමයක් දක්වා**
**මුළු සේවා කාලය තුළදී**

**2002**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ
වියදම් ප්‍රතිපූර්ණය : පහ වසර ශිෂ්‍යත්ව :
"ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ
වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය :
"වියන" අඩු පොලීනිවාස
ණය යෝජනා ක්‍රමය

**2006**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ
වියදම් ප්‍රතිපූර්ණය : පහ වසර ශිෂ්‍යත්ව :
"ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ
වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය :
"වියන" අඩු පොලීනිවාස
ණය යෝජනා ක්‍රමය:
වකුගඩු බද්ධ කිරීම සඳහා
මූල්‍යාධාර :
**රු. 300,000/-**

**2010**

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය :
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර :
අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීමේ
වියදම් ප්‍රතිපූර්ණය : පහ වසර ශිෂ්‍යත්ව :
"ශ්‍රම සුව රැකවරණ" රෝහල් ගතවීමේ
වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය : "වියන" අඩු
පොලී නිවාස ණය යෝජනා ක්‍රමය:
වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර :
පහ වසර ශිෂ්‍යත්ව : **රු. 15,000/-**
(නිත්‍ය දුබලතාවට පත්වීම හේතුවෙන් සේවා
නියුක්තිය අවසන් කිරීමට සිදුවූ සේ.නි.භා.අ.
සාමාජික සාමාජිකාවන්)
අ.පො.ස. (උ/පෙළ) සමත්
ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මූල්‍යාධාර : **රු. 12,000/-**

**2016**

2010 වසරේ සියලු
කාර්යඵල අත්කර
ගැනීම සහ අභ්‍යන්තර
අක්ෂිකාච බද්ධ කිරීමේ
වියදම් ප්‍රතිපූර්ණය :
**රු. 30,000/-**

# පසුබිම් විග්‍රහය

## I) ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන (ශදුඅත)

අභ්‍යන්තර සාධක

සහය දක්වන සාධක

### ශක්තීන්

I. දායක මුදල් රැස්කිරීම, නීති බලාත්මක කිරීම සහ මෙහෙයුම් ක්‍රියාවට නැංවීම සඳහා උපයෝගී කරගනු ලබන හරවත් හා බාධා විරහිත ක්‍රියාවලි

II. පවත්නා සවිමත් ප්‍රතිලාභ යෝජනා ක්‍රම හේතුවෙන් සාමාජිකත්වය ආකර්ෂණය වීම

III. ඉහළ ද්‍රවශීලතා තත්වය

IV. පනත මඟින් පවරා දෙනු ලැබ ඇති ඒකාධිකාරය

V. ආදායම් උපදවන වටිනා වත්කම් හිමිකාරිත්වයක් පැවතීම

VI. අරමුදල් කළමනාකරණය විෂයෙහි පවත්නා ස්වායත්තතාව

VII. වියපැහැදම් ගෙවීමේ කඩිනම් පහසුකම්

VIII. සේවයේ රඳවා තබාගැනීමේ සඳහා සුවිශේෂී කාර්ය මණ්ඩල දීමනා ප්‍රදාන ක්‍රමය

IX. ප්‍රබල නීති බලාත්මක කිරීමේ හා නෛතික මොඩියුල හා ජාල සේවා ඉටුකිරීමේ ක්‍රමවේදයක් පැවතීම

ශ

පීඩාකාරී සාධක

### දුර්වලතා

I. ප්‍රහල මෙහෙයුම් ක්‍රියාදාමයක් සඳහා පහසුකම් නොමැතිකම

II. දායක මුදල් රැස්කිරීමේ ආවරණ කලාප ප්‍රමාණවත් නොවන අයුරින් මායිම් නියමකර තිබීම

III. තමන්ගේම වූ කාර්යාල සංකීරණයක් සහ ඉඩකඩ වත්මන් මෙහෙයුම් කටයුතු සඳහා නොපැවතීම

IV. ඵලදායී තීරණ ගැනීම පිණිස දත්ත සමුද්ධරණය සඳහා ප්‍රමාණවත් ක්‍රමවේද නොමැති වීම

V. වැරදි සිදුවන අයුරින් හා සැලසුම් ක්‍රියාදාමයෙහි වේගය අඩාල වන අයුරින් දැනට භාවිතයෙහි පවත්නා යල්පිනූ පරිගණක වැඩසටහන්

VI. ප්‍රමාණවත් පරිදි දත්ත සමුදාය නොමැති වීම

VII. මෙහෙයුම් කටයුතු ඉටුකෙරෙන මාධ්‍යයෙහි අසමතුලිත බව (දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය)

දු

බාහිර සාධක

අ

I. මීළඟ පස් වසර තුළ රැකියා දස ලක්ෂයක් සැපයීමේ රජයේ යෝජනාව

II. පුද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම

III. ව්‍යවසායකත්ව සංස්කෘතියෙහි ඉහළ යාම

IV. විදේශීය ආයෝජකයින් රටට පැමිණීමේ වර්ධනය

V. ක්ෂුද්‍ර මූල්‍ය  සඳහා වූ ඉහළ යන ප්‍රවනතාව

VI. ජාතික අවම වැටුප වැඩිවීම

VII. නව රජයේ සංවර්ධන උපාය මාර්ග

### අවස්ථා

ත

I. ආයෝජන කෙරෙහි පවතින වෙළඳපළ අවරෝධතා

II. ඉහළ  ලාභ උපදවන ආයෝජන වෙළඳපළ තුළ නොමැති වීම

III. ගෝලීය අර්බුදවල වත්මන් ප්‍රවනතාව

IV. දැඩි පාරිසරික නීති හා රෙගුලාසි පැනවීමේ ප්‍රවනතාව ඉහළ  යාම


V. සේවයෙන් විශ්‍රාම ගැනීමේ අනුපාතයෙහි ඉහළ යාම

VI. අඩු ලාභාංශ අනුපාතයක් උද්ගත කෙරෙන දැනට පවත්නා අඩු පොලී අනුපාත

### තර්ජන

## II) ආර්ථික දෘෂ්ටිය


### මූර්ත දළ නිෂ්පාදිතයේ වර්ධනය




Source: CBSL & ADB (Asian Development Outlook 2017)


දළ දේශීය නිෂ්පාදිතය 2016 වසරේ අනුරූපී කාර්තු හා සසඳන කළ, 2017 වසරේ පළමුවන හා දෙවන කාර්තුව තුළ 3.9% කින් හා 4% කින් වර්ධනය වූයේ ය. දළදේශීය නිෂ්පාදිතයේ සමස්ත වර්ධන අනුපාතය සමාලෝචිත වසර තුළ 4.5% ක් ලෙස වාර්තා වූයේ ය. 2013 වර්ෂයේ සිට දළ දේශීය නිෂ්පාදිතය තුළ පැවති මන්දගාමීත්වය නොකඩවා විද්‍යාමානව පැවතියේ ය. පැවති අයහපත් කාලගුණ තත්වයන් කෘෂිකාර්මික ඵලදාව තුළින් දළජාතික නිෂ්පාදිතය වෙත සලසා දෙන දායකත්වය කෙරෙහි දරුණු ලෙස බලපෑම් ඇති කළේය. ඒ අනුව, කෘෂිකාර්මික අංශයේ හැකිලීමක් ඇතිවූ අතර ඊට සමගාමීව දේශීය වෙළඳාම තුළ පැවති දුබලතාව අඩු හිතකර තත්වයේ වර්ධන අනුපාතයක් ද උද්ගත කළේ ය.

### පොලිය හා ලාභාංශ (රු.බි)




2017 වසර මුළුල්ලේම සියලු කොටස් මිල දර්ශකය තුළ ස්ථිතික සීග්‍රතාවක් විද්‍යාමාන වූ අතර ප්‍රාග්ධන වෙළඳපළ කටයුතු තුළ ශුද්ධ විදේශ සහභාගිත්වයෙහි මිශ්‍ර සංවේදනීයතාවක් දිස් විය. අවදානම් නොරිස්සන ආයෝජන අවස්ථා වෙත ඇදීයන ප්‍රවනතාවක පසුබිම් සහිතව ආයෝජන විශ්වාසය පහත වැටීම කොටස් වෙළඳපළ තුළ පැවති මෙම මන්දගාමී සංචලනය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුව බව හඳුනාගත හැකිය.


### උද්ධමනය




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

එක් එක් වර්ෂයක් පාසා ජාතික පාරිභෝගික මිල දර්ශකය තුළ සිදුවන වෙනස්කම් ප්‍රකාරව චක්‍රීය සංචලන රටාවක් නිරීක්ෂණය වූයේය. ආහාර කාණ්ඩයේ වාර්ෂිකව සිදුවන උද්ධමනය ජනවාරි මස සිට මාර්තු මස අතර කාලය තුළත් ජූලි මස සිට සැප්තැම්බර් මස අතර කාලය තුළත් ඉහළ ගිය අතර ආහාර නොවන කාණ්ඩය තුළ සුළු උච්චාවචනයක් ද සහිතව පහත වැටෙන ප්‍රවනතාවයක් වසර පුරා විද්‍යාමාන විය. අහිතකර කාලගුණික තත්වයන් හේතුවෙන් සැපයුම් අංශයේ ඇති පීඩනය, ආනයනික භාණ්ඩ මත රුපියලෙහි අගය හීන වීමේ බලපෑම, බදු ව්‍යුහය තුළ සිදුවූ වෙනස්කම් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ උඩු ප්‍රවනතාවයට හේතු වූයේය.


### වාණිජ බැංකුවල ණය දීමේ හා තැන්පතු අනුපාතය




වානිජ බැංකු විසින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය බරතැබූ ණය දෙන අනුපාතයන්හීත්, සාමාන්‍ය බරතැබූ තැන්පතු අනුපාතයන්හීත් උඩු ප්‍රවනතාවක් නිරීක්ෂණය විය. ණය දෙන්නවුන් හා ණය ගන්නවුන් අතර ඉහළ යන උද්ධමනය පිළිබඳ සම්ප්‍රේක්ෂිත අනුමානයන් ද, ඉල්ලුම හා සැපයුම යන බලවේග හරහා නිගමනය වන අනුපාතික වැනි අරමුදල් අවරෝධතා එක්වූ ණය සඳහා වන ඉල්ලුම ඉහළ යාමද, එක් එක් ණය ගන්නවුන්ගේ වියදම් ඉහළනැංවෙන පැහැර හරිනු ලබන ගෙවීම් එල්ලේ ඇතිවන හා ඊට ප්‍රතිවිරුද්ධව සීමාවන වෙළඳපළ තුළ පවත්නා ණය ප්‍රමාණ පිළිබඳ අවිනිශ්චිතතාවය ද, පොලී අනුපාත නිශ්චය කිරීමෙහිලා රජයේ මැදිහත්වීම ද මෙම ඉහළ නැංවුනු සීඝ්‍රතාවට හේතු වන්නට ඇත.

2016 ඔක්තෝබර් මාසයේ සිට සුපරීක්ෂාවට ලක්වූ භාණ්ඩාගාර බිල්පත්වල අනුපාතයන්හී ඉහළයාම පහත වැටෙන කිසියම් ප්‍රවනතාවකින් පසුව 2017 මාර්තු මාසයේ දී එහි අග්‍රස්ථානය කරා ලඟා විය. කිසියම් ආර්ථිකයක් ස්ථවික වර්ධනයක් අත්දකින විට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වැනි අඩු අවදානම් ආයෝජන අවස්ථා වෙත ආයෝජකයන් ඇදී යන ප්‍රවනතාවක් උද්ගත වේ. ඒහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ඇප සුරැකුම්පත්වල මුහුණත වටිනාකම ඉහළ යන අතර ඉන් ජනනය වන ප්‍රතිලාභයෙහි අඩුවන ප්‍රවනතාවක් හටගනී. තවද, අඩු උද්ධමනකාරී සන්දර්භයක් තුළ, භාණ්ඩාගාර බිල්පත්වල මිලගණන් ආශ්‍රිත ඉහළ යාමක් උද්ගත විය හැකි අතර ඉන් අත්වන ප්‍රතිලාභයෙහි නැවත වරක් පහත වැටෙන ප්‍රවනතාවක් ඇතිවිය හැකි ය.


### භාණ්ඩාගාර බිල්පත් අනුපාතය




**භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය (%)** - වාර්ෂික සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය මත වටිනාකම පදනම් වී ඇත.

| | 2 වසර | 3 වසර | 4 වසර | 5 වසර | 6 වසර | 7 වසර | 8 වසර | 9 වසර | 10 වසර | 12 වසර | 15 වසර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2012 | 11.29 | 11.77 | 11.57 | 12.75 | 11.84 | 12.50 | 14.40 | - | 12.50 | - | - |
| 2013 | - | 10.93 | - | 11.01 | 10.97 | - | 11.57 | 11.77 | 11.78 | 12.12 | 12.14 |
| 2014 | - | - | - | 8.79 | - | - | 8.58 | - | 9.23 | | 10.18 |
| 2015 | 7.42 | 8.03 | 8.80 | 8.88 | 9.37 | 8.81 | 9.69 | - | 9.68 | 10.77 | 10.49 |
| 2016 | 11.11 | 11.61 | 11.84 | 12.05 | 12.01 | 12.18 | 12.07 | 13.11 | 12.19 | 13.72 | 12.41 |
| **2017** | **10.90** | **-** | **11.48** | **11.51** | **11.36** | **12.78** | **11.22** | **12.91** | **11.05** | **-** | **-** |


### විදේශ ව්‍යවහාර මුදල් එල්ලේ ශ්‍රී ලංකා රුපියල් සංචලනය වීම





ප්‍රස්ථාරය මගින් නිරූපණය වන අයුරු විදේශ ව්‍යවහාර මුදල් එල්ලේ ශ්‍රී ලංකා රුපියල එහි අගය හීනවන සීඝ්‍රතාවක් අත් දකින බව නිරීක්ෂණය වේ. අපනයනය පාදක කරගත් ආර්ථිකයක් වශයෙන් මෙම ප්‍රවනතාව රටේ ගෙවුම් ශේෂය හා විදේශ සංචිත කෙරෙහි සෘජු බලපෑමක් ඇතිකරනු ලැබිය හැක. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියලේ අගය හීනවන විට ජාත්‍යන්තර වෙළඳපළ තුළ දේශීය අපනයනය අඩු මිලක් ගනී. මෙමගින් රටට අත්කර ගත හැකි ප්‍රතිලාභය සත්‍ය වශයෙන්ම නිශ්චය කළ හැකි වනුයේ, අපනයන සහ ආනයනය සඳහා වන ඉල්ලුමෙහි නම්‍යතාවය ඔස්සේය. තවද, සංචාරක කර්මාන්තය වැනි ව්‍යාපාර දේශීය ව්‍යවහාර මුදලෙහි අගය අඩු වන විට ඉන් ප්‍රතිලාභ සලසා ගනී.

පසුගිය දශකය තුළ මධ්‍යම රජයේ ණය වීමෙහි තත්වය අනුව බලන කල එහිලා සැලකිය යුතු ඉහළයාමක් නිරීක්ෂණය වේ.

### මධ්‍යම රජයේ ණය සංයුතිය




### රජයේ ණය සේවා ගෙවුම්හී සංයුතිය



### රජයේ විදේශ ණයවල ව්‍යාවහාර මුදල් සංයුතිය (%)

| ව්‍යවහාර මුදල | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශේෂ ආදාන හිමිකම් | 38.3 | 36.7 | 44.6 | 28.3 | 25.8 | 24.6 | 24 | 22.7 | 20.7 | 18.7 |
| ඇමරිකානු ඩොලරය | 20.1 | 19.4 | 26 | 23.5 | 29.1 | 30.9 | 34.1 | 52.5 | 48.9 | 54.6 |
| ජපාන යෙන් | 25.5 | 30.8 | 35.6 | 25.1 | 24.1 | 20.8 | 16.4 | 14.4 | 13.3 | 12.3 |
| යුරෝ | 9.2 | 9.1 | 11.3 | 7 | 6.3 | 6.3 | 6.3 | 5.6 | 5.1 | 4.5 |
| වෙනත් | 6.9 | 4.1 | 20.9 | 16 | 14.7 | 17.4 | 19.2 | 4.8 | 12 | 9.9 |
| එකතුව | 100 | 100 | 138.5 | 100 | 100 | 100 | 100 | 100 | 100 | 100 |
| **මුළු විදේශ ණය (ශ්‍රී ලංකා රුපියල් බිලියන)** | **1,327** | **1,449** | **1,761** | **2,025** | **2,329** | **2,767** | **2,96** | **3,113** | **3,544** | **4,046** |

මූලාශ්‍රය: මුදල් අමාත්‍යයාංශය

### ව්‍යාපාර කිරීමේ පහසුව පදනම් වූ ශ්‍රේණිගත කිරීම්

| | ශ්‍රී ලංකාව | ඇෆ්ගනිස්ථානය | බංගලාදේශය | භූතානය | ඉන්දියාව | මාලදිවයින | නේපාලය | පකිස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ථ ශ්‍රේණිගත කිරීම | **110** | 183 | 176 | 73 | 130 | 135 | 107 | 144 |
| ව්‍යාපාරයක් ඇරඹීම | **74** | 42 | 122 | 94 | 155 | 65 | 109 | 141 |
| ඉදිකිරීමේ අවසර කටයුතු හා ක්‍රියා කිරීම | **88** | 186 | 138 | 97 | 185 | 62 | 123 | 150 |
| විදුලිය ලබා ගැනීම | **86** | 159 | 187 | 54 | 26 | 145 | 131 | 170 |
| දේපළ ලියාපදිංචි කිරීම | **155** | 186 | 185 | 51 | 138 | 172 | 72 | 169 |
| ණය ලබා ගැනීම | **118** | 101 | 157 | 82 | 44 | 133 | 139 | 82 |
| සුළු ආයෝජකයන් ආරක්ෂා කිරීම | **42** | 189 | 70 | 27 | 13 | 123 | 63 | 27 |
| බදු ගෙවීම | **158** | 163 | 151 | 109 | 172 | 134 | 142 | 156 |
| දේශ සීමා හරහා වෙළෙඳ කටයුතු | **90** | 175 | 173 | 56 | 143 | 147 | 69 | 172 |
| කොන්ත්‍රාත්තු බලාත්මක කිරීම | **163** | 180 | 189 | 51 | 172 | 105 | 152 | 157 |
| බුන්වත්භාවය නිරාකරණය | **75** | 159 | 151 | 23 | 136 | 135 | 89 | 85 |


*Source: CBSL & World Bank - http://www.doingbusiness.org*

"ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කිරීමේ පහසුව" සාක් කලාපයේ එහි සමපදස්ථ රටවල් සමග සංසන්දනය කර ඉහත වගුවෙන් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ වානිජ නගරය වූ කොළඹ ආශ්‍රිත කලාපය ආවරණය කෙරෙමින් රැස්කළ සංඛ්‍යාලේඛනමය දත්ත මත අදාළ ශ්‍රේණිගත කිරීම් පදනම්වී ඇත. 2017 වර්ෂය වන විට, සාක් රටවල් අතර තෙවන ස්ථානය ශ්‍රී ලංකාවට හිමිවී තිබේ. අලුතින් නිකුත් කරන කොටස් මත මුද්දර ගාස්තු ඉවත් කිරීමත්, "සම්බන්ධිත පාර්ශව ගණුදෙනු" වලට අදාළ අවශ්‍යතා සුළුතර ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා අනාවරණය කළ යුතු බවට හඳුන්වා දීමත්, පූර්ව ලියාපදිංචි කිරීමේ විධිමත් ක්‍රමවේදය සරල බවට පත් කිරීමත් ශ්‍රී ලංකාව හා සම්බන්ධයෙන් වූ ධනාත්මක කරුණු ලෙස ඉස්මතුකර දැක්විය හැකි ය.

| වර්ෂය | ව්‍යාපාර කිරීමේ ශ්‍රේණිය | වර්ෂය | ව්‍යාපාර කිරීමේ ශ්‍රේණිය | වර්ෂය | ව්‍යාපාර කිරීමේ ශ්‍රේණිය | වර්ෂය | ව්‍යාපාර කිරීමේ ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|---|
| 2010 | 105 | 2012 | 89 | 2014 | 85 | 2016 | 107 |
| 2011 | 98 | 2013 | 81 | 2015 | 99 | 2017 | 110 |


එසේ වුවද, ශ්‍රී ලංකාව ලබා සිටින තත්වය 2013 වර්ෂයේ සිට පහළ මට්ටමක් කරා ඇදී යන බව පෙන්වා දෙනු ලැබිය හැකිය. 2017 ශ්‍රේණිගතකිරීම් රටවල් 190 ක් පාදක කොට ගැනුණේ ය.

**විදේශ සෘජු ආයෝජන (ශුද්ධ ආගලන)**




*Source: Ministry of Finance, World Bank (IAB Report), www.ceicdata.com and tradingeconomics.com*

රටක විදේශ සෘජු ආයෝජන සහ ආර්ථික වර්ධන අනුපාතය අතර දැඩි සබැඳියාවක් පවතී.වඩා තිරසාර ආයෝජන අවස්ථා ආකර්ෂණය කරගනු පිණිස ආයෝජන හිතකාමී පරිසරයක් රටක් සතුව තිබිය යුතුය. 2017 වර්ෂයේදී, රට තුළ සිදුවූ විදේශ සෘජු ආයෝජන වලින් 35% ක් වූ විශාලතම ප්‍රමාණය සනිටුහන් වූයේ චීනය වෙතිනි. ලෝක බැංකුවේ අන්තර් ක්‍රියාකාරී ප්‍රචාරණ කාර්යාංශ වාර්තාවට අනුව, විදේශ ආයෝජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා අභ්‍යන්තර පරිසීමා රට තුළට විදේශ සෘජු ආයෝජන ආගලනය වීම දුර්වල කරනු ලැබ ඇත.



02

# ආයතනික භාරකාරීත්වය

# අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය (2017)

**මහින්ද මඩිහේවා මහතා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ගරු සංවර්ධන කාර්ය භාර අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**පී.බී. මැදගෙදර මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
ගරු සංවර්ධන කාර්ය භාර අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**කේ.එස්. කුරුකුලසිංහ මහතා**
අධ්‍යක්ෂ
ගරු සංවර්ධන කාර්ය භාර අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**ජූඩ් ඩිනාල් පීරිස් මහතා**
අධ්‍යක්ෂ
ගරු සංවර්ධන කාර්ය භාර අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**ඩබ්ලිව්.එම්.කේ.එල්. වීරසිංහ මහතා**
අධ්‍යක්ෂ
ලංකා හාම්පුතුන්ගේ සම්මේලනයේ නියෝජිත

**චම්පා බාලසූරිය මහත්මිය**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**ශීතා සේනාරත්න මහත්මිය**
අධ්‍යක්ෂ
ගරු කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමා විසින් පත් කරන ලද

**පී. රණවකආරච්චි මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

**එල්.එස්. දේවේන්ද්‍ර මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

**එච්.එම්.ඒ.ජේ. කුමාර මහතා**
මණ්ඩලීය ලේකම්

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී**
මහින්ද මඩිහේවා මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
පී.බී. මැදගෙදර මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී**
ආර්.එන්. ඥානසේකර මහත්මිය

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

| | |
|---|---|
| ඩබ්ලිව්.එස්. දිසානායක මහතා | (සාමාජික සේවා) |
| එල්.එච්. නිහාල් මහතා | (පරිපාලන හා මානව සම්පත්) |
| කේ.එස්. වැලිවිට මහතා | (අභ්‍යන්තර විගණන) |
| එන්.ඩබ්ලිව්. විමලවීර මහතා | (මුදල්) |
| වී.ජේ.එම්.එස්. ජයසුන්දර මහතා | (දායක මුදල් රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා) |
| උදය වික්‍රමනායක මහතා | (ආයෝජන) |

## සහකාර සාමාන්‍යාධිකාරීවරුන්

| | |
|---|---|
| සී. මල්ලිකාරච්චි මහතා | (සාමාජික ගිණුම්) |
| එච්.එම්. සෙනෙවිරත්න මහතා | (සාමාජික සේවා) |
| එම්.එස්. දිසානායක මහතා | (ස්වයං රැකියා) |
| එම්.ඒ.කේ. අලුත්ගමගේ මහතා | (මුදල්) |
| එච්.ඒ.වයි.ආර්. ප්‍රනාන්දු මෙනවිය | (දායක මුදල් රැස්කිරීම්) |
| ඩබ්ලිව්.එස්. ධර්මසිරි මහතා | (තොරතුරු තාක්ෂණය) |
| ආර්.වී.එස්. රූපසිංහ මහත්මිය | (පරිපාලන හා මානව සම්පත්) |
| ජේ.කේ.පී. රන්ජිත් මහතා | (ක්‍රියාත්මක කිරීම් - කලාප 1) |
| බී.ආර්. ආරියවංශ මහතා | (ක්‍රියාත්මක කිරීම් - කලාප 11) |
| ඩබ්ලිව්.ජිනදාස මහතා | (සංඛ්‍යා ලේඛන) |
| එස්.රාජපතිරණ මහත්මිය | (නීති) වැ බ |
| ඩබ්ලිව්.ආර්.එල්. ද සිල්වා මහතා | (ප්‍රසම්පාදන) වැ බ |

# සභාපතිවරයාගේ සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2017 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව මවිසින් ඉදිරිපත් කරනු ලබනුයේ ඉමහත් සතුටිනි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රටේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණය සපයන්නා වේ. පුද්ගලික අංශයේ මෙන්ම අර්ධ රාජ්‍ය අංශයේ සේවයෙහි නියුතු සේවක සේවිකාවන්ට සමාජ ආරක්ෂණය සපයාදීම, අනෙකුත් වෙනත් කරුණු අතර, අරමුණු කර ගනිමින් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ ස්ථාපනය කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මස 1 වන දින ආරම්භ කළේය. පසු කාලීනව, ස්වයං රැකියාවල නියුක්තවුවන් හා විගමනික ශ්‍රමික ප්‍රජාවද ඇතුළත් කර ගනිමින් අරමුදලේ ආවරණ වපසරිය තවදුරටත් පුළුල් කරනු ලැබ ඇත. අරමුදලෙහි සාමාජික සාමාජිකාවන් ස්වකීය සාමාජික ගිණුම්වල පවත්නා ශේෂය මත වාර්ෂික පොලියක් හා ලාභාංශයක් ලබා ගන්නා අතර ඊට වැඩිමනත් වශයෙන්, අධ්‍යාපනය, සෞඛ්‍ය හා නිවාස යන ක්ෂේත්‍රයන්හි දස වැදෑරුම් ප්‍රතිලාභ ප්‍රමාණයක් අරමුදල සිය සේවාලාභීන් වෙත පිරිනමයි.

වසර තුළ රටේ ආර්ථිකය මුහුණ දුන් සාර්ව ආර්ථික අභියෝග ගණනාවක් මධ්‍යයේ වුවද අරමුදල 2017 වසර තුළ මනා කාර්ය සාධනයක් පවත්වාගෙන ගියේ ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ස්වකීය ආයතනික සැලැස්මෙහි සහ වාර්ෂික අයවැය ලේඛනයෙහි නිරූපිත පරිදි වසර තුළ විවිධ උපාය මාර්ගික මූලෝපායන් ගණනාවක් වෙත අවතීර්ණ වූ අතර කාර්ය සාධනය නිසි ලෙස මනිනු පිණිසත්, ස්වකීය මෙහෙයුම් කටයුතුවල වටපිටාව සුපරීක්ෂණය පිණිසත් සුදුසු අවශ්‍ය පියවර ගන්නා ලද්දේය.

සමාලෝචනයට භාජනය වන වසර තුළ අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 278 ක් වූ ප්‍රමාණයක් කරා ළඟා වූ අතර මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 29 ක් වශයෙන් වාර්තා වුයේය. එය ඉකුත් වසර හා සසඳන කළ ලාභය සියයට 18 ක ප්‍රතිශතයකින් ඉහළ යාමකි. මෙහිලා ඇත්ත වශයෙන්ම හේතුකාරක වුයේ, ආයෝජන මත ඉපදවීම් තුළ සියයට 9.8 ක සාර්ථක ලාභ අනුපාතයක් උපදවා ගැනීමයි. විශේෂයෙන් මෙම ප්‍රශංසනීය කාර්ය ඵලය, පැවති මන්දගාමී කොටස් වෙළඳපොළ යටතේ වුවද අත්කර ගැනීමට හැකිවීමෙන්ද පෙනී යන්නේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සවිමත් අරමුදල් කළමනාකරණය සහ ආයෝජන පරිචයයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය අතිරික්ත අරමුදල් මූලික වශයෙන් රජයේ ඇප සුරකුම්පත්හී ආයෝජනය කරන අතරම කොටස් ආයෝජන හා වෙනත් ආයතනික ණය සාධනපත් ආයෝජන වෙතද විවිධාංගීකරණය කරමින් නොකඩවා සිය මෙහෙයුම් කාර්යයෙහි නියැලී සිටියේය. රටේ ප්‍රමුඛ විශ්‍රාම පාර්තෝෂික අරමුදල් වලින් එකක් ලෙස, මූල්‍ය වෙළෙඳපළ තුළ පවත්නා නිරන්තර උච්චාවචන මධ්‍යයේ වුවද ස්වකීය සාමාජික සාමාජිකාවන් වෙත වාර්ෂිකව තිර පොලී අනුපාතයක් ගෙවීමට මණ්ඩලයට හැකි වී තිබේ.

සමාලෝචිත වසර තුළ අරමුදලෙහි සාමාජිකත්වය මිලියන 12.6 ක් ලෙස වාර්තා වූ අතර ඉන් මිලියන 2.6 ක ප්‍රමාණයක් දැනට ක්‍රියාශීලී තත්වයේ පවතී. අදාළ කාල පරිච්ඡේදය තුළ සේවා නියුක්තික ප්‍රජාවේ ප්‍රමාණය 81,515 ක් ලෙස වාර්තා වුයේය. අරමුදල වෙත ප්‍රේෂණය කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 22.7 ක් වූ අතර එය ඉකුත් වසර හා සංසන්දනාත්මකව සියයට 12 ක වර්ධනයක් ගෙන හැර දක්වයි. සාමාජික ගිණුම් සක්‍රීයව පවතින්නේ ද, අක්‍රීයව පවතින්නේද යන්න නොසලකා මුළු සාමාජික අරමුදල මත සියයට 9 ක ඉපැයුම් ප්‍රතිශතයක් ප්‍රකාශයට පත් කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි විය. එකම කාල වකවානුව තුළ අනෙකුත් මූල්‍ය ආයතන වෙතින් පිරිනමනු ලබන ඉපැයුම හා සසඳන කළ මෙම ඉපැයීම ආකර්ශණීය එකක් ලෙස, එමගින් සහතික කෙරෙන උපරිම ආරක්ෂණයද සහිතව, සැලකිය හැකි වන්නේය.

ව්‍යාපාරික උපාය මාර්ගයක් ලෙස, ස්වයං රැකියාවල නියුක්ත වුවන්ගේ සහ විගමනික ශ්‍රමිකයන්ගේ සාමාජිකත්වය තවදුරටත් පුළුල් කර ගැනීම සඳහා අරමුදල මගින් පියවර ගනු ඇත. ඒ හැරුණු විට, පවත්නා ප්‍රවනතාවයන් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන සාමාජික මුදල් ආපසු ලබා ගැනීමේ ඉහළ යාම්ද සැලකිල්ලට ගෙන අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය අරමුදල් කළමනාකරණ උපාය මාර්ග විෂයෙහි සුදුසු වෙනස්කම් සිදු කරනු ලැබ ඇත.

## සමාලෝචිත වසර තුළ අරමුදලෙහි සාමාජිකත්වය මිලියන 12.6 ක් ලෙස වාර්තා වූ අතර ඉන් මිලියන 2.6 ක ප්‍රමාණයක් දැනට ක්‍රියාශීලී තත්වයේ පවතී.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ලෝක කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය සහ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය සහයෝගය ඇතිව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ පරීක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිසත්, සේවා යෝජක සහ සේවක යන දෙපාර්ශවයේම ආවරණ වපසරිය පුළුල් කිරීම පිණිසත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ පරීක්ෂණ පද්ධති යෙදවුම (EISA) යනුවෙන් හඳුන්වන නව ව්‍යාපෘතියක් දියත් කළේ ය.

වවුනියාව හා නුවරඑළිය යන නගරවල අභිනව ශාඛා කාර්යාල දෙකක් විවෘත කරමින් මණ්ඩලයේ ශාඛා කාර්යාල සේවා ජාලය තව දුරටත් පුළුල් කෙරිණි. මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද බැංකු හයකට තම ප්‍රේෂණ මුදල් ගෙවීමටත්, සිය වාර්තා මණ්ඩලය වෙත අන්තර්ජාලය හරහා මාර්ගගතව එවීමටත් සේවා යෝජකයාට පහසු විය. තවද, වර්තමානයේ පවත්නා සේවා යෝජක කේන්ද්‍රීය ක්‍රමය සාමාජික (සේවා නියුක්තික) කේන්ද්‍රීය ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම සඳහාත්, පොදු සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම තුළ සිටින සියලුම සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් අද්විතීය ක්‍රමවේදයක් වෙන්කර දීම සඳහාත් ජාතික හැඳුනුම්පත් අංකය පොදුවේ වලංගුභාවයට පත් කිරීම අරබයා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමක්ද අත්සන් කෙරිණි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, අභිනවයෙන් සිදු කරන ලද වෙනස්කම් තම පරිපාලන හා අරමුදල් කළමනාකරණ පද්ධතිය වෙත හඳුන්වාදීම සහ සිය සේවා වඩාත් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස සැපයීම යන කරුණු පෙරදැරිව ස්වකීය මෙහෙයුම් කටයුතු සියල්ලක්ම පාහේ තොරතුරු තාක්ෂණය හරහා ක්‍රියාත්මක වන පරිපූර්ණ ක්‍රමවේද පරිසරයක් වෙත රැගෙන යාමට ක්‍රියාකර තිබේ. දැනටමත් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහය සහිතව මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන මුලපිරීම් සිදු කරනු ලැබ ඇත.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම පිළබඳවද, සමස්ත පරිපාලන පද්ධතිය වෙත කෙරෙන අනෙකුත් වෙනස්කම් සමග උරෙනුර ගැටී ක්‍රියා කිරීමේ කාර්ය මණ්ඩලය සතු හැකියාව වැඩි දියුණු කිරීම පිළිබඳව ද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය අවධානය යොමු කරයි. මෙම කාරණයෙහිලා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ වෙනත් ප්‍රදායක නියෝජිතායතනවල සහයෝගය ද ලබා ගනිමින් දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ඊට අවශ්‍ය දැනුමෙන් සන්නද්ධ කරනු පිණිස ඔවුන් වෙත පුහුණු පහසුකම් සලසා දෙනු ලබනවා ඇත.

සමස්තයක් වශයෙන් සලකන කළ 2017 වර්ෂය තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අත්කර ගත් සියලුම ජයග්‍රහණ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අරමුදල් කාර්ය මණ්ඩලයේ සේවයට කැපවීම හා සේවය කෙරෙහි ඔවුන්ගේ බැඳී සිටීම කරණ කොට ගෙන දිනාගත් ඒවාය. එහිලා ඔවුන්ගේ අමිල දායකත්වය කෙරෙහි අතිශය  කෘතවේදී වීමටත්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රටේ ප්‍රමුඛ සමාජ ආරක්ෂණය සපයන්නෙකු බවට පත් කිරීම උදෙසා ඔවුන්ගේ සක්‍රීය සහභාගිත්වය තව දුරටත් ඉදිරියේදී අපේක්ෂා කිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන් අපගේ සියලුම කාර්යයන්හිදී අප වෙත සලසන ලද නායකත්වය හා මාර්ගෝපදේශය වෙනුවෙන් සංවර්ධන කාර්යභාර හා විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමාටත්, අප වෙත දක්වන ලද අප්‍රතිහත අනුබලය හා සහයෝගීතාව වෙනුවෙන් අමාත්‍යාංශයීය ලේකම් දර්ශනා සේනානයක මහත්මියට හා ඇගේ කාර්ය මණ්ඩලයටත් මගේ හෘදයාංගම තුති ප්‍රණාමය මෙයින් පුද කරමි.



**මහින්ද මඩිහහේවා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 37 වන වාර්ෂික වාර්තාව, 2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වර්ෂය සඳහා වූ විගණනිත මූල්‍ය ප්‍රකාශ, එකී වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය ද, එම මූල්‍ය ප්‍රකාශය පිළිබඳව විගණකවරුන්ගේ වාර්ෂික වාර්තාව ද සමග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබනුයේ ඉමහත් සතුටිනි. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ මාලාවේ වාර්තා කිරීමේ නියමයනට අනුකූලව කටයුතු කරනුපිණිස මෙලෙස මෙම වාර්තාව පිළිගන්වනු ලැබේ.

## මූල්‍ය වාර්තාකරණය සඳහා වූ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ආයතනයේ මූල්‍ය තත්වය හා එහි කාර්ය සාධනය සත්‍ය සහ සාධාරණ අයුරින් පිළිබිඹු වන ලෙස පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂවරු දරති. 1995 අංක 16 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත මගින් විධිවිධාන පනවා ඇති පරිදි මණ්ඩලයේ ආදායම් ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, කොටස් හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ පිටු අංක 51 සිට පිටු අංක 85 දක්වා ගෙනහැර දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අදාළ නියමයන් හා අනුකූල වන අයුරින් පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂ වරුන්ගේ අදහසයි.

ඉහත දක්වා ඇති නියමයන් කෙරෙහි අනුකූලතාව දැක්වීමෙහිලා, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වාසනීයත්වය විෂයෙහි යුක්තිසහගත සහතිකයක් ඇතිවන අයුරින් පිරිසැලසුම් කර ඇති බවත්, පරිබාහිර කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ව්‍යවස්ථාමය මාර්ගෝපදේශවලට අනුකූල වන අයුරින් සිදුකර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලබයි.

## ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

දායක මුදල් රැස්කිරීමේ කටයුතු, සේවායෝජක සබඳතා කටයුතු, සාමාජික සේවා කටයුතු සහ ආයෝජන කටයුතු මණ්ඩලයට අයත් ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස සැලකේ. 2017 වසර තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය පහත දක්වා ඇත:

## දායක මුදල් රැස්කිරීම සහ සේවා යෝජක සබඳතා

2017 වසර තුළ නව සේවායෝජකයන් 7, 639 දෙනෙකු ස්වකීය දායක මුදල් අරමුදල වෙත ගෙවීම ආරම්භ කරන ලද්දේ ය. ඒ හා සමානවම, 2017 වසර තුළ, සේවායෝජකයන් වෙතින් ඔවුන්ගේ සේවක සේවිකාවන්ට අදාළව ඔවුන් වෙතින් ලද මුළු දායක මුදල් ප්‍රමාණය, 2016 වසරේදී එලෙස ලද රු. බිලියන 20.3 ක් වූ මුදලට සාපේක්ෂව රු. බිලියන 22.7 ක් වූයේ ය. තවද, සාමාජික අරමුදලේ වටිනාකම වශයෙන් ඉකුත් වසරේදී පැවති රු. බිලියන 245.6 ක් වූ මුදල සමාලෝචිත වසර අවසානය වන විට රු. බිලියන 274 දක්වා ඉහළ නැංවී තිබුණි.

ඉකුත් වසර හා සසඳන කළ, ප්‍රාදේශීය කාර්යාල 19ක් හරහා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් සිදු කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් සේවා යෝජකයන්ගේ සංඛ්‍යාව 81,515 ක් දක්වා වර්ධනය වී තිබුණි. ඊට අදාළව මෙහෙයුම් කාර්යයන් හා අධීක්ෂණ කටයුතු මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ජාලය ඔස්සේ සාර්ථක අයුරින් ඉටු කෙරිණි. ඒ අනුව, 2017 වසර තුළ රැස්කරගත් දායක මුදල් ප්‍රමාණය 2016 වසර ඉක්මවා යමින් රු. මිලියන 2,446ක් වශයෙන් ඉහළ ගොස් තිබිණි.

අන්තර්ජාලය හරහා මාර්ගගත බැංකු සේවා ඔස්සේ දායක මුදල් ගෙවීමේ හා සාමාජික විස්තර ප්‍රේෂණය කිරීමේ කටයුතු වාණිජ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව යන බැංකු හරහා සාර්ථක ලෙස ක්‍රියාවට නංවන ලද අතර එමගින් රැස්කරන ලද මුදල් ප්‍රමාණය



මුළු දායක මුදල් ප්‍රමාණයෙන් 50%ක් වූ ප්‍රතිශතයක් වෙත ළඟා වූයේ ය. එමෙන්ම, අනුකූලතාව දැක්වීමේ අනුපාතය 2017 වසර තුළදී 75% ක් වූ ප්‍රමාණය දක්වා රැගෙන යාමට ආයතනය සමත් විය. ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ අඛණ්ඩ පදනමක් මත මෙහෙයවන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙම හිතකර තත්වය පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් දායක වූයේ ය. දායක මුදල් රැස්කිරීමේ ආවරණ වපසරිය පුළුල් කිරීම සඳහා වූ ක්ෂේත්‍ර පරීක්ෂණ වේගවත් කිරීමේ කටයුතු පිළිබඳ අවධාරණය කිරීමෙහිලා සමාලෝචිත වසර තුළ 'EISA' (සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ පරීක්ෂණ පද්ධති පාලනය) ව්‍යාපෘතිය දියත් කර හරිනු ලැබ සාර්ථක අයුරින් ක්‍රියාවට නංවන ලද්දේ ය.

## සාමාජික සේවා

### සාමාජික ප්‍රතිලාභ හා සුභසාධන ප්‍රතිලාභ

වසර තුළ, අරමුදලේ හිමිකම් ඉල්ලා සිටීමේ අයදුම්පත් 179,176 ක් සම්බන්ධ සැකසුම් කටයුතු වලින් පසුව රු. බිලියන 16.8 ක මුළු මුදලක් ගෙවනු ලැබ ඇත. ඊට සංසන්දනාත්මකව 2016 වසර තුළ එබඳු අයදුම්පත් 171,801 ක් සම්බන්ධ සැකසුම් සිදුකොට රු. බිලියන 12.5 ක මුදලක් ගෙවා තිබේ. වසර තුළ එක් හිමිකම් ඉල්ලුම් පතක් වෙනුවෙන් ගෙවන ලද සාමාන්‍ය මුදල ඊට සාපේක්ෂව ඉකුත් වසර තුළ ගෙවන ලද රු. 78,451 ක් වූ මුදල එල්ලේ රු. 93,983 දක්වා ඉහළ ගියේ ය. 2017 වසර තුළ ප්‍රතිලාභ හිමිකම් අයදුම්පත් 3,302 ක්සැකසීමෙන් අනතුරුව රු. මිලියන 280 ක් ගෙවා ඇත. ඊට සංසන්දනාත්මකව 2016 වසරේදී හිමිකම් ඉල්ලුම්පත් 3,654 ක් වෙනුවෙන් රු. මිලියන 299 ක් ගෙවනු ලැබ තිබේ. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් රු. මිලියන 82 ක් ගෙවන ලද අතර අ.පො.ස උ/පෙළවිභාගය සමත් සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට සහාය දීමක් වශයෙන් රු. මිලියන 36 ක් ගෙවා ඇත.

### සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

වසර අවසානය වන විට අරමුදල සතුව පැවති සක්‍රිය හා අක්‍රිය ගිණුම්වල මුළු සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 12.6 ක් වූයේ ය. මෙකී සියලු සක්‍රිය හා අක්‍රිය සාමාජිකයන් වෙනුවෙන් අරමුදල සාමාජික ගිණුම් පවත්වාගෙන යයි. ඒවායින් 96% ක් වූ සාමාජික ගිණුම් ප්‍රමාණයක් 2017 වසර අවසානය වන විට යාවත්කාලීනකර තිබුණි. මෙම ගිණුම්වලින් මිලියන 10 ක් අක්‍රීය ගිණුම් වන අතර මිලියන 2.6 ක් වූ සාමාජික ගිණුම් ප්‍රමාණයක් සක්‍රිය ඒවා වේ. එබඳු සක්‍රිය ගිණුම් සඳහා සමාලෝචිත වසර තුළ ඒ ඒ සේවා යෝජකයන් වෙත අදාළ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබ තිබේ.

### ආයෝජන

ආයෝජන කර්තව්‍යයෙහිලා යොදවන ලද මුදල රු. බිලියන 235 සිට 2017 වසර තුළ රු. බිලියන 262 දක්වා වර්ධනය වූ අතර ඉකුත් වර්ෂය එල්ලේ එය 11.5% ක වැඩිවීමක් වූයේ ය. 2017 වසර තුළ මණ්ඩලය විසින් ආයෝජන ප්‍රතිපත්තියෙහි මාර්පගෝපදේශ ඉතා දැඩි ලෙස අනුගමනය කරන ලද අතර ආයෝජිත ප්‍රාග්ධනය ආරක්ෂා කරගන්නා අතරම සාධාරණ ප්‍රතිලාභයක් එමගින් උපයා ගැනීමට මණ්ඩලය සමත් විය. රු. බිලියන 205 ක් වශයෙන් ගණනය වන ආයෝජන කර්තව්‍යයට අයත් ප්‍රධාන කොටසක් (78% ක්) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලද අතර රු. බිලියන 2.0 ක් (0.7% ක්) රජයේ සුරක්ෂිත ස්ථාවර ආදායම් සාධනපත්‍රවල ද, රු.බිලියන 10.8 ක් (4.1% ක්) කොටස් හිමිකම්වල ද, රු. බිලියන 44.2 ක් (16.8%ක්) වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ද ආයෝජනය කෙරිණි. මණ්ඩලය විසින් 2017 වසර තුළ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ කොටස් හිමිකම් කර්තව්‍යයේ ඉපැයුම් ලෙස රු. මිලියන 908ක් උපයාගෙන තිබුණි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුළු ආයෝජන ආදායම ලෙස රු. බිලියන 28 ක මුදලක් උපයාගෙන තිබූ අතර එය රු. බිලියන 24 ක් වූ 2016 වසරේදී ලද ආයෝජන ආදායම එල්ලේ රු. බිලියන 4 ක් හෙවත් 17% ක ඉහළ යාමක් වූයේ ය.


අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිවරයා විසින් අත්සන් කරන ලදි.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

# පාලන වාර්තාව

පාලන කාර්යභාරය ඉහළ ප්‍රමුඛතා කාර්යභාරයක් සේ සලකන අර්ධ රාජ්‍ය ආයතනයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය එක් එක් සාමාජිකයා වෙත ලබාදෙන ප්‍රතිලාභය ඉහළ නැංවීමේ අභිප්‍රායෙන් යුතුව තම සේවාවන් තුළට අගය ආරෝපණය කිරීමේ ක්‍රියාදාමය ඉහළ තලයකට ඔසවා තැබීම උදෙසා වගකීමක් සහිතව කැපවීමෙන් කටයුතු කරයි. ස්වකීය සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු හරහා ව්‍යාප්ත වන පරිදි අදාළ ව්‍යවස්ථාමය හා නියාමනමය විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට මණ්ඩලය බැඳී සිටියි. ස්වකීය පාලන කාර්යභාරයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම උදෙසා මණ්ඩලය මෙහෙයවනු ලබන ප්‍රධාන මාර්ගෝපදේශ වනුයේ විනිවිදභාවය, විශ්වාසදායක භාවය හා අනුකූලතාව දැක්වීම යන ප්‍රතිපත්තියයි. ආයතනික පාලනයේ ඉහළම මට්ටමේ සම්මත ප්‍රමිති පවත්වාගෙන යමින් ඒ අනුව කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම හා වගකීම බව මෙම වාර්තාව තුළින් අවධාරණය කෙරේ.

## ආයතනික පාලනයේ කාර්ය රාමුව




# ආයතනික පාලනය
# පිළිබඳ විස්තරය

| පාලන කාර්ය භාරයේ ප්‍රතිපත්ති | | 2017 වසරට අදාළව අදහස් දැක්වීම |
|---|---|---|
| **1. අධ්‍යක්ෂ මණ්ඩලය** | | |
| 1.1. | **මණ්ඩලය** | රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වයෙහිලා ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය. |
| 1.1.1. | අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් | අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් නවදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වන්නේ ය.<br>• අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු<br>• මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු<br>• වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු<br>• ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු<br>• සාමාජිකයන් 100,000 කට වඩා වැඩි පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිතිවල කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු |

1.1.2. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වන අතර අවශ්‍යතාවය අනුව අමතර රැස්වීම් පවත්වනු ලබයි. ඒ අනුව, මෙම වසර තුළ රැස්වීම් වාර්තා දහතුනක් (13 ක්) පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඉහළ කාර්යක්ෂමතාවකින් පවත්වාගෙන යනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කල්වේලා ඇතිව දින තුනකට නොඅඩු කාලයකට පෙර සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙත යැවීමට කටයුතු කරනු ලබේ. 2017 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සහභාගිත්වය පිළිබඳ සටහනක් පහත දක්වා ඇත.

**2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය**




1.1.3. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරුවකු ලෙස තමන් වෙත බලය පවරනු ලැබ ඇති අයිතිවාසිකම් හා වගකීම් අවංකව හා සද්භාවයෙන් යුතුව ඉටුකළ යුතු වන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය සිය භාරදූර වගකීම් පිළිබඳව සෑම විටම සවිඥානිකව කටයුතු කළ යුතු වන්නේ ඔවුන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන තීරණ හා ඉටුකරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේදී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයිනි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු පහත දක්වා ඇත :-

- ප්‍රතිපත්ති සකස් කිරීම
- අරමුදලේ කාර්යකරණය අධීක්ෂණය කිරීම හා ඇගයීම
- පරිපාලිත සමාගම්වල, ආශ්‍රය සමාගම්වල හා වෙනත් ආයෝජනවල කාර්යසාධනය අධීක්ෂණය කිරීම හා ඇගයීම
- වාර්ෂික කාර්ය සාධන සමාලෝචනය
- කාරක ප්‍රාග්ධනය
- කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා
- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා

| පාලන කාර්ය භාරයේ ප්‍රතිපත්ති | | 2017 වසරට අදාළව අදහස් දැක්වීම |
|---|---|---|
| 1.1.4. | මණ්ඩලීය ලේකම් | නියමිත කාර්ය පරිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් ආයතනික ලේකම්වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ඉඩ ප්‍රස්ථාව ඇත. |
| 1.1.5. | මණ්ඩලීය ලේකම්ගේ කාර්යභාරය | මණ්ඩලීය ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ :-<br>• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම්දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයාදීමෙන් ඔවුන්ට සහය සැලසීම |
| 1.1.6. | අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව | අධ්‍යක්ෂවරු විවිධ ක්ෂේත්‍රවල (මූල්‍ය, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය, වෘත්තීය සමිති යනාදිය) නිරතව සිට පැමිණෙන්නන් වෙති. ඔවුහු අධ්‍යක්ෂ මණ්ඩලයට සමතුලිත වේදිකාවක් සපයනු ලබන්නාහ. ඔවුහු එක් එක් කරුණ සම්බන්ධයෙන් ස්වාධීන මතයක් පළ කරනු ලබන්නාහ. |
| 1.1.7. | ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව | සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැයවන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වන්නේ ය. |
| **1.2.** | **සභාපති / ප්‍රධාන විධායක නිලධාරී** | |
| 1.2.1. | සභාපතිවරයා පත්කිරීම | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ද වන අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන්නේ ය. |
| 1.2.2. | සභාපතිවරයාගේ වගකීම් | සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුත් වන්නේ ය. |
| **2.** | **ගණන් දීම හා විගණනය** | |
| 2.1. | මූල්‍ය වාර්තාකරණය | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ද, එමෙන්ම, ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත ප්‍රකාරව පිළියෙළ කර ඉදිරිපත් කරනු ලැබ ඇත. |
| 2.1.1. | ව්‍යවස්ථාමය හා නියාමනය වාර්තාකරණය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වන වගන්තියට අනුකූලව සියලුම රාජ්‍ය සංස්ථාවලට අයත් ගිණුම් විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කළයුතු වන්නේ ය. විගණකාධිපතිවරයාට ඔහුගේ මෙහෙයවීමට හා පාලනයට යටත්ව කටයුතු කරන යම් සුදුසුකම් ලත් විගණක වරයෙකුගේ සේවය ලබාගැනීම සඳහා කටයුතු කළ හැකි වන්නේ ය. |
| 2.1.2. | මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් විගණක වරයාගේ වගකීම | විගණකාධිපති වාර්තාව පරිශීලනය කරන්න. |
| 2.1.3. | වාර්ෂික වාර්තාවෙහි අන්තර්ගත අධ්‍යක්ෂ වරුන්ගේ වාර්තාව | අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනයට යොමු වන්න |
| 2.1.4. | මූල්‍ය ප්‍රකාශ හා සම්බන්ධ අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනයට යොමු වන්න |
| 2.1.5. | කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය | කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණයට යොමු වන්න. |
| 2.2. | අභ්‍යන්තර පාලනය | |
| 2.2.1. | අභ්‍යන්තර විගණන කෘත්‍යය | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට තමන් සතු අභ්‍යන්තර විගණන අංශයක් ඇත. |
| 2.2.2. | අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාව පිළිබඳ විගණන කමිටු සමාලෝචනය | අභ්‍යන්තර විගණන අංශය අරමුදල් මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව පිළිබඳව විගණන කමිටුව වෙත නිරන්තරව වාර්තා කරයි. එහිලා මූල්‍ය වාර්තාකරණය පිළබඳ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ සමාලෝචනයක්ද ඇතුළත් වේ. |

# අනු කමිටු

ආයතනික පාලනයේ පූර්ව අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම පිණිස ඇතැම් නියමයන් හා අනුගතව ක්‍රියාකිරීමට මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කලමනාකරණය බැඳී සිටී. එහිලා අනු කමිටු ස්ථාපනය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් වන්නේය. ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවල ඵලදායි ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීම සඳහා මෙම කමිටු මණ්ඩලයට සහය වන අතර ආයතනය පුරා දිවෙන සියලු ක්‍රියාදාමයන් පිළිබඳව සවිමත් තීරණවලට එළඹීමටද එම කමිටු වග බලා ගනිති. මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගැටලු නිරාකරණය කිරීම පිණිස අදාළ ප්‍රවීණත්වයකින් හෙබි වෘත්තිකයන් ගෙන් මෙම කමිටු සමන්විත විය යුතු වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති ඇතැම් ප්‍රධාන කමිටු සමහරක් පහත දක්වා ඇත.
පහත සඳහන් කරුණු මෙම කමිටුවේ විෂය පථය යටතට ඇතුළත් වේ.

## I. විගණන කමිටුව

මෙම කමිටුව යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් වත් සමන්විත විය යුතු වන අතර භාණ්ඩාගාර නියෝජිතවරයා හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් නිපුණතාවක් ඇති තැනැත්තෙකු විසින් එහි සභාපතිත්වය දරනු ලැබිය යුතුය. මෙම කමිටුව අඛණ්ඩ පදනමක් මත අන්තර් ක්‍රියාකාරීව කටයුතු කරමින් යටත් පිරිසෙයින් තුන් මසකට එක් වතාවක්වත් රැස්විය යුතු අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා රැස්වීම් කැඳවුම්කරු ලෙස ක්‍රියා කළ යුතුය. මෙම කමිටුව විසින් එලඹෙන නිගමන ඊට අදාළ නිර්දේශ ද සමඟ සුදුසු ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතු වන්නේය.

**විගණන කමිටුවේ සංයුතිය**

- **චම්පා බාලසූරිය මහත්මිය**
  විගණන කමිටුවේ සභාපති/ අධ්‍යක්ෂ
  ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත
- **ශීතා සේනාරත්න මෙනවිය**
  අතිරේක ලේකම්/අධ්‍යක්ෂ
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- **පී. රණවකආරච්චි මහතා**
  අධ්‍යක්ෂ
  වෘත්තීය සමිති නියෝජිත
- අතිරේක සාමාන්‍යාධිකාරී
- සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු සහ සහකාර සාමාන්‍යාධිකාරීවරු

## II. කළමනාකරණ කමිටුව

අරමුදලේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරන්නාහ. මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දීමේ කාර්යයෙහි සභාපතිවරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම නියැලෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහිද නිරතව සිටිති.

එබැවින්, මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි මුඛ්‍යාංගයක් ලෙස කළමනාකරණ කමිටුව ක්‍රියා කරයි. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ:-

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වලදී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- ඉලක්ක දිශාභිමුඛ කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහිතව විධිමත් පිළිවෙත්වලින් බැහැරව කටයුතු කිරීමේ යුක්ති සහගත භාවය හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා අතිශය තීක්ෂණ අයුරින් ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදිය ආශ්‍රිත ගෙවීම් නියමිත පරිදි සිදුවන බවට වගබලා ගැනීම.
- මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණ ක්‍රමවේද සලසා ගැනීම.
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය/ අතෘප්තිමත්භාවය පිළිබඳ පසුවිපරම් කටයුතු

කරමින් ඒවා වැඩි දියුණු කිරීම/ නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

- ප්‍රතිශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.

## III. ආයෝජන කමිටුව

ආයෝජන අනුසාරයෙන් අරමුදලට අයත් මුදල් යෙදවීම පිළිබඳව මණ්ඩලයේ මූලික පරමාර්ථය වනුයේ, එම මුදල් බලය ලත් ආයෝජනවල ප්‍රශස්ත ලෙස යොදා ගැනීම මගින් තම මූල්‍ය බැඳීම් ප්‍රතිපූර්ණය සඳහා ද්‍රවශීලතාව කළමනාකරණය කරන අතරතුර උපරිම ආයෝජන ප්‍රතිලාභ සලසා දීමට කටයුතු කිරීමයි. ඒ අනුව, ආයෝජන කමිටුව පහත සඳහන් අරමුණු ත්‍රිත්වය සාක්ෂාත් කර ගැනීමට ප්‍රයත්න දරයි.

- **සුරක්ෂිතභාවය**

විශ්වාසදායි ආයෝජන ඉඩ ප්‍රස්ථා සලසා ගැනීම මණ්ඩලයේ මුඛ්‍ය පරමාර්ථයක් වන්නේය. මෙම අවශ්‍යතාව අරබයා කටයුතු කිරීම පිණිස මණ්ඩලය ස්වකීය ආයෝජන සමුච්චයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අතිශය සුරක්ෂිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කරයි.

- **ද්‍රවශීලතාව**

යුක්ති සහගත ලෙස ඉදිරියේදී අපේක්ෂා කල හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීම මණ්ඩලයට පහසු කරනු පිණිස මණ්ඩලයේ ආයෝජන කාර්යභාරය මුදල් කළ හැකි ද්‍රවශීලතා මට්ටමකින් පැවතිය යුතු වන්නේය.

- **ආයෝජන මත ප්‍රතිලාභ**

බලයලත් ආයෝජන විධික්‍රම උපයෝගී කර ගනිමින් ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන කාර්යභාරය සැලසුම් කළ යුතු වන්නේය.

**ආයෝජන කමිටුව සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර සෑම වැඩකරන දිනයකදීම දිනපතාම පාහේ ඔවුහු රැස්වෙති. පවත්නා වෙළෙඳපළ තත්වයන් මත පදනම්ව අරමුදල සඳහා සුදුසු ආයෝජන ඉඩ ප්‍රස්ථා සම්බන්ධයෙන් ඔවුහු තීරණවලට එළඹෙති.**

### අනුකමිටුවල විධායක සම්පිණ්ඩනය

| මණ්ඩලීය අනු කමිට | ආවරණ වපසරිය | සංයුතිය |
|---|---|---|
| I. විගණන කමිටුව | • අභ්‍යන්තර පාලන විධි සමාලෝචනය<br>• අභ්‍යන්තර විගණනයේ සමාලෝචනය<br>• බාහිර විගණනයේ සමාලෝචනය<br>• මූල්‍ය ප්‍රකාශවල සමාලෝචනය | • අධ්‍යක්ෂවරුන් තිදෙනෙකි<br>• සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් හා සියලුම සහකාර සාමාන්‍යාධිකාරී වරුන් |
| II. කළමනාකරණ කමිටුව | • මෙහෙයුම් කටයුතු සමාලෝචනය<br>• සුදුසු උත්ශ්‍රේණි කටයුතු සමාලෝචනය<br>• කාර්ය සාධන සමාලෝචනය | • සභාපති<br>• ක්‍රියාකාරී අධ්‍යක්ෂ<br>• ජ්‍යෙෂ්ඨ කළමනාකරණය |
| III. ආයෝජන කමිටුව | • මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්තිය<br>• ආයෝජන කාර්ය භාරය හා ඒවායේ ප්‍රගතිය<br>• ප්‍රවර්තන පරිසර සාධක සමාලෝචනය | **ආයෝජන කමිටුව**<br>• භාණ්ඩාගාර නියෝජිත<br>• ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ නියෝජිත<br>• සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශ නියෝජිත<br>• අතිරේක සාමාන්‍යාධිකාරී<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන)<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) - නිරීක්ෂණ සාමාජික<br><br>**කොටස් හිමිකම් කමිටුව**<br>• සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)<br>• මුදල් අංශයෙන් එක් කළමනාකරුවකු<br>• ආයෝජන විශ්ලේෂකයන් තිදෙනකු |

# අවදානම් කළමනාකරණ වාර්තාව




## අවදානම් කළමනාකරණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ප්‍රමුඛ විශ්‍රාම පාරිතෝෂික ගෙවීමේ අරමුදලක් සේ සැලකේ. මාසික පදනමක් මත අරමුදල වෙත ගලා එන පුද්ගලික අංශය සහ අර්ධ රාජ්‍ය අංශය යන දෙඅංශයේ සේවයේ නියුතු විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවක සේවිකාවන් වෙතින් දිගු කාලයක් තිස්සේ ලබා ගන්නා දායක මුදල් උපයෝගි කර ගනිමින් ඔවුන් වෙත මූල්‍ය රැකවරණයක් සලසා දීම පිණිස සද්භාවයෙන් යුතුව ක්‍රියා කිරීම උදෙසා මණ්ඩලය කැපවී සිටියි. තවද, සියලුම සේවක සේවිකාවන්ට ඔවුන්ගේ සේවයෙන් විශ්‍රාම ගැනීම මත එකී අදාළ තැනැත්තන්ට අයත් නිශ්චිත ප්‍රතිලාභ ඔවුන් වෙතම ලැබෙන බවට මණ්ඩලය විසින් වගබලා ගත යුතු වන අතර අරමුදලට අයත් විවිධ වර්ගයේ ආයෝජන සමුච්චයක් තුළ යොදවා එසේ ආයෝජනය කළ ප්‍රාග්ධනයේ සුරක්ෂිත භාවය ද තහවුරු කර දිය යුතු වන්නේ ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට අයත් ආයෝජන කාර්ය භාරයේ සැලකිය යුතු ප්‍රමාණයක් රජයේ ඇප සුරැකුම්පත් වලින් සමන්විත වේ. තවද, 2017 දෙසැම්බර් මස 31 වන දිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොළඹ කොටස් වෙළඳපළ තුළ පැවති මුළු වෙළඳපළ ප්‍රාග්ධනීකරණයෙන් සියයට 0.4 % ක ප්‍රතිශතයක් හිමිව සිටියේය. ඒ අනුව, අවදානම් කළමනාකරණය, ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලට අයත් සෑම අදියරකදීම කිසියම් බලපෑමක් ඇති කළ හැකි ප්‍රධාන ප්‍රමුඛතා කරුණක් සේ සැලකේ.

**සමකාලීන ව්‍යාපාරික සංදර්භය, ණය අවදානම, වෙළෙඳපළඅවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් කටයුතු අවදානම යන අවදානම්වලට මණ්ඩලය නිරාවරණ කරනු ලැබ තිබේ.**

## ණය අවදානම

කිසියම් අවස්ථාවක ණයගැතියා ණයහිමියා හට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හරින විට ණය අවදානම උද්ගත වෙයි. මෙමගින් එක් ණයගැතියෙකු වෙනුවෙන් දැරිය යුතු පිරිවැය ඉහළ නැංවෙන අතර ණයහිමියෙකුගේ දෘෂ්ඨි කෝණයෙන් බලන විට ණය ඒකරාශි වීමක් ලෙසද සැලකිය හැකිය.
ණය අවදානම්, නිසැකවම වටිනා මූල්‍ය ඉඩ ප්‍රස්ථාවල ප්‍රතිඵලයක් ලෙස යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ණයහිමියෙකු විසින් අත්කරනු ලැබිය හැකිව තිබූ කිසියම් ආර්ථික හෝ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි පරිසීමා ඇති කරයි. 2017 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලය සතු අරමුදල් වලින් සියයට 77.79 ක ප්‍රතිශතයක් අවදානම් රහිත රජයේ ඇප සුරැකුම්පත්හී ආයෝජනය කරනු ලැබ තිබේ. එහෙයින් ණය අවදානම අඩු මට්ටමක පවත්වා ගැනීමට මණ්ඩලයට හැකි විය. සෘණ පත්‍රවල යොදවන ලද ආයෝජනය මුළු ආයෝජන සමුච්චයෙන් සියයට 0.81 ක ප්‍රතිශතයක් ලෙස ගණනය විය. පූර්ණ විශ්ලේෂණයක් මගින් අධ්‍යයනයට හසුකළ ශ්‍රේණිගත ආයතනික ණය සාධන පත්‍ර ආයෝජනවල පමණක් මණ්ඩලය මුදල් යොදවයි. තවද නියමිත ප්‍රති ගැනුම් ගිවිසුම් සහ බලාපොරොත්තු රහිතව එක් රැයකින් සිදුවන ප්‍රති ගැනුම් ගිවිසුම් රජයේ සුරැකුම්පත් හරහා ප්‍රමාණවත් අයුරින් සුරක්ෂිත කරනු ලැබ තිබේ.මෙම අවදානම් වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ගය ණය අවදානම් අවම මට්ටමක රඳවා තබාගැනීම සඳහා මණ්ඩලයට උපකාරී වී තිබේ.

## වෙළඳපළ අවදානම


වෙළඳපළ අවදානම්වලට යම් ආයතනයක් නිරාවරණය වී සිටීමේ අනතුරුදායක බව මූල්‍ය වෙළඳපළ තුළ පවතින උච්චාවචන තත්වයන් මගින් ඉහළ නංවයි. පොලී අනුපාතය තුළ ඇතිවන උච්චාවචන සහ කොටස් හිමිකම් අවදානම් වෙළඳපළ අවදානමෙහි පවත්නා මූලික අංග ලෙස හඳුනා ගනු ලැබ ඇත.වෙළඳපළ අවදානම ආයෝජන මත ලබන ප්‍රතිලාභය පිරිහී යාමට සලස්වයි. භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී අනුපාත තුළ උඩු සීඝ්‍රතාවක් නිරූපණය වන විට වටිනාකමෙහි අඩුවීමක් සිදුවීමට පුළුවන. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන් පොලී අනුපාත තුළ ක්‍රමික අඩුවීමක් (මිල අවදානම) නිරූපණය වන විට අඩු පොලී අනුපාතය මත අරමුදල් ප්‍රතිආයෝජනය කිරීමට සිදුවේ. එමගින් ආදායම් උත්පාදනයේ ධාරිතාව හීන විය හැකිය. වෙනස් කාල සීමා හා ප්‍රතිලාභ යටතේ භාණ්ඩාගාර බැඳුම්කර අත්කර ගැනීමේ උපාය මාර්ගයක් සහිතව කටයුතු කිරීම මගින් වෙළඳපළ අවදානමට නිරාවරණය වීම යම්තාක් දුරකට සාමාන්‍ය කරගනු ලැබිය හැකිය. ප්‍රාග්ධන වෙළඳපළවල් තුළ සිදුවන යම් අහිතකර උච්චාවචන, ප්‍රධාන වශයෙන් කොටස් වැනි ප්‍රාග්ධන වෙළඳපළ සාධනපත්‍රවල අගය හීනකරවීමට හේතුකාරක විය හැකිය.ප්‍රමුඛ කාර්යකරණයක් සහිත වෙළඳපළ අංශ කීපයක් තුළ රැඳී පැවතීම පුළුල් කිරීම මගින් විවිධ ආයෝජන කාර්යභාර වෙත ප්‍රවේශය සලසා ගැනීම සහ මිල බණ්ඩ අනුගමනය කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින්ද උද්ගත විය හැකි මූල්‍ය අලාභ වලක්වා ගනු පිණිස ක්‍රියාවට නංවනු ලැබිය හැක. ප්‍රතිරෝධී ආයෝජනවල මුදල් යෙදවීමට පෙර ඒ පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් සිදුකළ යුතු වන්නේ ය. කෙසේ වුවද, මණ්ඩලයේ මුළු ආයෝජන විස්තර සටහන තුළ කොටස් මත සිදුකරන ලද ආයෝජන සියයට 4.41 ක ප්‍රතිශතයක් ලෙස ගණනය වූ බැවින් මණ්ඩලයේ කොටස් හිමිකම් සමුච්චය කෙරෙහි ඇතිකළ සමස්ත බලපෑම සාපේක්ෂ වශයෙන් අඩු අගයක් ගන්නේ ය.

## ද්‍රවශීලතා අවදානම

කෙටිකාලීන මූල්‍ය ඉල්ලුම් සපුරා ගනු පිණිස ප්‍රමාණවත් නොවන අඩු මුදල් තත්වයක් පැවතීම ද්‍රවශීලතා අවදානම යනුවෙන් සරල ලෙස අර්ථකථනය කළ හැකිය. මණ්ඩලයේ දෘෂ්ටිකෝණයට අනුව, මෙම කාණ්ඩය තුළ ගැනෙන අවදානම් මගින් ද විභව ආයෝජන ඉඩ ප්‍රස්ථා වැළැක්විය හැකි අතර මූල්‍ය සාධන පත්‍රවල අලෙවිකළ හැකි බව ද ඉන් පහත වැටේ. සාමාන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙවීමෙන් පසු මණ්ඩලයේ ශුද්ධ දායක මුදල් ප්‍රමාණය මගින් මාසිකව රුපියල් මිලියන 1.69 ක ධනාත්මක මුදල් ආගලනයක් උත්පාදනය වූ අතර එමගින් මණ්ඩලයේ ද්‍රවශීලතා ස්ථාවරය තුළ උඩු ප්‍රවනතාවක් සනිටුහන් වූයේය. 2017 වර්ෂය අවසාන වන විට, ආදායම හා කල්පිරීමේ මුදල් වැනි වෙනත් මුදල් ආගලන වලින් ලත් ඉපැයුම් හැර වාර්ෂික ප්‍රතිලාභ ආපසු ගෙවුම් ප්‍රමාණය තුළ මුළු මුදල් ආගලනයෙන් සියයට 74 ක් වූ ඉපැයුමක් විද්‍යාමාන වූයේ ය. වඩාත්ම ද්‍රවශීලී ආකාරයේ ආයොජන ගණයේලා සැලකිය හැකි රජයේ සුරැකුම් පත් තුළ අරමුදල් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආයෝජනය කරනු ලබන හෙයින් ද්‍රවශීලත්ව උගුලෙහි සිර නොවී වැළකී සිටීමට මණ්ඩලයට හැකි වූයේ ය. මෙම යාන්ත්‍රනය මගින් සිදුවිය හැකි ඕනෑම ද්‍රවශීලතා පසුබෑම්වලට එරෙහි අතිරේක රැකවරණයක් සලසා දෙනු ලබයි. අකර්මන්‍ය අරමුදල්වලින් සාධාරණ ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමේ අභිප්‍රාය සහිතව දෛනික ද්‍රවශීලතා කළමනාකරණ මෙවලමක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය දෛනිකව එක් රැයකින් මුදල් උපයාගත හැකි ප්‍රති මිලදී ගැනුම් වෙළඳපොළ තුළ අරමුදල් ආයෝජනය කරයි. එබැවින් අරමුදල විෂයෙහි පවත්නා ද්‍රවශීලතා අවදානම ද අඩු මට්ටමක පවතී.

## මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම්වලට ආයතනයක් සතු මෙහෙයුම් ශක්‍යතාවය පිරිහී යා හැකිය. විය, මූල්‍යකරණය හා ක්‍රමවත් අවදානම නිශ්චය කරනු ලැබීමෙන් අනතුරුව උද්ගතවන අවශේෂ අවදානම වන අතර ඊට අභ්‍යන්තර කාර්ය පරිපාටි කඩාවැටීම් හා පුද්ගල හා පද්ධති කඩාවැටීම් යනාදියට සම්බන්ධ අවදානම් ද අන්තර්ගත වේ. මණ්ඩලයේ මෙහෙයුම් අවදානම්හී ප්‍රධාන ප්‍රභවයන් වනුයේ, තොරතුරු තාක්ෂණයේ විනාශවීම්, මිනිස් වැරදි හා මැදිහත්වීම් සහ ස්වාභාවික ව්‍යසන යනාදියයි. මෙම අවදානම් සමනය කරගනු පිණිස සවිමත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලැබ තිබේ. අදාළ මෙහෙයුම් කටයුතු ස්වාධීන අභ්‍යන්තර විගණක වරයෙකු විසින් විගණනය කරනු ලබන අතර ඒවායේ දුර්වලතා හා විෂමතා වහා විසඳා ගැනීම සඳහා මාසික පදනමක් මත එකී විගණන මගින් උද්ගත වන නිගමන සාකච්ඡාවට භාජනය කෙරේ.





110
5 262
63
455
3 494
138
95 153
293
720
12 251
338
46
542
9 570



# 03

# මූල්‍ය තොරතුරු

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ලාභ හෝ අලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | | | | ප්‍රතිප්‍රකාශිත |
| | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| **මුළු ආදායම** | | | | | |
| පොලී ආදායම | 4 | 27,303,884 | 23,530,300 | 27,239,114 | 23,492,350 |
| (-) පොලී වියදම - 3.0% සේනිහා අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව | | (7,545,681) | (6,759,768) | (7,545,681) | (6,759,768) |
| ශුද්ධ වෙළෙඳ කටයුතු ආදායම | 5 | 566,370 | 1,114,228 | - | - |
| ලාභාංශ ආදායම | 6 | 373,739 | 486,194 | 373,739 | 486,194 |
| ලාභ/අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/අලාභ | 7 | 535,345 | 68,592 | 535,345 | 68,592 |
| වෙනත් ආදායම් | 8 | 860,876 | 540,511 | 851,903 | 531,650 |
| | | **22,094,532** | **18,980,056** | **21,454,420** | **17,819,018** |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 9 | 1,174,842 | 1,059,412 | 1,053,611 | 985,963 |
| පරිපාලන වියදම් | 10 | 232,510 | 164,581 | 167,809 | 143,887 |
| මූල්‍ය වියදම් | 11 | 11,529 | 7,967 | 2,401 | 2,904 |
| සාමාජික වියදම් | 12 | 460,603 | 454,466 | 460,603 | 454,466 |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම් | 13 | 61,622 | 40,660 | 14,196 | 15,290 |
| ප්‍රවර්තන වර්ෂයේ සාමාජිකයන් වෙත ගෙවන ලද පොලී | | 208,429 | 173,630 | 208,429 | 173,630 |
| කොටස් හිමිකම් අයෝජනයන්හි වත්කම් හානිකරණය | 17.1 | 13,050 | 283 | 13,050 | 283 |
| | | **2,162,584** | **1,900,999** | **1,920,098** | **1,776,422** |
| **බදු වලට පෙර ලාභය** | | **19,931,948** | **17,079,058** | **19,534,322** | **16,042,596** |
| ආදායම් බදු වියදම | 14 | (2,779,214) | (2,733,111) | (2,705,842) | (2,394,498) |
| **බදු වලට පසු ලාභය** | | **17,152,734** | **14,345,946** | **16,828,480** | **13,648,098** |
| **වර්ෂය සඳහා ලාභය** | | **17,152,734** | **14,345,946** | **16,828,480** | **13,648,098** |
| **ලාභය ආරෝපනය :** | | | | | |
| සමාගම් කොටස් හිමියන් | | 17,120,308 | 14,276,161 | 16,828,480 | 13,648,098 |
| පාලනයට ප්‍රයෝජනවත් නොවන අයිතීන් | | 32,425 | 69,785 | - | - |
| **වර්ෂය සඳහා ලාභය** | | **17,152,734** | **14,345,946** | **16,828,480** | **13,648,098** |
| ඉ/ගෙ. රඳවාගත් ලාභය | | 3,473,280 | 3,345,119 | 3,473,280 | 3,345,119 |
| **විසර්ජනය සඳහා වූ ලාභය** | | **17,152,734** | **14,345,946** | **16,828,480** | **13,648,098** |
| **විසර්ජනය සඳහා වූ මුළු ලාභය** | | **20,626,014** | **17,691,065** | **20,301,760** | **16,993,217** |
| අඩු කළා: යෝජිත විභජනය - ලාභාංශ 6% | | 15,091,362 | 13,519,936 | 15,091,362 | 13,519,936 |
| අඩු කළා: ලාභාංශ - ලංකා ලුණු සමාගම | | - | 180,000 | - | - |
| **විසර්ජනයට පසු ලාභය** | | **5,534,652** | **3,991,129** | **5,210,398** | **3,473,280** |

පිටු අංක 51 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් හා මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ,

එම්. ඩී. වී. කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන්. ඩබ්ලිව්. විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදී.

මහින්ද මඩිහහේවා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

පී. ඩී. මැදගෙදර
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016<br>ප්‍රතිප්‍රකාශිත |
| | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතම** | | | | | |
| විකිණීම පිණිස ඇති මූල්‍ය උපකරණ සංචිතයට මාරු කිරීම | | (211,202) | (964,030) | (211,202) | (964,030) |
| විකිණීම සඳහා ඇති සංචිත (ඒකක) | | 8,484 | (3,846) | 8,484 | (3,846) |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයු ගණක ලාභය / (අලාභය) | | (11,599) | 500 | (11,599) | 500 |
| වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම) සඳහා ආදායම් බදු | | - | - | - | - |
| **වර්ෂය සඳහා වූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ ආදායම** | | **(214,317)** | **(967,376)** | **(214,317)** | **(967,376)** |
| **වර්ෂය සඳහා වූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම** | | **16,938,416** | **13,378,570** | **16,614,163** | **12,680,722** |
| **විභජනය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| සමාගමේ කොටස් හිමිකම් හිමියන් | | 16,905,991 | 13,308,785 | 16,614,163 | 12,680,722 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන් | | 32,425 | 69,785 | - | - |
| **බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම** | | **16,938,416** | **13,378,570** | **16,614,163** | **12,680,722** |

පිටු අංක 51 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් හා මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ,

එම්. ඒ. ඩී. කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන්. ඩබ්ලිව්. විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදි.

මහින්ද මඩිහහේවා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

පී. බී. මැදගෙදර
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | | | | ප්‍රතිප්‍රකාශිත |
| | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 929,141 | 748,033 | 743,124 | 614,332 |
| විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම් | 15 | 2,511,005 | 1,955,837 | 2,511,005 | 1,955,837 |
| පරිපාලිතයන්හි ආයෝජන | 16 | - | - | 470,961 | 470,961 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 17 | 7,845,694 | 9,209,233 | 7,845,694 | 9,209,233 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන | 18 | 250,864,335 | 223,110,604 | 250,616,892 | 222,454,509 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජන | 19 | 1,788,104 | 1,357,817 | 1,782,340 | 1,343,876 |
| අනෙකුත් වත්කම් | 20 | 11,920,568 | 9,621,688 | 11,050,045 | 9,244,193 |
| දේපළ, පිරියත සහ උපකරණ | 21 | 1,184,809 | 1,101,719 | 173,586 | 176,378 |
| කල්බදු දේපළ | 22 | 4,879 | 5,576 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 23 | 140 | 192 | 140 | 192 |
| ආයෝජන දේපළ | 24 | 3,812,500 | 3,400,000 | 3,812,500 | 3,400,000 |
| **මුළු වත්කම්** | | **280,861,175** | **250,510,700** | **279,006,286** | **248,869,511** |
| | | | | | |
| **බැරකම්** | | | | | |
| පොලී දරන ණය සහ ණය ගැනුම් | 25 | 183,045 | 227,124 | - | - |
| ප්‍රදාන සහ සහනාධාර | 26 | 35,521 | 38,042 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ බැරකම | 27 | 454,311 | 401,707 | 225,391 | 202,603 |
| ප්‍රවර්තන බදු බැරකම | 28 | 266,777 | 270,909 | 211,536 | 81,082 |
| අනෙකුත් බැරකම් | 29 | 604,068 | 510,550 | 157,269 | 104,569 |
| ප්‍රතිපාදන | 30 | 81,910 | 87,841 | 81,910 | 87,841 |
| **මුළු බැරකම්** | | **1,625,632** | **1,536,175** | **676,106** | **476,094** |
| | | | | | |
| කොටස් හිමිකම් | | 279,097,910 | 248,869,319 | 278,330,180 | 248,393,417 |
| පාලනය රහිත පොලී | | 137,632 | 105,207 | - | - |
| **මුළු කොටස් හිමිකම්** | | **279,235,543** | **248,974,526** | **278,330,180** | **248,393,417** |
| **මුළු බැරකම් සහ කොටස් හිමිකම්** | | **280,861,175** | **250,510,700** | **279,006,286** | **248,869,511** |

පිටු අංක 51 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් හා මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ,

එම්. ඒ. වී. කුමුදිනි
මූල්‍ය කළමනාකාරිනි

එන්. ඩබ්ලිව්. විමලවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදී.

මහින්ද මඩිහහේවා
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

පී. ඩී. මැදගෙදර
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

### ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| සමූහය | සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇති මූල්‍ය සංචිතය | වෙනත් සංචිත | ලාභාංශ තුළින් සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | පෙර අත්පත් කරගත් සංචිතය | පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය | එකතුව |
| | දායක මුදල | පොලිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | | | | | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | | | | 218,504,948 | 3,345,119 | 182,466 | (29,794) | 142,000 | | 27,838 | 55,422 | 222,227,999 |
| පෙර වර්ෂ ගැළපුම් (2.6 වන සටහන) | | | | | | | | | | | | - |
| පෙර වර්ෂ ගැළපුම් - බදු | | | | | 30,376 | | | | | | | 30,376 |
| බදු වියදම් සටහන් කිරීම - 2016 | | | | | (30,376) | | | | | | | (30,376) |
| කොටස් මත උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ - කොටස් සංචිත ගිණුම | | | | | | (15,395) | | | | | | (15,395) |
| දායක මුදල් ගැළපීම | | | | (16,607) | | | | | | | | (16,607) |
| දායක මුදල් ලැබීම් | 20,318,193 | | | 20,318,193 | | | | | | | | 20,318,193 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (13,478,002) | | | (13,478,002) | | | | | | | | (13,478,002) |
| සාමාජික අරමුදල සඳහා පොලී 3.0% | | 6,759,768 | | 6,759,768 | (6,759,768) | | | | | | | - |
| ලාභාංශ 6.0% | | | 13,519,936 | 13,519,936 | (13,519,936) | | | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 20,407,866 | | | | | | 69,785 | 20,477,651 |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | (173,479) | | | | | | (173,479) |
| විකිණීම පිණිස ඇති සංචිතය (ඒකක) | | | | | | (3,846) | | | | | | (3,846) |
| පරිපාලිතයන්හි අයෝජන වල සාධාරණ වටිනාකම පෙර තත්වයට ගෙනඒම | | | | | | (790,551) | | | | | | (790,551) |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | | | | | 200,000 | | | 200,000 |
| ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරු කිරීම් | | | | | | | | | (200,000) | | | (200,000) |
| ආයු ගණන ලාභය / (අලාභය) | | | | | | | 500 | | | | | 500 |
| පරිපාලිතය මඟින් ගෙවූ ලාභාංශ | | | | | | | | | | | (20,000) | (20,000) |
| පරිපාලිතයෙහි ස්කන්ධයන්හි වෙනස්වීම් | | | | | | | | | | 448,064 | | 448,064 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 6,840,190 | 6,759,768 | 13,519,936 | 245,608,236 | 3,473,280 | (800,805) | (29,295) | 142,000 | - | 475,902 | 105,207 | 248,974,526 |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | | | | 245,608,236 | 3,473,280 | (800,805) | (29,295) | 142,000 | - | 475,902 | 105,207 | 248,974,526 |
| පෙර වර්ෂ ගැළපුම් (කොටස් හායනය) | | | | | - | 283 | | | | | | 283 |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | (211,202) | | | | | | (211,202) |
| විකිණීම පිණිස ඇති සංචිතය (ඒකක) | | | | | | 8,484 | | | | | | 8,484 |
| කොටස් මත උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ - කොටස් සංචිත ගිණුම | | | | | | (150,881) | | | | | | (150,881) |
| ආයෝජන ස්කන්ධයන්හි හායනය | | | | | | 13,050 | | | | | | 13,050 |
| දායක මුදල් ගැළපීම (3.1 වන සටහන) | | | | (10,718) | | | | | | | | (10,718) |
| දායක මුදල් ලැබීම් | 22,764,642 | | | 22,764,642 | | | | | | | | 22,764,642 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (16,839,456) | | | (16,839,456) | | | | | | | | (16,839,456) |
| සාමාජික අරමුදල සඳහා පොලී 3.0% | | 7,545,681 | | 7,545,681 | (7,545,681) | | | | | | | - |
| ලාභාංශ 6.0% | | | 15,091,362 | 15,091,362 | (15,091,362) | | | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 24,374,161 | | | | | | 32,425 | 24,406,586 |
| ආයු ගණන ලාභය / (අලාභය) | | | | | | | (11,599) | | | | | (11,599) |
| පරිපාලිතය මඟින් ගෙවූ ලාභාංශ | | | | | | | | | | | | - |
| පරිපාලිතයෙහි ස්කන්ධයන්හි වෙනස්වීම් | | | | | | | | | | 291,828 | | 291,828 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 5,925,186 | 7,545,681 | 15,091,362 | 274,159,747 | 5,210,398 | (1,141,071) | (40,894) | 142,000 | - | 767,730 | 137,632 | 279,235,543 |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| මණ්ඩලය | සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | | | | | | |
| | දායක මුදල | පොලිය | ලාභාංශ | සාමාජික අරමුදල | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇත මූල්‍ය සංචිතය | වෙනත් සංචිත | ලාභාංශ තුළින් සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | | | | **218,504,948** | **3,345,119** | **182,466** | **(29,794)** | **142,000** | **-** | **222,144,738** |
| පෙර වර්ෂ ගැළපුම් - බදු | | | | | 30,376 | | | | | 30,376 |
| බදු වියදම් සටහන් කිරීම - 2016 | | | | | (30,376) | | | | | (30,376) |
| කොටස් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ - කොටස් සංචිත ගිණුම | | | | | | (15,395) | | | | (15,395) |
| දායක මුදල් ගැළපීම | | | | (16,607) | | | | | | (16,607) |
| දායක මුදල් ලැබීම් | 20,318,193 | | | 20,318,193 | | | | | | 20,318,193 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (13,478,002) | | | (13,478,002) | | | | | | (13,478,002) |
| සාමාජික අරමුදල සඳහා පොලී 3.0% | | 6,759,768 | | 6,759,768 | (6,759,768) | | | | | - |
| ලාභාංශ 6.0% | | | 13,519,936 | 13,519,936 | (13,519,936) | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 20,407,866 | | | | | 20,407,866 |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | (173,479) | | | | (173,479) |
| විකිණීම පිණිස ඇති සංචිතය (ඒකක) | | | | | | (3,846) | | | | (3,846) |
| පරිපාලිතයන්හි අයෝජන වල සාධාරණ වටිනාකම පෙර තත්වයට ගෙනඒම | | | | | | (790,551) | | | | (790,551) |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | | | | | 200,000 | 200,000 |
| ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරු කිරීම් | | | | | | | | | (200,000) | (200,000) |
| ආයු ගණන ලාභය / (අලාභය) | | | | | | | 500 | | | 500 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,840,190** | **6,759,768** | **13,519,936** | **245,608,236** | **3,473,280** | **(800,805)** | **(29,295)** | **142,000** | **-** | **248,393,417** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | | | | **245,608,236** | **3,473,280** | **(800,805)** | **(29,295)** | **142,000** | **-** | **248,393,417** |
| පෙර වර්ෂ ගැළපුම් (කොටස් හායනය) | | | | | | 283 | | | | 283 |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | (211,202) | | | | (211,202) |
| විකිණීම පිණිස ඇති සංචිතය (ඒකක) | | | | | | 8,484 | | | | 8,484 |
| කොටස් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ - කොටස් සංචිත ගිණුම | | | | | | (150,881) | | | | (150,881) |
| අයෝජන ස්කන්ධයන්හි හායනය | | | | | | 13,050 | | | | 13,050 |
| දායක මුදල් ගැළපීම **(3.1 වන සටහන)** | | | | (10,718) | | | | | | (10,718) |
| දායක මුදල් ලැබීම් | 22,764,642 | | | 22,764,642 | | | | | | 22,764,642 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (16,839,456) | | | (16,839,456) | | | | | | (16,839,456) |
| සාමාජික අරමුදල සඳහා පොලී 3.0% | | 7,545,681 | | 7,545,681 | (7,545,681) | | | | | - |
| ලාභාංශ 6.0% | | | 15,091,362 | 15,091,362 | (15,091,362) | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 24,374,161 | | | | | 24,374,161 |
| ආයු ගණන ලාභය / (අලාභය) | | | | | | | (11,599) | | | (11,599) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,925,186** | **7,545,681** | **15,091,362** | **274,159,747** | **5,210,398** | **(1,141,071)** | **(40,894)** | **142,000** | **-** | **278,330,180** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2017 | 2016 | 2017 | 2016 |
| | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | |
| ලාභ හෝ අලාභ හිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් විකුණුම් ලදමනාව | 2,004,630 | 264,734 | 2,004,630 | 264,734 |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ පරිනතවීම් | 144,902,638 | 226,866,952 | 144,902,638 | 226,866,952 |
| මූල්‍ය උපකරණ පරිනත වීම් - ණය සහ ලැබිය යුතු හිණුම් | 100,047 | 128,216 | 100,047 | 128,216 |
| ලාභ හෝ අලාභ හිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මිලදී ගැනීම් | (1,230,718) | (2,105,430) | (1,230,718) | (2,105,430) |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ මිලදී ගැනීම් | (172,194,646) | (250,088,421) | (172,194,646) | (250,088,421) |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකරණ අත්පත් කරගැනීම සඳහා ණය ප්‍රදානය | (628,139) | (215,730) | (628,139) | (215,730) |
| පාරිභෝගිකයන්ගෙන් ලද ප්‍රේෂණ | 1,797,418 | 2,137,602 | - | - |
| සැපයුම්කරුවන්ට කළ ගෙවීම් | (1,747,492) | (1,160,490) | - | - |
| පොලී ලැබීම් | 21,957,755 | 19,493,760 | 21,957,755 | 19,493,760 |
| ලාභාංශ ලැබීම් | 590,871 | 329,938 | 590,871 | 329,938 |
| අනෙකුත් ආදායම් ලැබීම් | 574,201 | 306,894 | 574,201 | 306,894 |
| ගෙවන ලද මෙහෙයුම් වියදම් | (1,137,322) | (1,047,671) | (1,137,322) | (1,047,671) |
| ගෙවන ලද සාමාජික වියදම් | (296,644) | (315,819) | (296,644) | (315,819) |
| ගෙවන ලද ආදායම් බදු | 29,219 | (713) | 29,219 | (713) |
| ගෙවන ලද පොලී | (220,011) | (181,210) | (211,060) | (176,512) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගෙවීම් | (13,947) | (23,142) | - | - |
| ප්‍රාදේශිය ලේකම්වරුන්ට ගෙවන ලද බිම් කුලී | (9,477) | (25,095) | - | - |
| 5 වසර ශිෂ්‍යත්ව ගෙවීම් /ආපසු ලැබීම් | (83,641) | (178,314) | (83,641) | (178,314) |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම්/ආපසු ලැබීම් | (41,496) | (41,908) | (41,496) | (41,908) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(5,646,753)** | **(5,855,848)** | **(5,664,304)** | **(6,780,024)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (196,211) | (271,465) | (20,544) | (24,990) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් හරහා ලදමනාව | 503 | 470 | 218 | 73 |
| ආයෝජන මිලට ගැනීම | 408,652 | (585,903) | - | - |
| පොලී ලැබීම් | 66,092 | 40,087 | - | - |
| ශුද්ධ (ගෙවීම්)/ කාර්ය මණ්ඩල ණය මුදල් ආපසු ගෙවීම් | 8,177 | 13,882 | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **287,214** | **(802,930)** | **(20,326)** | **(24,917)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | | | |
| දායක මුදල් ලැබීම් | 22,630,429 | 20,053,869 | 22,630,429 | 20,053,869 |
| ප්‍රතිලාභ ගෙවීම් | (16,814,982) | (13,473,997) | (16,814,982) | (13,473,997) |
| ගෙවන ලද මූල්‍ය වියදම් | (2,026) | (2,547) | (2,026) | (2,547) |
| ලාභාංශ ගෙවීම් | (228,695) | (200,000) | - | - |
| පොළිය දරන ණය සහ ණය ගැනුම් ආපසු ගෙවීම් | (7,260) | (24,038) | - | - |
| මූල්‍ය කල්බදු වගකීමට අදාළ මූලික මුදල් ගෙවීම | (5,157) | (4,425) | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **5,572,309** | **6,348,862** | **5,813,421** | **6,577,325** |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම** | **212,770** | **(309,916)** | **128,791** | **(227,616)** |
| ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමානයන් | 545,704 | 855,620 | 614,332 | 841,949 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමානයන්** | **758,474** | **545,704** | **743,124** | **614,332** |

**මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| | ආයතනයේ නම | ගැණුම් මිල (රු) | සාධරණ වටිනාකම (රු) | වෙළඳපොල වටිනාකම (රු) |
|---|---|---|---|---|
| 1 | ඒසීඑල් කේබල්ස් පීඑල්සී | 98,712 | 114,448 | 78,532 |
| 2 | ඒහොට් දේපළ සමාගම | 58,213 | 43,746 | 40,523 |
| 3 | එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී | 297,844 | 170,422 | 141,843 |
| 4 | එයිට්කන් ස්පෙන්ස් හෝටල් පීඑල්සී | 206,275 | 102,652 | 69,699 |
| 5 | බයිරහා ෆාම්ස් පීඑල්සී | 287,633 | 217,186 | 175,669 |
| 6 | කාසන් කම්බර්බැච් පීඑල්සී | 16,147 | 6,427 | 6,499 |
| 7 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් පීඑල්සී | 256,280 | 226,335 | 208,681 |
| 8 | සිලෝන් ඉන්වෙස්මන්ට්ස් | 8,523 | 3,489 | 3,058 |
| 9 | සිලෝන් ගාඩියන් ආයෝජන සමාගම | 143,302 | 54,992 | 42,717 |
| 10 | කලම්බු ෆොට්ලන්ඩ් පීඑල්සී | 55,323 | 13,231 | 13,301 |
| 11 | කොමර්ෂල් බැංකුව පීඑල්සී | 1,066,007 | 1,080,308 | 1,045,665 |
| | කොමර්ෂල් බැංකුව (x) පීඑල්සී | 464,740 | 406,541 | 382,421 |
| 12 | සීඅයිසී හෝල්ඩින්ස් පීඑල්සී | 28,170 | 20,479 | 15,177 |
| 13 | ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී | 646,944 | 488,524 | 494,506 |
| 14 | ඩොක්යාර්ඩ් පීඑල්සී | 442,105 | 131,986 | 152,479 |
| 15 | ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සී | 2,120 | 1,431 | 1,402 |
| 16 | ඊඩන් හොටෙල්ස් පීඑල්සී | 75,886 | 21,356 | 22,464 |
| 17 | එක්ස්පෝලංකා පීඑල්සී | 43,026 | 21,966 | 18,828 |
| 18 | හේකාර්බ් පීඑල්සී | 138,996 | 117,124 | 113,611 |
| 19 | හැටන් නැෂනල් බැංකුව (x) පීඑල්සී | 96,736 | 106,221 | 110,485 |
| 20 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | 14,093 | 10,024 | 9,655 |
| 21 | ජෝන් කීල්ස් පීඑල්සී | 15,800 | 10,199 | 9,162 |
| 22 | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී | 2,780,328 | 2,440,894 | 2,504,523 |
| 23 | කැළණි කේබල්ස් පීඑල්සී | 9,032 | 12,424 | 9,461 |
| 24 | ලංකෙම් සිලෝන් පීඑල්සී | 16,823 | 4,937 | 3,291 |
| 25 | ලාෆ් ගෑස් පීඑල්සී | 1,631 | 1,557 | 1,083 |
| 26 | ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී | 815,942 | 891,477 | 809,793 |
| 27 | පීපල්ස් ලීසිං පීඑල්සී | 57,407 | 40,289 | 40,053 |
| 28 | පිරමල් ග්ලාස් පීඑල්සී | 32,246 | 20,035 | 21,925 |
| 29 | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් පීඑල්සී | 5 | 31 | 29 |
| 30 | රේණුකා හොල්ඩිංග්ස් පීඑල්සී | 114,533 | 61,492 | 71,984 |
| 31 | රිසර්ස් බලශක්ති පීඑල්සී | 48,544 | 34,108 | 28,714 |
| 32 | රෝයල් සෙරමික්ස් පීඑල්සී | 52,567 | 55,604 | 54,885 |
| 33 | සම්පත් බැංකුව පීඑල්සී | 83,148 | 107,366 | 136,975 |
| 34 | සෙලාන් බැංකුව පීඑල්සී | 303,014 | 278,582 | 267,432 |
| | සෙලාන් බැංකුව (x) පීඑල්සී | 42,486 | 35,177 | 34,546 |
| 35 | සිංගර් ෆිනෑන්ස් පීඑල්සී | 23,608 | 23,153 | 17,540 |
| 36 | ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී | 110,326 | 120,530 | 93,782 |
| 37 | ටිරාන්ස් ඒෂියා පීඑල්සී | 37,073 | 53,191 | 50,903 |
| 38 | වැලිබල් පවර් පීඑල්සී | 46,779 | 45,740 | 39,503 |
| 39 | වැලිබල් වන් පීඑල්සී | 43,227 | 31,860 | 30,482 |
| | **එකතුව** | **9,081,594** | **7,627,534** | **7,373,281** |

### ලැස්තුගත නොවන සමාගම්වල කොටස් 2017/12/31 දිනට

| | ආයතනයේ නම | විකුණුම් මිල (රු) | ශුද්ධ වත්කම් වටිනාකම (රු) |
|---|---|---|---|
| 1 | සීමාසහිත ෆිච් රේටින් ලංකා | 1,649 | 2,477 |
| 2 | සීමාසහිත ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් | 73,650 | 130,567 |
| | **එකතුව** | **75,299** | **133,044** |

### 31/12/2017 වන දිනට පරිපාලිතයේ ආයෝජන

| | ආයතනයේ නම | විකුණුම් මිල (රු) |
|---|---|---|
| 3 | ලංකා ලුණු සමාගම | 470,961 |
| | | **470,961** |

### ලැයිස්තුගත කොටස් - වෙළඳාම් කිරීම

| | ආයතනයේ නම | විකුණුම් මිල (රු .000) | සාධරණ වටිනාකම (රු .000) | වෙළඳපොල වටිනාකම (රු .000) |
|---|---|---|---|---|
| 1 | ඒසීඑල් කේබල්ස් පීඑල්සි | 153,062 | 157,816 | 108,290 |
| 2 | කොමර්ෂල් බැංකුව පීඑල්සි | 1,117,913 | 1,099,886 | 1,073,141 |
| | කොමර්ෂල් බැංකුව (x) පීඑල්සි | 114,495 | 113,261 | 106,541 |
| 3 | ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සි | 163,099 | 114,130 | 111,764 |
| 4 | හැටන් නැෂනල් බැංකුව පීඑල්සි | 144,705 | 153,181 | 172,050 |
| | හැටන් නැෂනල් බැංකුව (x) පීඑල්සි | 57,739 | 62,650 | 65,164 |
| 5 | ජෝන් කීල්ස් පීඑල්සි | 588,903 | 634,888 | 656,796 |
| 6 | ලංකා අයිඔසී පීඑල්සි | 92,236 | 75,334 | 65,947 |
| 7 | ලාෆ් ගෑස් පීඑල්සි | 6,393 | 5,382 | 3,742 |
| 8 | සෙලාන් බැංකුව පීඑල්සි | 16,146 | 15,118 | 14,513 |
| | සෙලාන් බැංකුව (x) පීඑල්සි | 87,667 | 87,667 | 84,436 |
| 9 | සිංගර් ෆිනෑන්ස් පීඑල්සි | 48,443 | 44,976 | 34,073 |
| 10 | ටිජේ ලංකා පීඑල්සි | 11,529 | 18,230 | 14,550 |
| | **එකතුව** | **2,602,329** | **2,582,518** | **2,511,005** |

### 31/12/2017 දිනට ලැයිස්තුගත ඒකක භාර

| | ආයතනයේ නම | විකුණුම් මිල (රු .000) | සාධරණ වටිනාකම (රු .000) | වෙළඳපොල වටිනාකම (රු .000) |
|---|---|---|---|---|
| 1 | කොම්ට්‍රස්ට් කොටස් අරමුදල | 20,195 | 40,021 | 40,000 |
| 2 | ජාතික කොටස් අරමුදල | 47,549 | 162,505 | 163,770 |
| 3 | නාමල් ග්‍රෝත් අරමුදල | 10,000 | 128,360 | 135,600 |
| | **එකතුව** | **77,744** | **330,886** | **339,370** |

## 1. සාංගමික තොරතුරු

### 1.1. නිත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නිත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියා පදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

| ආයතනයේ නම | ව්‍යාපාරයේ ස්වභාවය |
|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් එකී සේවක සේවිකාවන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවක සේවිකාවන් ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී. |
| ලංකා ලුණු සමාගම | මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි. |

### 1.3. මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සතු අත්‍යන්ත මව් ව්‍යවසායක් නොමැත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මව් ව්‍යවසාය ලෙස කටයුතු කරයි.

### 1.4. නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2018 මාර්තු මස 02 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

## 2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

### 2.1. පොදු ප්‍රතිපත්ති

#### 2.1.1. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රපෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ.

#### 2.1.2. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2017 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

## 2.1.3. වැදගත් ගිණුම් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දැක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂී ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතාවයක් සම්බන්ධ වන්නා වූ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්තමේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

### තීන්දු

### විලම්බිත බදු වත්කම්:

සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ චිල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

## 2.1.4. මානනය කිරීමේ පදනම

ඇතැම් වත්කම් හා බැරකම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික සම්මුතිය යටතේ සාධාරණ අගය මත පිළියෙළ කරනු ලැබ ඇත.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙළ කරනු ලැබ තිබේ.

## 2.1.5. ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් ඒකකය

සමාගමේ ක්‍රියාකාරී ව්‍යාවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

## 2.1.6. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සෙරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාරණය දැනුවත් නොමැත. එහෙයින්, සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

## 2.1.7. සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ.

## 2.2. ඒකාබද්ධ කිරීමේ පදනම

### (අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2017 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ.

පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

### (ආ) පාලිත සමාගම්

පාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමාගම සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්ත්‍ය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ.

ඒකාබද්ධ කිරීමේදී සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ ඒකාබද්ධ කිරීමේදී අන්තර්ගත කළ සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

### (ඇ) රපෝර්තු දිනය

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

## 2.3 ලාභය සහ අලාභය මානනය කිරීමේ පදනම

### 2.3.1 ආදායම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හී ය.  වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

#### භාණ්ඩ විකිණීම

සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂී අවදානම් සහ භාණ්ඩවල හිමිකාරීත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

#### සේවා ඉටු කිරීම

එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදයම හඳුනා ගැනේ.

#### පොලිය

වත්කම් මත සඵල පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

### 2.3.2. පොලී සහ සමාන ආදායම් සහ වියදම්

සියලුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මූල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ. එම ගණනය මගින් මූල්‍ය මෙවලමෙහි දැක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සඵල පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය එකී ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කූපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ.

දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකගත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

### 2.3.3. ලාභාංශ ආදායම් හා වියදම්

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

### 2.3.4. වෙනත් ආදායම්

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

### 2.4. බදුකරණය

### 2.4.1. ප්‍රවර්තන බදු

රපෝර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනීමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂ්‍ය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනීමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශිය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

### 2.4.2. විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල

පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනීමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි  වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වූ විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

## 2.5. විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිලිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

## 2.6. ඉකුත් වර්ෂයේ ලාභයට ගැළපීම

දෝෂ නිවැරදි කිරීම් අතීතයට බලපාන පරිදි ගළපනු ලබනුයේ, මූල්‍ය ප්‍රකාශවල සංසන්දනාත්මක භාවය ඉන් වර්ධනය වන නිසාය. ඒ අනුව, රඳවාගත් ඉපැයුම්වල ආරම්භක ශේෂය එකී දෝෂවල විශෝධනයෙන් පසුව ප්‍රතිප්‍රකාශ කරනු ලැබේ.ඉකුත් වසරට අයත් පහත දැක්වෙන දෝෂ අනාවරණය කරගනු ලැබ 2017 වසර තුළ විශෝධනය කරන ලදි.

(අ) ඉකුත් වසරට අයත් ගැළපුම් හී පහත දැක්වෙන දෝෂ විශෝධනයන් අඩංගු විය.

| දෝෂයෙහි ස්වභාවය | රු. ('000) |
|---|---|
| අනුග්‍රහයෙන් බැහැරව පවත්නා 35 වන සංවත්සර වැය ශේෂය | 823 |
| 35 වන සංවත්සරය සඳහා මණ්ඩලය දැරූ වැය | 2,244 |
| පැවරූ හිමිකම් නොපෑ ආපසු ගෙවුම් මත ලාභාංශ සහ පොලී - 2015 | 281 |
| පැවරූ හිමිකම් නොපෑ ආපසු ගෙවුම් මත ලාභාංශ සහ පොලී - 2016 | 36 |
| පැවරූ හැරවුම් ප්‍රතිලාභ මත ලාභාංශ සහ පොලී - 2015 | 2,650 |
| පැවරූ හැරවුම් ප්‍රතිලාභ මත ලාභාංශ සහ පොලී - 2016 | 364 |

(ආ) සාමාජික අරමුදලට කළ ගැළපුම් පහත දැක්වේ.

(ආ) (1) 2016 සාමාජික අරමුදලට කළ ගැළපුම්

| දෝෂයෙහි ස්වභාවය | රු. (000) |
|---|---|
| ලාභාංශ සහ පොලී - 2016 දක්වා | 317 |
| ලාභාංශ සහ පොලී - 2016 දක්වා | 3,014 |

(ඇ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඉකුත් කාල පරිච්ඡේද කිසිවක් සඳහා ජාතික බද්ද වෙතින් බදුබැර සඳහා වන හිමිකම් ඉල්ලා නොමැත.

ඉකුත් මුදල් වර්ෂය තුළසිදු වූ එකී දෝෂය නිවැරදි කරනු පිණිස වඩාත්ම කලින් එළැඹෙන රපෝර්තු දිනයට (2015 ජනවාරි මස 01 වන දිනට) පැවති රඳවාගත් ඉපැයුම් රුපියල් මිලියන 128 කින් ගළපනු ලැබ තිබේ. එනමුත්,එම මුදල් ප්‍රමාණය,ඉකුත් මුදල් වර්ෂයේ රඳවාගත් ඉපැයුම්හි ආරම්භක ශේෂයෙන් ගළපන ලද රුපියල් 30,180,783.57 ක් වූ මුදල් ප්‍රමාණයෙන්තව දුරටත් වැඩි කරනු ලැබිය යුතුව තිබේ.

## 2.7. මූල්‍ය මෙවලම්

### 2.7.1. මූල්‍ය මෙවලම් හි ප්‍රාරම්භක මිනුම්කරණය

ප්‍රාරම්භක හඳුනාගැනීමේදී මූල්‍ය මෙවලම්හි වර්ගීකරණය රඳා පවතිනුයේ එහි අරමුණ හා එහි අඩංගු ලක්ෂණ මෙන්ම ඒවා අත්කර ගැනීමේදී කළමනාකරණය තුළ ඊට තිබූ අභිලාෂයද මතය. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව වාර්තා කරනු ලැබූ මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට සියලු මූල්‍ය මෙවලම්, ඒවායේ සාධාරණ අගයට එකතු කළ ගනුදෙනු පිරිවැය අනුව මානනය කරනු ලැබේ.

### 2.7.2. හඳුනාගනු ලබන දිනය

සියලුම මූල්‍ය වත්කම් හා බැරකම්, ඒවායේ වෙළෙඳ දිනයේදී, එනම්, එකී මූල්‍ය මෙවලමෙහි කොන්ත්‍රාත්තුමය විධිවිධාන වලට මණ්ඩලය පාර්ශවකරුවෙකු වන දිනයේදී, මූලික වශයෙන් හඳුනා ගනු ලැබේ. මීට නිත්‍ය වෙළෙඳ ක්‍රමය හෙවත් වෙළඳපොළ තුළ පවත්නා නියාමනය හෝ සම්මුතිය මගින් සමාන්‍ය පරිදි ස්ථාපනය කෙරුණු කාල රාමුතුළ වත්කම් පිටත්කර භාරදීම අවශ්‍ය වන්නාවූ මූල්‍ය වත්කම් මිලදී ගැනුම් හා විකුණුම් අන්තර්ගත වේ.

### 2.7.3. ලාභය හෝ අලාභය මගින්වූ සාධාරණ අගය (FVTPL)

මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වනුයේ, ඒවායේ මූලික හඳුනාගැනීමෙන් පසුව කළමනාකරණය විසින් නම් කරනු ලැබ ඇති ඒවායි. පහත දැක්වෙන නිර්ණායකයන් සපුරාලීමෙන් පසුව හා මෙවලමෙන් මෙවලමට වූ පදනමක් මත එසේ නම් කිරීම නිශ්චය කළ කල්හී කළමනාකරණය විසින් ඒවායේ ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගය මත පමණක් යම් මෙවලමක් නම් කරනු ලැබිය හැකි වන්නේය.

(අ) වත්කම් හෝ බැරකම් ගණනය කිරීමෙන් හෝ එකිනෙකට වෙනස් පදනමක් මත ඒවායේ ලාභය හෝ ආලභය මත හඳුනාගනු ලැබීම මගින් හෝ වෙනත් අයුරකින් උද්ගත විය හැකි අනුකූල ප්‍රතිකර්ම මෙම නම්කිරීම තුළින් සපුරා ඉවත් කරයි. එසේ නැතහොත් සැලකිය යුතු අයුරින් අඩු කරයි.

(ආ) මෙම වත්කම් හා බැරකම් ලේඛණගත ආදායම් කළමනාකරණය හෝ ආයෝජන උපායමාර්ගය ප්‍රකාරව සාධාරණ අගයට අනුව කළමනාකරණය කරනු ලැබ ඒවායේ කාර්ය සාධනය අගය කරනු ලබන මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් සමූහයක හෝ ඒ දෙවර්ගයේම කොටසකි.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අනුව ගණනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට අනුව සටහන් කෙරේ. සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් සටහන් කරනු ලබනුයේ, “ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට නම් කරනු ලබන මූල්‍ය වත්කම්වල සහ බැරකම්වල ශුද්ධ ලාභය හෝ අලාභය” තුළය. ඉපැයූ හෝ දැරූ පොලිය, සඵල පොලීඅනුපාතය යොදාගනිමින් පිළිවෙලින් “පොලී ආදායම” හෝ පොලීවියදම තුළ උපචිත කරන ලබන අතර ලාභාංශ ආදායම සටහන් කෙරෙනුයේ, අදාළ ලාභාංශ ගෙවීම ලබා ගැනීම සඳහා වන අයිතිවාසිකම තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදායම් ප්‍රකාශය තුළ “ලාභාංශ අදායම” යටතේය.

අලෙවිය සඳහා නොතැබෙන හිමිකම් කොටස් ආයෝජනවල වටිනාකම, ඒවායේ සැලකිය යුතු හෝ කල්ගත වන්නාවූ වටිනාකම හඳුනාගනු පිණිස කාලානුරූපීව සමාලෝචනයට භාජනය කෙරේ. මෙම කරුණ සඳහා, වෙළඳපොළ වටිනාකම පිරිහීමට ලක් නොවන එහෙත්, මූලෝපායික අභිලාෂය සහ නෛසර්ගික වටිනාකම වැනි ගුණාත්මක සාධකවලට සීමා නොවන අදාළ වත්කම් හානිකරණය පිළිබඳ විෂය නිශ්‍රිත සාක්ෂි කළමනාකරණය විසින් සලකා බලනු ලබන්නේය. ඒ අනුව, සැලකිය යුතු හෝ කල්ගත වන්නාවූ යම් පිරිහීමක් වටිනාකම තුළ සිදුවන කල්හි හා මෙම තත්වය ප්‍රත්‍යාවර්තනය පිණිස යුක්ති සහගත හැකියාවක් නොමැති විට ඇතැම් හිමිකම් ආයෝජනවලට

අදාළව (රුපියල් 282,738 ක් වශයෙන් ගණනය වන) දුබලතා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ තිබේ. එබඳු ප්‍රතිපාදන ලාභය හෝ අලාභය හරහා හඳුනාගනු ලැබිය යුතු වන්නේය.

### 2.7.4. අලෙවිය සඳහා පවත්වාගනු ලැබීම

අලෙවිය සඳහා පවත්වාගනු ලබන මූල්‍ය වත්කම් හෝ බැරකම් සාධාරණ අගයට අනුව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකශයෙහි සටහන් කරනු ලැබේ. සාධාරණ අගය තුළ සිදුවන වෙනස්කම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. පොලිය සහ ලාභාංශ අදායම හෝ වියදම ආදායම් ප්‍රකාශයෙහි සටහන් කෙරෙනුයේ, අදාළ කොන්ත්‍රාතුවේ නියමයන් ප්‍රකාරව හෝ අදාල ගෙවීම් ලබා ගැනිම සඳහා වන අයිතිවාසිකම් තහවුරු කරගනු ලැබ ඇති විටදීය. නුදුරු කාල වකවානුවක් තුළ විකිණීම හෝ ආපසු මිලදී ගැනීම අරමුණු කර ගනිමින් ප්‍රධාන වශයෙන් අත්කරගනු ලැබ ඇති කොටස් හිමිකම් මෙම වර්ගීකරණය තුළ අන්තර්ගත කර ඇත.

### 2.7.5. විකිණීම සඳහා ඇති ආයෝජන

විකිණීම සඳහා ඇති ආයෝජන තුළ අනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනිමට අපේක්ෂිත සහ ද්‍රවශීලතා අවශ්‍යතාවනට ප්‍රතිචාරාත්මක වශයෙන් හෝ වෙළඳපොළ තත්වයන්ට ප්‍රතිචාරාත්මක වශයෙන් විකුණනු ලැබිය හැකි වන්නාවූ දිගු කාලීන කොටස් හිමිකම් ආයෝජන සහ ණය සුරැකුම්පත් සමන්විත වේ. විකිණීම සඳහා පවත්නා මූල්‍ය ආයෝජන ඒවායේ මූලික ගණනය කිරීමෙන් පසුව නැවතත් සාධාරණ අගය අනුව මානනය කෙරේ.

### 2.7.6. පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන

පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන වනුයේ, පරිණත වන තෙක් රඳවා තබා ගැනීමට සමාගම අදහස් කරන හා ඒ සඳහා සමාගමට හැකියාවක් ඇති ස්ථාවර හෝ නිශ්වයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් සහිත මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් පසුව, පරිණතවීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන, ඒවායේ දුබලතා අලාභද අඩුකරනු ලැබ, සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව නැවතත් මානනය කෙරේ. සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන අත්කරගැනීම් සහ ගාස්තු මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ. ආදායම් ප්‍රකාශයෙහි "පොලී ආදායම" යටතේ ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. එබදු ආයෝජන හානිකරණය හේතුවෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශයට කෙරෙන සටහන් තුළ හඳුනා ගැනේ.

### 2.7.7. ණය සහ ලැබීම් නියමිත

ණය සහ ලැබීම් නියමිත වනුයේ, සක්‍රීය වෙළෙඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම්, ඒවායේ දුබලතා අලාභ අඩු කිරීමට යටත්ව සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත නැවතත් මානනය කෙරේ.

සඵල පොළී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන අත්කර ගැනිම් සහ ගාස්තු හෝ පිරිවැය මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ. අදායම් ප්‍රකාශයෙහි පොළී ආදායම තුළ සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය කිරීම අන්තර්ගත වේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ, වෙනත් මෙහෙයුම් වියදම් යටතේ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සාධාරණ අගයෙහි අලාභය සේවක පිරිවැයක් ලෙස සේවකයාගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ.

### 2.7.8. ප්‍රති මිලදීගැණුම් සහ ප්‍රතිවර්ථන ප්‍රති මිලදී ගැනිම් හා බැඳි ගිවිසුම්

ප්‍රති මිලදී ගැනිම්හි කරනු ලබන ආයෝජනයන්හි ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් ඇති අතර ඒවා කල් පිරෙන තෙක් රඳවා ගැනිමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් මණ්ඩලය සතුය. එබැවින් එය පරිණත ආයෝජනයක් දක්වා රඳවා ගැනිම පිණිස නිගමනය වේ. අදාළ ගණුදෙණු කිරීමේ පිරිවැයක් ඇත්නම් එයද ඇතුළුව මෙය ආරම්භයේදී සාධාරණ අගය අනුව ගණනය කළ යුතු අතර පසු කාලීනව සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව මානනය කළ යුතු වන්නේය.

#### මූලික මූල්‍ය මෙවලම්

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනිමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

### ණය සහ ලැබීම් නියමිත

ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබීම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි.

ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදී මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ  පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හීය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලැකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමණවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 2.8. දේපළ, පිරියත හා උපකරණ

ආරම්භක අවස්ථාවේදී දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට අනුව හඳුනා ගනු ලැබේ. ගැණුම් මිල සෘජුව ආරෝපනය කළහැකි පිරිවැය සහ කොටස් ගලවා වෙන් කිරීමේ සහ ඉවත් කිරීමේ කටයුතු සඳහා වැලැක්විය නොහැකි ආකාරයේ අනාගතයේ දැරීමට සිදුවන ඇස්තමේන්තු ගත වර්තමාන  පිරිවැය පිරිවැයෙහි අන්තර් ගතවේ. ඊට අනුරූප වන්නාවූ බැරකම් ප්‍රතිපාදන තුළ හඳුනා ගනු ලැබේ.

මුල් අවස්ථාවේ තක්සේරු කර පැවති කාර්යසාධන තත්වයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථාවත්ව පවත්වා ගැනිම සඳහා හෝ නඩත්තු කර ගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ මත සිදුවන අළුත්වැඩියාව සහ නඩත්තු කටයුතු වෙනුවෙන් දරන වියදම, එය දරන අවස්ථාවේදී කෙරෙන වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

නිශ්චල දේපළ (ආයෝජන දේපළ) සම්බන්ධයෙන් හැරනු විට ක්ෂය විම් සඳහා ප්‍රතිපාදනය ගණනය කෙරෙනුයේ හීනවන ශේෂ ක්‍රමය අනුවය. සින්නක්කර ඉඩම් සම්බන්ධයෙන් ක්ෂය ප්‍රතිපාදනය කරනු නොලැබේ.  අනෙකුත් සියළුම දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒවායේ අවශේෂ අගයක් වේනම් එය අඩු කළ එහි ධාරණ අගය ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය මුළුල්ලේ කපා හැරිය හැකිවන අයුරින් ක්ෂවිම් ප්‍රතිපාදනය කරනු ලැබේ.  මෙම වත්කම්වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය පහත දක්වා ඇත.

| | |
|---|---|
| පරිගණක උපකරණ | 20% |
| අනෙකුත් උපකරණ | 20% |
| ලී බඩු | 15% |
| මෝටර් වාහන | 25% |
| සවිකිරීම් හා වැද්දුම් | 33.33% |

ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය අවශේෂ හීනවන ශේෂ ක්‍රමය මත වාර්ෂිකව 6.67% ක් වූ ප්‍රතිශතයක් වශයෙන් හෙළිදරව් කළයුතු වන්නේය.

වත්කම්හි ක්ෂයවීම ආරම්භ වනුයේ, එය භාවිතය සඳහා යොදා ගැනුණු මාසය තුළ සිට වන අතර එය ව්‍යපහරණය කළ මාසය තුළ සිට නොවේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යපහරණය මත හෝ ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හෝ හඳුනා ගැනිමක් සිදු නොකෙරේ. එසේ හඳුනා නොගැනීම නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම් නොපිලිගැනෙන වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ අන්තර් ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත් ඒවා අඩුකරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂය විම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩු කළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර පහත දැක්වෙන දේපළ,පිරියත හා උපකරණ ක්ෂය විම් සඳහා එය යොදා ගැනේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම් | 2.5% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10% |
| උපකරණ | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | 10% |
| මොටර් වාහන | |
| - මහ මාර්ග නහන | 10% |
| - ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | 20% |
| සංවර්ධන වැඩ | 20% |
| වැඩුනු වතුවගා - පොල් | 2% |

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණුපිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

- **ජෛවවත්කම්**

  ජෛව වත්කම්, පරිණත වූ ජෛව වත්කම් සහ පරිණත නොවූ ජෛව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ.පරිණත වූ ජෛව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ ජෛව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක ජෛව වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොගැනෙන ජෛව වත්කම් ඇතුළත් වේ.අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ

වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම ජෛව වත්කම් හඳුනා ගනියි. ජෛව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථිර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක ජෛවවත්කම්**

ධාරක ජෛව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, භෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ ඍජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී ඵල දරන ධාරක ජෛව වත්කම් (පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

## 2.9. ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරිමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදි පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනිමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනසද සමග විස්තීර්ණ ආදායම් ගිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළ ආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනිමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර එය, රජයේ තක්සේරුකරු විසින් 2017 නොවැම්බර් මස 15 වන දින තක්සේරු කරන ලද්දේ ය. රජයේ තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු. 3,812,500,000/- ක් වූ ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් තිබේ.

## 2.10. අස්පෘශ්‍ය වත්කම්

### 2.10.1. බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනිමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනිමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේද තක්සේරු කිරිමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරිමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරිමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරිමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිළිගැනෙන අවස්ථාවේදී, එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.10.2. පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනු ලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.11. කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, "කල්බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

### 2.11.1. මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදී, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

### 2.12. වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදීමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමාන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ වට්ටෝරු භාණ්ඩ ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම අනුව |
| නිමි භාණ්ඩ | - | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශිය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව |
| කෙරෙමින් පවත්නා | - | ඝනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදි පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසීමේ වියදමින් 25% ක්වූ ප්‍රමාණයට අනුව |
| පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් | - | පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව |

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිලය.

### 2.13. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 2.13.1. සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනීමේදි තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

### 2.13.2. නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේදායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරවසියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ.සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.13.3. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත. එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකිම උද්ගත වන්නේය. මෙම වගකීම් දැරීම බාහිර වශයෙන් මූල්‍යයනය කෙරෙන්නක් නොවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්ච්ඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනානොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.

ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නාවූ කල්පිරීමේ දිනයන් ඇත්තාවූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත ඒක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක අනුව නාමනය කරනු ලැබ ඇත්තාවූද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේය. අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකී ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක්වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීවගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම්ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරීමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවීම්වල සරල කිරීම්ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාලද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගී කරගනු ලැබ තිබේ. පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයුගණක වශයෙන් අගයනු ලැබද නොමැත.

## 2.14. සම කොටස් හිමිකම

### 2.14.1. සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකාවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙුවෙන් උපචිත වන්නාවූ පොලි හා ලාභාංශද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේය.

### 2.14.2. ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනීමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

### 2.14.3. සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයටපත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විතවේ.

### 2.15. ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නාවූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත  වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

### 2.16. වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබීම් නියමිත තුළ පොලී නොදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබීම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය. එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදි වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

### 2.17. වෙළඳ ගෙවීම් නියමිත

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදැරේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

### 2.18. මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

## 2.19. ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදාන ලැබේය යනුවෙන් හා සියලුම සම්බන්ධිත කොන්දේසි අනුව කටයුතු කර ඇතැයි යනුවෙන් යුක්ති සහගත සහතිකයක් පවත්නා අවස්ථාවකදී ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය යම් වියදම් අයිතමයකට අදාළ වන කල්හී අදාළ ප්‍රදානය ක්‍රමවත් පදනමක් මත වන්දි ගෙවනු පිණිස අදහස් කරන පිරිවැය හා ගැළපීම සඳහා අවශ්‍ය වන්නාවූ කාල පරිච්ඡේදය මුළුල්ලේ පවත්නා ආදායමක් ලෙස හඳුනා ගනු ලබනවා ඇත. ප්‍රදානය යම් වත්කමකට අදාළ වන කල්හි එය විලම්බිත ආදයමක් ලෙස ස්ථාපනය කෙරේ. මුදල්මය නොවන ප්‍රදාන සමාගම විසින් ලබා ගන්නා අවස්ථාවකදී අදාළ වත්කම හා එම ප්‍රදානය නාමික මුදල් වටිනාකම් මත සටහන් කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි සමාන වාර්ෂික කොටස් මගින් අදාළ වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය වෙත එය මුදා හරිනු ඇත.

ලද ප්‍රදාන ප්‍රතිවර්තන ගිණුමකට බැර කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අයඩීකරණ පිරියත සඳහා ප්‍රදානය | - | 10% |
| ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය | - | 2.5% |
| පොම්පාගාරය සඳහා ප්‍රදානය | - | 2.5% |
| සේවක වන්දි සඳහාවූ ප්‍රදානය | - | ගෙවූ වන්දි මුදලින් අඩු කෙරේ. |

## 2.20. වත්කම් දුබලතාවයට පත්වීම

### 2.20.1. මූල්‍ය වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලතාවයට පත්ව ඇති බවට විෂය නිශ්‍රිත සාක්ෂි කිසිවක් තිබේදැයි සේවා නියුත්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම රපෝර්තු දිනයකදීම තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලතාවයට පත්ව ඇතැයි සලකනුයේ, අදාළ වත්කම මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුව ඇති (දරා ඇති අලාභ සිද්ධිය) එක් හෝ ඊට වැඩි සිදුවීම් ප්‍රමාණයක ප්‍රතිඵලයක් ලෙස හටගත් එහි දුබලතාව සම්බන්ධයෙන් විෂය නිශ්‍රිත සාක්ෂි කිසිවක් වේ නම් හෝ ඇත්නම් පමණක් සහ එම අලාභදායක සිද්ධිය (හෝ සිද්ධි) විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළහැකි මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහය මත බලපෑමක් ඇතිකරන්නේ නම් පමණි.

කිසියම් මූල්‍ය වත්කමක් දුබලතාවට පත්ව තිබේදැයි යනුවෙන්වූ විෂය නිශ්‍රිත සාක්ෂි සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම රපෝර්තු දිනයකදීම තක්සේරු කර බලයි. මූල්‍ය වත්කමක් දුබලතාවයට පත්ව ඇතැයි සලකනුයේ, අදාළ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් පසුව සිදුව ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ගණනාකවක ප්‍රතිඵලයක් ලෙස අදාළ දුබලතාව සම්බන්ධයෙන්වූ විෂය නිශ්‍රිත සාක්ෂි ඇත්නම් හෝ ඇතිවී තිබුයේ නම් සහ එකී අලාභදායක සිද්ධිය අදාළ මූල්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහය මත බලපෑමක් සිදුව ඇතැයි විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකිනම් පමණි. දුබලතාවය පිළිබඳ සාක්ෂි තුළ ණය ගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම, පොලිය ගෙවීම හෝ මුල් ගෙවීම් පැහැර හැරීම හෝ නොසලකා හැරීම, ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හැකියාව හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධාන යන කරුණුද, පැහැර හැරීම් හා සම්බන්ධ හිඟ මුදල් හි වෙනස්කම් හෝ ආර්ථික තත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුළ දිස්වන කිසියම් ප්‍රමාණාත්මක අඩුවීමක් දත්ත නිරීක්ෂණය අනුව පෙනීයාම යන කරුණුද අන්තර්ගත විය හැකිය.

### 2.20.2. මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වීමේ ලක්ෂණ පහළවී තිබේදැයි යනුවෙන් සැම රපෝර්තු දිනකම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම

දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තු කළඅනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිබු වන බදු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදාගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේද නැතහොත් අඩුවී තිබේද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදීම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකරගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් දුබලතා අලාභය හඳුනා ගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලභ කිසිවක් හඳුනාගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකරගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගුකිරීම් ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

## 2.21. ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

### 2.21.1. මූල්‍ය වත්කම් සහ බැරකම් ප්‍රතිවර්ගීකරණය කිරීම

මේ යටතේ, "අලෙවිය සඳහා තබාගත්" කාණ්ඩවලින් සහ "විකුණුම් සඳහා පවත්නා" කාණ්ඩ තුළට "මූල්‍ය සාධන පත්‍රඃ හඳුනාගැනීම සහ මිනුම්කරණය" යන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 මගින් අවසර දෙන ලද පරිදි වූ කාණ්ඩය නිරූපණය වන අයුරින් ආයතනය විසින් අදාළ ලැයිස්තුගත ඒකක ප්‍රතිවර්ගීකරණය කරන ලදි. පසුගිය වර්ෂ කිහිපය තුළ ආයතනය විසින් කෙටි ලාභ ලබා ගන්නා මෑත කාලීනව සිදුවූ තත්‍ය රටාවක් පිළිබඳව සාක්ෂි කිසිවක් නොවූ හෙයින් මේවා විකුණුම් සඳහා පවත්නා කාණ්ඩය යටතේ ප්‍රතිවර්ගීකරණයට හසු කෙරේ. එම ප්‍රතිවර්ගීකරණ අදාළ ප්‍රතිවර්ගීකරණ දිනයේ පැවති සාධාරණ අගය අනුව සටහන් කරනු ලැබේ.

### 2.21.2. ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනිම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා ඒවා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටුකරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගණුදෙනු කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොළ සාක්ෂි පිළිබඳවද අවධානය යොමු කරයි.

### 2.21.3. මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදාගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. එම කාරණයෙහිලා, එලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී ඒවා වහා උපලබ්ධි කර ගැනීමේ හැකියාවක්ද නොමැති විය හැකිය.

### 2.21.4. දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඒවායේ අවශේෂ වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්නේදැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

### 2.21.5. ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්කර ගැනිම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදී සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කරගෙන ඇත. ඒ හා බැඳි කීර්තිනාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර එලෙස එම කොටස් අත්කරගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාළ අත්කරගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාලසීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟිනු ලැබ ඇත.

මෙම ව්‍යාපාර සංකලනය පිළිබඳ විස්තර පහත දක්වේ.

| | සමූහය | |
|---|---|---|
| | රු. | රු. |
| **පවරන ලද ප්‍රතිෂ්ඨාව** | | |
| **හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද** | | |
| **වටිනාකමෙහි සමානුපාතික කොටස** | - | 470,960,938 |
| | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31,500,000 | |
| සංචිත | 60,534,498 | |
| **කීර්ති නාමය** | | 92,034,498 |
| | | **378,926,440** |

කීර්ති නාමය පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරනු ලැබ තිබූ හෙයින්, සමාලෝචනයට භාජනය වන වසර තුළ ගිණුම් ද්වයම වෙනුවෙන් ගැළපුම් කිසිවක් නොවීය.

## 3. ප්‍රවර්තනවර්ෂ ගැළපුම්

### 3.1. 2017 සාමාජික අරමුදලට කළ ගැළපුම්

| ගැළපුම්හි ස්වභාවය | රු. (000) |
|---|---|
| හිමිකම් නොපෑ ආපසු ගෙවුම් | 119 |
| හරවා යැවූ ප්‍රතිලාභ | 1,399 |
| නොසැසඳු ශේෂය - 147 | 31 |
| නොසැසඳු ශේෂය - 814 | 2 |
| අධි දායකමුදල් ආපසු ගෙවුම් | (5,870) |
| ඉකුත් වර්ෂ දායක මුදල් සඳහා ලාභාංශ සහ පොලී | (990) |
| අධිභාර | (3,767) |
| ඉකුත් වර්ෂ අධිභාර සඳහා ලාභාංශ සහ පොලී | (1,642) |
| | **(10,718)** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 4 | **පොලී ආදායම** | | | | | |
| | විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | | - | - | - | - |
| | පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන | 4.1 | 27,197,738 | 23,442,614 | 27,132,969 | 23,404,664 |
| | ණය සහ ලැබිය යුතු ගිණුම් මත මූල්‍ය ආයෝජනය | 4.2 | 106,145 | 87,686 | 106,145 | 87,686 |
| | | | **27,303,884** | **23,530,300** | **27,239,114** | **23,492,350** |
| 4.1 | **පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | | | | |
| | ස්ථාවර තැන්පත් පොලී | | 3,438,592 | 468,050 | 3,377,384 | 431,390 |
| | ණයකර පොළී | | 244,925 | 195,881 | 244,925 | 195,881 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිලාභ | | 22,585,875 | 22,132,320 | 22,585,875 | 22,132,320 |
| | භාණ්ඩාගාර බිල්පත් ආන්තිකය | | 293,172 | 157,016 | 293,172 | 157,016 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් පොලී | | 345,189 | 202,932 | 345,189 | 202,932 |
| | මුදල් වෙළඳපොළ පොලී | | 1,271 | 1,476 | 1,271 | 1,476 |
| | ආයෝජන කළමනාකරණ ගිණුම් පොලී | | 3,654 | 1,459 | 92 | 170 |
| | විදුලි බල ව්‍යාපෘති බැඳුම්කර පොලී | | 285,060 | 283,479 | 285,060 | 283,479 |
| | | | **27,197,738** | **23,442,614** | **27,132,969** | **23,404,664** |
| 4.2 | **ණය සහ ලැබියයුතු ගිණුම් මත මූල්‍ය ආයෝජන** | | | | | |
| | වියන නිවාස ණය පොලී | | 85,250 | 68,443 | 85,250 | 68,443 |
| | ආපදා ණය පොලී (විශේෂ ණය) | | 550 | 560 | 550 | 560 |
| | වාහන ණය පොලී | | 6,345 | 6,061 | 6,345 | 6,061 |
| | විශේෂ ආපදා ණය පොලී | | 6,452 | 5,917 | 6,452 | 5,917 |
| | විශේෂ උත්සව අත්තිකාරම් පොලී | | 130 | 137 | 130 | 137 |
| | විශේෂ අත්තිකාරම් පොලී | | 726 | 416 | 726 | 416 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොලී | | 6,671 | 6,077 | 6,671 | 6,077 |
| | ක්‍රීඩා සමිති ණය පොලී | | 21 | 74 | 21 | 74 |
| | | | **106,145** | **87,686** | **106,145** | **87,686** |
| 5 | **ශුද්ධ වෙළඳ ආදායම** | | | | | |
| | ශුද්ධ ආදායම | 5.1 | 1,464,768 | 1,902,126 | - | - |
| | (-) විකුණුම් පිරිවැය | | (898,398) | (787,898) | - | - |
| | | | **566,370** | **1,114,228** | **-** | **-** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| | | සටහන | සමූහය 2017 Rs. '000 | සමූහය 2016 Rs. '000 | මණ්ඩලය 2017 Rs. '000 | මණ්ඩලය 2016 ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
|---|---|---|---|---|---|---|
| 5.1 | **ශුද්ධ ආදායම** | | | | | |
| | දළ ආදායම | | 1,719,765 | 2,182,064 | - | - |
| | (-) එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද | | (254,998) | (279,938) | - | - |
| | | | **1,464,768** | **1,902,126** | **-** | **-** |
| 6 | **ලාභාංශ ආදායම** | | | | | |
| | විකිණීම සඳහා රඳවාගත් ආයෝජන | 6.1 | 366,376 | 298,007 | 366,376 | 298,007 |
| | විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 6.2 | 7,363 | 188,188 | 7,363 | 188,188 |
| | | | **373,739** | **486,194** | **373,739** | **486,194** |
| 6.1 | **විකිණීම සඳහා රඳවාගත් ආයෝජන** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ | | 357,939 | 289,059 | 357,939 | 289,059 |
| | මිල ප්‍රකාශිත ඒකක මත ලාභාංශ | | 8,437 | 8,948 | 8,437 | 8,948 |
| | | | **366,376** | **298,007** | **366,376** | **298,007** |
| 6.2 | **විකිණීමට ඇති ආයෝජන** | | | | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් මත ලාභාංශ | | 7,363 | 188,188 | 7,363 | 188,188 |
| | | | **7,363** | **188,188** | **7,363** | **188,188** |
| 7 | **ලාභ හෝ ලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ)** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | | 78,141 | 27,166 | 78,141 | 27,166 |
| | දිගු කාලීන කොටස් විකුණුම් ලාභ/ (අලාභ) | | 377,836 | 32,835 | 377,836 | 32,835 |
| | කොටස් සංචිතය මත උපලබ්ධි වූ ලාභ | | 150,881 | 15,395 | 150,881 | 15,395 |
| | ඒකක මත සාධාරණ වටිනාකම ගැළපීම | | - | - | - | - |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැළපීම | | (71,513) | (6,804) | (71,513) | (6,804) |
| | | | **535,345** | **68,592** | **535,345** | **68,592** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 8 | **අනෙකුත් ආදායම්** | | | | | |
| | දේපළ ආදායම් - බදු කුලිය | | 2,645 | 3,255 | 2,645 | 3,255 |
| | ලද කුලී | | 418 | 386 | - | - |
| | දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | | (3,097) | 107 | (2,347) | 6 |
| | අධිභාර | | 348,229 | 235,477 | 348,229 | 235,477 |
| | කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් ආදායම | | 28,582 | 23,777 | 28,582 | 23,777 |
| | කාර්ය මණ්ඩල ණය ආදායම | | 31,645 | 31,409 | 30,323 | 29,271 |
| | විවිධ ආදායම් | | 5,363 | 4,015 | 834 | 1,237 |
| | පරිත්‍යාග - භාණ්ඩාගාර දීමනා | | - | 10,000 | - | 10,000 |
| | නවම් මාවතේ රථ ගාලේ ලාභ/(අලාභ) | | 34,551 | 31,443 | 34,551 | 31,443 |
| | නිවාඩු නිකේතන ලාභ/(අලාභ) | | (3,415) | (2,817) | (3,415) | (2,817) |
| | යලි නොගෙවන රැඳවුම් තැන්පතු - සැපයුම් කරුවන් ලියා පදිංචි කිරීම | | 934 | 241 | - | - |
| | ප්‍රදාන ක්‍රමක්ෂය | | 2,520 | 3,217 | - | - |
| | ආයෝජන දේපළ ප්‍රත්‍යාගණන ලාභ | | 412,500 | 200,000 | 412,500 | 200,000 |
| | | | **860,876** | **540,511** | **851,903** | **531,650** |
| 9 | **සේවක මණ්ඩල වියදම්** | | | | | |
| | වැටුප් සහ වේතන | 9.1 | 629,323 | 588,117 | 576,990 | 548,210 |
| | කෙටි කාලීන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ | 9.2 | 409,809 | 354,109 | 353,408 | 330,278 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | 9.3 | 38,325 | 34,784 | 32,832 | 30,212 |
| | අනෙකුත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ | 9.4 | 97,384 | 82,402 | 90,380 | 77,263 |
| | | | **1,174,842** | **1,059,412** | **1,053,611** | **985,963** |
| 9.1 | **වැටුප් සහ වේතන** | | | | | |
| | වැටුප් | | 500,419 | 473,055 | 452,587 | 436,742 |
| | අධ්‍යක්ෂ ගාස්තු | | 3,005 | 2,260 | 990 | 850 |
| | ජීවන වියදම් දීමනා | | 87,736 | 84,741 | 87,736 | 84,741 |
| | අතිකාල | | 24,725 | 18,496 | 22,238 | 16,312 |
| | නිවාඩු දින ගෙවීම් | | 13,439 | 9,565 | 13,439 | 9,565 |
| | | | **629,323** | **588,117** | **576,990** | **548,210** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 9.2 | **කෙටි කාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ** | | | | | |
| | පුහුණු කිරීම් හා සංවර්ධන වියදම් | | 5,891 | 4,164 | 5,891 | 4,164 |
| | බඳවා ගැනීමේ වියදම් | | 1,037 | 528 | 1,037 | 528 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | | 31,587 | 27,206 | 27,612 | 27,050 |
| | දිරි දීමනා | | 125,249 | 95,206 | 93,165 | 88,862 |
| | විදේශ පුහුණු | | 2,358 | 3,220 | 2,358 | 3,220 |
| | ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් | | 13,707 | 12,425 | 13,707 | 12,425 |
| | ප්‍රසාද දීමනා | | 106,857 | 100,072 | 87,491 | 83,778 |
| | වෛද්‍යාධාර වියදම් ප්‍රතිපූර්ණය | | 76,177 | 65,180 | 75,199 | 64,144 |
| | කාර්ය මණ්ඩල ණය පිරිවැය | | 30,323 | 29,271 | 30,323 | 29,271 |
| | නිවාස ණය පොලී | | 16,625 | 16,783 | 16,625 | 16,783 |
| | සේවක අනතුරු වන්දි ගෙවීම් යෝජනා ක්‍රමය | | - | 53 | - | 53 |
| | | | **409,809** | **354,109** | **353,408** | **330,278** |
| 9.3 | **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්** | | | | | |
| | පොලී පිරිවැය | | 22,286 | 21,239 | 22,286 | 21,239 |
| | ප්‍රවර්තන සේවා පිරිවැය | | 16,039 | 13,545 | 10,546 | 8,973 |
| | | | **38,325** | **34,784** | **32,832** | **30,212** |
| 9.4 | **අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ** | | | | | |
| | සේ. අ. අ. මණ්ඩලීය දායකය | | 81,407 | 68,853 | 75,317 | 64,385 |
| | සේ. නි. භා. අ. මණ්ඩලීය දායකය | | 15,977 | 13,548 | 15,063 | 12,878 |
| | | | **97,384** | **82,402** | **90,380** | **77,263** |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 10 | **පරිපාලන වියදම්** | | | | |
| | ගොඩනැගිලි කුලී | 68,660 | 57,131 | 59,183 | 48,140 |
| | වරිපනම් බදු | 9,769 | 1,398 | 755 | 805 |
| | විදුලිය ගාස්තු | 18,584 | 18,472 | 18,584 | 18,472 |
| | දුරකථන ගාස්තු | 11,411 | 9,103 | 10,930 | 9,103 |
| | ජල ගාස්තු | 1,470 | 1,460 | 1,470 | 1,460 |
| | උපදේශක ගාස්තු | 3,231 | 1,861 | 1,064 | 763 |
| | විගණන ගාස්තු | 955 | 1,164 | 427 | 603 |
| | ආරක්ෂක ගාස්තු | 10,837 | 7,596 | 10,837 | 7,596 |
| | නීති ගාස්තු | 579 | 1,222 | 579 | 1,222 |
| | කුලී වියදම් | 9,953 | 7,482 | 8,112 | 5,872 |
| | ලේකම් ගාස්තු | 120 | 120 | 120 | 120 |
| | තැපැල් හා විදුලි පණිවුඩ - පරිපාලන | 1,941 | 2,209 | 1,941 | 2,209 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - පරිපාලන | 640 | 635 | 640 | 635 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ - පරිපාලන | 2,786 | 2,400 | 2,093 | 1,895 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය - පරිපාලන | 26,746 | 351 | 537 | 272 |
| | තොරතුරු තාක්ෂණ වියදම් - පරිපාලන | 1,306 | 1,206 | 1,306 | 1,206 |
| | පුවත්පත් දැන්වීම් සහ වෙළඳ දැන්වීම් | 6,851 | 2,182 | 6,851 | 2,182 |
| | වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | 2,275 | 2,459 | 2,275 | 2,459 |
| | පුවත්පත් හා වාර සඟරා | 838 | 610 | 838 | 610 |
| | පරිත්‍යාග | 1,957 | 859 | - | 50 |
| | විනය පරීක්ෂණ | 83 | 316 | 83 | 316 |
| | අනෙකුත් රක්ෂණ | 3 | - | 3 | - |
| | කාර්යාලීය නඩත්තු සහ අවශ්‍යතා | 519 | 657 | 519 | 657 |
| | සේවක වන්දි | 73 | - | 73 | - |
| | මුද්දර බදු | 166 | 103 | 166 | 103 |
| | විවිධ වියදම් | 13,389 | 9,630 | 5,673 | 3,623 |
| | තක්සේරු ගාස්තු | 4,083 | - | 4,083 | - |
| | වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 8,354 | 9,723 | 7,964 | 9,623 |
| | ඉන්ධන වියදම් | 12,520 | 10,896 | 10,155 | 10,608 |
| | ගොඩනැගිලි නඩත්තුව | 7,987 | 8,172 | 7,684 | 8,172 |
| | මණ්ඩල සංවත්සර වියදම් | - | 3,068 | - | 3,068 |
| | යන්ත්‍ර සූත්‍ර, ලී බඩු හා උපකරණ නඩත්තුව | 4,423 | 2,098 | 2,864 | 2,044 |
| | | **232,510** | **164,581** | **167,809** | **143,887** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 11 | **මූල්‍ය වියදම්** | | | | | |
| | ආයෝජන කළමනාකරණ ගාස්තු | | 375 | 352 | 375 | 352 |
| | බැංකු ගාස්තු | | 2,203 | 2,907 | 2,026 | 2,542 |
| | පොලී වියදම් | | 8,951 | 4,699 | - | - |
| | ලියා හරින ලද ප්‍රතිලාභ මුද්‍රාහැරීම් | | - | 9 | - | 9 |
| | | | **11,529** | **7,967** | **2,401** | **2,904** |
| 12 | **සාමාජික වියදම්** | | | | | |
| | සාමාජික ප්‍රතිලාභ | 12.1 | 397,835 | 393,349 | 397,835 | 393,349 |
| | සාමාජික සේවා | 12.2 | 44,785 | 45,261 | 44,785 | 45,261 |
| | තොරතුරු තාක්ෂණික සේවා | 12.3 | 17,983 | 15,856 | 17,983 | 15,856 |
| | | | **460,603** | **454,466** | **460,603** | **454,466** |
| 12.1 | **සාමාජික ප්‍රතිලාභ** | | | | | |
| | මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | 110,836 | 97,518 | 110,836 | 97,518 |
| | නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය | | 7,937 | 8,598 | 7,937 | 8,598 |
| | අභ්‍යන්තර අක්ෂිකාච සවිකිරීමේ යෝජනා ක්‍රමය | | 5,019 | 4,293 | 5,019 | 4,293 |
| | ශ්‍රමසුව රැකවරණ යෝජනා ක්‍රමය | | 11,501 | 13,558 | 11,501 | 13,558 |
| | හෘද සැත්කම් යෝජනා ක්‍රමය | | 140,625 | 171,420 | 140,625 | 171,420 |
| | වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් යෝජනා ක්‍රමය | | 3,695 | 3,926 | 3,695 | 3,926 |
| | 5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | | 82,410 | 67,898 | 82,410 | 67,898 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | | 35,812 | 26,136 | 35,812 | 26,136 |
| | | | **397,835** | **393,349** | **397,835** | **393,349** |
| 12.2 | **සාමාජික සේවා** | | | | | |
| | තැපැල් හා විදුලි පණිවුඩ - සාමාජික | | 18,167 | 19,106 | 18,167 | 19,106 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ - සාමාජික | | 14,994 | 13,807 | 14,994 | 13,807 |
| | පරිගණක ලිපිද්‍රව්‍ය | | 3,857 | 3,782 | 3,857 | 3,782 |
| | ස්වයංරැකියා ප්‍රවර්ධන වියදම් | | 24 | 4 | 24 | 4 |
| | සාමාජික ආශ්‍රිත වියදම් | | 303 | 357 | 303 | 357 |
| | සේවකයින් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය | | 304 | 445 | 304 | 445 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - සාමාජික | | 5,309 | 4,830 | 5,309 | 4,830 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය - සාමාජික | | 703 | 755 | 703 | 755 |
| | සාමාජිකයින් සඳහා වෛද්‍ය උපදේශන ගාස්තු | | 13 | 42 | 13 | 42 |
| | ශිෂ්‍යත්ව පිරිනැමීමේ වියදම් | | 1,112 | 2,134 | 1,112 | 2,134 |
| | | | **44,785** | **45,261** | **44,785** | **45,261** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 12.3 | **තොරතුරු තාක්ෂණික සේවා** | | | | | |
| | දෘඩකාංග නඩත්තුව | | 4,729 | 4,292 | 4,729 | 4,292 |
| | මෘදුකාංග නඩත්තුව | | 483 | 526 | 483 | 526 |
| | ක්ෂයවීම් - තොරතුරු තාක්ෂණ | | 6,433 | 5,658 | 6,433 | 5,658 |
| | රක්ෂණය - තොරතුරු තාක්ෂණ | | 148 | 29 | 148 | 29 |
| | රැහැන් බදු කුලී | | 6,191 | 5,351 | 6,191 | 5,351 |
| | | | **17,983** | **15,856** | **17,983** | **15,856** |
| 13 | **ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය** | | | | | |
| | දේපළ, පිරියත හා උපකරණ ක්ෂවීම් | | 30,916 | 35,778 | 14,196 | 15,290 |
| | කල්බදු ඉඩම් හා සංවර්ධන කටයුතු ප්‍රාග්ධනීකරණය කිරීම් | | 30,349 | 4,882 | - | - |
| | ජෛවීය වත්කම් මත ක්ෂ්‍ය වීම්/ ක්‍රමක්ෂය | | 357 | - | - | - |
| | | | **61,622** | **40,660** | **14,196** | **15,290** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 14 | **ආදායම් බදු වියදම්** | | **2,779,214** | **2,733,111** | **2,705,842** | **2,394,498** |
| 14.1 | **ආදායම් බදු - සේනිභා අරමුදල් මණ්ඩලය** | | | | | |
| | මුදල් වෙළඳපොළ ආදායම | | 109 | 132 | 109 | 132 |
| | කොටස් ලාභාංශ | | 13,986 | 32,770 | 13,986 | 32,770 |
| | ණයකර | | 1,083 | 2,699 | 1,083 | 2,699 |
| | විදුලිබල ව්‍යාපෘති බැඳුම්කර | | 28,506 | 28,348 | 28,506 | 28,348 |
| | ස්ථාවර තැන්පතු | | 287,854 | 43,139 | 287,854 | 43,139 |
| | භාණ්ඩාගාර බිල්පත් | | 29,317 | 15,702 | 29,317 | 15,702 |
| | භාණ්ඩාගාර බැඳුම්කර | | 2,258,587 | 2,213,232 | 2,258,587 | 2,213,232 |
| | රුපියල් ණය | | - | - | - | - |
| | ප්‍රතිමිලදී ගැනීම් | | 34,518 | 20,293 | 34,518 | 20,293 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | 5 | 6 | 5 | 6 |
| | කඩිනම් ප්‍රතිලාභ ආදායම | | 2,858 | 2,378 | 2,858 | 2,378 |
| | වියන නිවාස ණය පොලී | | 8,525 | 6,844 | 8,525 | 6,844 |
| | දේපළ ආදායම් - බදු කුලී | | 264 | 326 | 264 | 326 |
| | අධිභාර | | 34,588 | 23,279 | 34,588 | 23,279 |
| | අධිභාර ලේඛණ 11 | | 235 | 269 | 235 | 269 |
| | ආපදා ණය පොලී (විශේෂ ණය) | | 55 | 56 | 55 | 56 |
| | වාහන ණය පොලී | | 635 | 606 | 635 | 606 |
| | විශේෂ ආපදා ණය පොලී | | 645 | 592 | 645 | 592 |
| | විශේෂ උත්සව ණය පොලී | | 13 | 14 | 13 | 14 |
| | විශේෂ අත්තිකාරම් පොලී | | 73 | 42 | 73 | 42 |
| | පරිගණක ණය පොලී | | - | - | - | - |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | 662 | 601 | 662 | 601 |
| | ක්‍රීඩා සමිති ණය පොලී | | 2 | 7 | 2 | 7 |
| | විවිධ ආදායම් | | 83 | 124 | 83 | 124 |
| | රථ ගාලේ හා නිවාඩු නිකේතයේ ලාභ/(අලාභ) | | 3,238 | 3,041 | 3,238 | 3,041 |
| | | | **2,705,842** | **2,394,498** | **2,705,842** | **2,394,498** |
| 14.2 | **අදායම් බදු - ලංකා ලුණු සමාගම** | | | | | |
| | ප්‍රවර්ධන ආදායම් බදු | | 95,281 | 198,882 | 95,281 | 198,882 |
| | පෙර වර්ෂයේ ප්‍රවර්ධන ආදායම් බදු ඌණ වෙන්කිරීම් | | (1,172) | - | (1,172) | - |
| | විලම්බිත ආදායම් බදු | | - | - | - | - |
| | විලම්බිත බදු වියදම/ (ප්‍රත්‍යාවර්තනය) | | (20,737) | 139,732 | (20,737) | 139,732 |
| | ආදායම් ප්‍රකශයේ වර්තාවූ ආදායම් බදු වියදම | | 73,372 | 338,613 | 73,372 | 338,613 |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 15 | **විකිණීම සඳහා රඳවාගත් අනෙකුත් මූල්‍ය වත්කම්** | | | | |
| | මිළ ප්‍රකාශිත කොටස් ආයෝජනය (විකිණීම පිණිස) | 2,511,005 | 1,955,837 | 2,511,005 | 1,955,837 |
| | අඩු කළා: මිල ප්‍රකාශිත කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | - | - | - | - |
| | | **2,511,005** | **1,955,837** | **2,511,005** | **1,955,837** |
| 16 | **පරිපාලිතයන්හි ආයෝජන** | | | | |
| | ලංකා ලුණු සමාගම | - | - | 470,961 | 470,961 |
| | | **-** | **-** | **470,961** | **470,961** |
| 17 | **විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන** | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් ආයෝජන (දිගු කාලීන) | 7,386,330 | 8,788,639 | 7,386,330 | 8,788,639 |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් ආයෝජන | 133,044 | 89,992 | 133,044 | 89,992 |
| | මිළ ප්‍රකාශිත ඒකක | 339,370 | 330,886 | 339,370 | 330,886 |
| | පොරොන්දු නෝට්ටු | 12,174 | 12,174 | 12,174 | 12,174 |
| | ලැයිස්තුවෙන් ඉවත් කළ සහ ඈවරකරණයට යටත් කොටස් | 25,228 | 25,228 | 25,228 | 25,228 |
| | අඩු කළා : කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | (25,228) | (25,228) | (25,228) | (25,228) |
| | පොරොන්දු නෝට්ටු හානිකරණය | (12,174) | (12,174) | (12,174) | (12,174) |
| | කොටස් හිමිකම් ආයෝජන හානිකරණය | (13,050) | (283) | (13,050) | (283) |
| | | **7,845,694** | **9,209,233** | **7,845,694** | **9,209,233** |

**17.1 අලෙවිය සඳහා නොතැබෙන කොටස් හිමිකම් ආයෝජන මත හානිකරණය**

අලෙවිය සඳහා නොවන කොටස් හිමිකම් ආයෝජනයන්හි සැලකිය යුත දීර්ඝ කාලීන අගය හීනවීම් හඳුනා ගැනීම සඳහා කලින් කල ඇගයීම් කරනු ලැබේ. මේ සඳහා කළමනාකරණය විසින් හානිකරණයන් පිළිබඳව සාක්ෂි සලකා බලන අතර, එය හුදෙක් වෙළඳපොළ අගය අඩුවීම පමණක් නොව ගුණාත්මක හා නෛසර්ගික වටිනාකම්වල ද ඇගයීමකි. ඒ අනුව සැලකිය යුතු හෝ දිගු කාලීන වටිනාකමේ අඩුවීමක් පිළිබඳ සාක්ෂි හමුවීම හා එවැනි වටිනාකම් අඩුවීමක් ආපසු හැරවීමේ සාධාරණ හැකියාවක් නොමැති කල්හි එකී කොටස් හිමිකම් ආයෝජනයන්හි (රුපියල් 13,049,962) සඳහා හානිකරණ ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ තිබේ. එවැනි ප්‍රතිපාදන ලාභ හෝ අලාභ ගිණුම් හරහා ගළපනු ලබයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | **පරිනතවීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | | | |
| | භාණ්ඩාගාර බැඳුම්කර | 205,239,775 | 196,302,449 | 205,239,775 | 196,302,449 |
| | භාණ්ඩාගාර බිල්පත් | - | 3,624,832 | - | 3,624,832 |
| | මිල ප්‍රකාශිත ණයකර | 2,289,134 | 2,194,114 | 2,289,134 | 2,194,114 |
| | අඩුකළා : මිල ප්‍රකාශිත ණයකර හානිකරණය | (7,450) | (7,450) | (7,450) | (7,450) |
| | ස්ථාවර තැන්පත් | 38,347,443 | 15,783,095 | 38,100,000 | 15,127,000 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | 2,940,528 | 2,846,294 | 2,940,528 | 2,846,294 |
| | මිල ප්‍රකාශිත නොවූ ණයකර | - | - | - | - |
| | බැඳුම්කර - විදුලිබල යෝජනා ක්‍රමය | 2,054,906 | 2,367,270 | 2,054,906 | 2,367,270 |
| | | **250,864,335** | **223,110,604** | **250,616,892** | **222,454,509** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 19 | **ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම්** | | | | | |
| | නිවාස මූල්‍ය ණය - ජාතික සංවර්ධන බැංකුව | | 1,010,922 | 642,046 | 1,010,922 | 642,046 |
| | කාර්ය මණ්ඩල ණය | | | | | |
| | ආපදා ණය (විශේෂ ණය) | | 15,162 | 13,723 | 15,162 | 13,723 |
| | විශේෂ ආපදා ණය | | 207,155 | 176,103 | 207,155 | 176,103 |
| | උත්සව අත්තිකාරම් | | 559 | 571 | 559 | 571 |
| | විශේෂ උත්සව අත්තිකාරම් | | 817 | 849 | 817 | 849 |
| | විශේෂ අත්තිකාරම් | | 9,241 | 17,216 | 3,477 | 3,275 |
| | වාහන ණය | | 181,431 | 167,925 | 181,431 | 167,925 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | 358,366 | 339,383 | 358,366 | 339,383 |
| | ණය - ගංවතුර සහනාධාර | | 4,452 | - | 4,452 | - |
| | | | **1,788,104** | **1,357,817** | **1,782,340** | **1,343,876** |
| | | | | | | |
| 20 | **අනෙකුත් වත්කම්** | | | | | |
| | උපචිත ආදායම් | 20.1 | 8,851,491 | 7,015,577 | 8,851,491 | 7,015,577 |
| | ලැබිය යුතු ගිණුම් හා පූර්ව ගෙවීම් | 20.2 | 2,154,484 | 2,157,048 | 2,132,655 | 2,123,869 |
| | අයකරගත යුතු බදු | 20.3 | 88,645 | 127,986 | 60,816 | 98,235 |
| | තොග | 20.4 | 825,949 | 321,077 | 5,084 | 6,512 |
| | | | **11,920,568** | **9,621,688** | **11,050,045** | **9,244,193** |
| | | | | | | |
| 20.1 | **උපචිත ආදායම්** | | | | | |
| | ලැබිය යුතු පොළී | | 8,879,356 | 7,043,442 | 8,879,356 | 7,043,442 |
| | අඩු කළා : අඩමාන ආදායම් සඳහා ප්‍රතිපාදන | | (27,866) | (27,866) | (27,866) | (27,866) |
| | | | **8,851,491** | **7,015,577** | **8,851,491** | **7,015,577** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 20.2 | **ලැබිය යුතු ගිණුම් සහ පූර්ව ගෙවීම්** | | | | | |
| | ලැබිය යුතු දායක මුදල් | | 1,946,870 | 1,806,052 | 1,946,870 | 1,806,052 |
| | වෙළඳ ණය ගැතියෝ | | 8,676 | 7,561 | - | - |
| | මුදල් ඇණවුම් පාලන ගිණුම | | 5,537 | 5,385 | 5,537 | 5,385 |
| | තැපැල් මුද්‍රා යන්ත්‍ර අග්‍රිමය | | 479 | 772 | 479 | 772 |
| | විවිධ ණයගැතියෝ | | 36,633 | 177,052 | 36,633 | 177,052 |
| | පෙර සේවකයින්ගෙන් අයවිය යුතු මුදල් | | 1,522 | 1,913 | 1,522 | 1,913 |
| | ආරක්ෂිත තැන්පතු | | 4,964 | 4,039 | 4,964 | 4,039 |
| | පූර්ව ගෙවීම් | | 9,399 | 7,155 | 9,399 | 7,155 |
| | කාර්ය මණ්ඩල ණය පෙර ගෙවුම් පිරිවැය | | 124,461 | 119,273 | 124,461 | 119,273 |
| | අත්තිකාරම් ගෙවීම් | | 15,943 | 27,347 | 2,791 | 1,729 |
| | ණය - ක්‍රීඩා සමාජය | | - | 499 | - | 499 |
| | | | **2,154,484** | **2,157,048** | **2,132,655** | **2,123,869** |
| 20.3 | **අයවිය යුතු බදු - සේ. නි. භා. අ. මණ්ඩලය** | | | | | |
| | අයකර ගතයුතු බදු | | | | | |
| | කල් තියා ගෙවූ ආදායම් බදු අත්තිකාරම් | | 88,645 | 127,986 | 60,816 | 98,235 |
| | | | **88,645** | **127,986** | **60,816** | **98,235** |
| 20.4 | **වට්ටෝරු භාණ්ඩ** | | | | | |
| | සාමාන්‍ය ලුණු තොග | | 740,964 | 242,991 | - | - |
| | අයඩිනීකරණය කළ තොග | | 1,724 | 3,482 | - | - |
| | නොනිමි තොග | | 26,935 | 23,604 | - | - |
| | පරිභෝජන භාණ්ඩ හා අමතර කොටස් | | 51,241 | 44,489 | - | - |
| | අඩු කළා: | | - | - | - | - |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ ද්‍රව්‍ය | | 3,602 | 5,030 | 3,602 | 5,030 |
| | පුස්තකාල | | 172 | 172 | 172 | 172 |
| | නිවාඩු නිකේතන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | | 1,310 | 1,310 | 1,310 | 1,310 |
| | | | **825,949** | **321,077** | **5,084** | **6,512** |

21 දේපළ, පිරියත සහ උපකරණ

21.1 සමූහය

රු '000

| | ඉඩම් | ගොඩනැගිලි | බදු අයිතිය මත ගොඩනැගිලි | යන්ත්‍ර උපකරණ | මොටර් වාහන | කල්බදු කළ මොටර් වාහන | ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | පරිගණක උපාංග | උපකරණ | භාරකාර සේවා වත්කම් - නොමේරූ වගාවන් | භාරකාර සේවා වත්කම් - මේරූ වගාවන් | සංවර්ධන කාර්යයන් | ඉදිරියට කරගෙන යන ඉදිකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | | | | | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 37,380 | 581,810 | 171,890 | 210,049 | 19,538 | 109,283 | 144,087 | 33,029 | 14,128 | 17,841 | 38,130 | 24,246 | 1,421,412 |
| එකතු කිරීම් | - | 2,139 | 6,374 | 66,092 | 31,253 | 10,318 | 14,755 | 13,276 | 3,811 | - | - | 129,805 | 172,767 | 450,591 |
| ගැළපීම් | - | - | - | (26) | (779) | - | (2,208) | (254) | - | - | - | - | (1,230) | (4,497) |
| අපහරණයන් | - | - | - | - | - | - | (73) | (2,278) | - | - | - | - | - | (2,351) |
| හානිකරණයන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | (169,384) | (169,384) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 39,519 | 588,185 | 237,956 | 240,523 | 29,856 | 121,757 | 154,831 | 36,840 | 14,128 | 17,841 | 167,935 | 26,400 | 1,695,772 |
| | | | | | | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 39,519 | 588,185 | 237,956 | 240,523 | 29,856 | 121,757 | 154,831 | 36,840 | 14,128 | 17,841 | 167,935 | 26,400 | 1,695,772 |
| එකතු කිරීම් | - | - | 7,470 | 23,530 | 15,652 | - | 20,696 | 14,329 | 2,460 | - | - | 106,284 | 113,636 | 304,057 |
| අපහරණයන් | - | - | (477) | (961) | (377) | - | (7,015) | (12,965) | (315) | - | - | - | - | (22,110) |
| ගැළපීම් | - | - | - | - | - | - | (12) | - | - | - | - | - | - | (12) |
| හානිකරණයන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | (106,284) | (106,284) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 39,519 | 595,178 | 260,525 | 255,799 | 29,856 | 135,425 | 156,195 | 38,985 | 14,128 | 17,841 | 274,219 | 33,752 | 1,871,423 |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

| | ඉඩම් | ගොඩනැගිලි | බදු අයිතිය මත ගොඩනැගිලි | යන්ත්‍ර උපකරණ | මොටර් වාහන | කල්බදු කළ මොටර් වාහන | ලිබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | පරිගණක උපාංග | උපකරණ | භාරකාර සේව වත්කම් | | සංවර්ධන කාර්යයන් | ඉදිරියට කරගෙන යන ඉදිකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | නොමේරූ වගාවන් | මේරූ වගාවන් | | | |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | | | | | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | - | 3,188 | 76,560 | 75,285 | 152,164 | 1,109 | 69,260 | 89,266 | 19,459 | - | 357 | 38,130 | - | 524,777 |
| මාසය සඳහා වූ ක්ෂය අය කිරීම් | - | 2,285 | 14,551 | 17,277 | 15,005 | 3,641 | 7,422 | 7,026 | 3,050 | - | - | 4,185 | - | 74,441 |
| අපහරණයන් | - | - | - | (26) | (776) | - | (2,016) | (2,348) | - | - | - | - | - | (5,166) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 5,472 | 91,111 | 92,535 | 166,394 | 4,750 | 74,666 | 93,944 | 22,509 | - | 357 | 42,314 | - | 594,053 |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | - | 5,472 | 91,111 | 92,535 | 166,394 | 4,750 | 74,666 | 93,945 | 22,509 | - | 357 | 42,314 | - | 594,053 |
| මාසය සඳහා වූ ක්ෂය අය කිරීම් | - | 2,220 | 14,713 | 23,387 | 16,529 | 2,986 | 10,265 | 7,988 | 2,967 | - | 357 | 29,652 | - | 111,064 |
| අපහරණයන් | - | - | (86) | (796) | (237) | - | (5,727) | (11,423) | (236) | - | - | - | - | (18,504) |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 7,692 | 105,738 | 115,127 | 182,686 | 7,735 | 79,204 | 90,510 | 25,241 | - | 714 | 71,967 | - | 686,613 |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | | | | | | | |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 34,193 | 505,250 | 96,606 | 57,884 | 18,429 | 40,023 | 54,821 | 13,570 | 14,128 | 17,484 | (0) | 24,246 | 896,635 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 34,047 | 497,074 | 145,421 | 74,130 | 25,106 | 47,091 | 60,887 | 14,331 | 14,128 | 17,484 | 125,620 | 26,400 | 1,101,719 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 31,827 | 489,439 | 145,399 | 73,113 | 22,121 | 56,221 | 65,685 | 13,744 | 14,128 | 17,128 | 202,252 | 33,752 | 1,184,809 |

21 **දේපළ, පිරියත සහ උපකරණ**

| 21.2 | සමාගම | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් වාහන | ලිබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | පරිගණක උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | **පිරිවැය** | | | | | | |
| | **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 37,380 | 130,390 | 88,430 | 144,087 | 420,288 |
| | එකතු කිරීම් | - | 2,139 | - | 10,940 | 13,276 | 26,355 |
| | ගැළපීම් | - | - | - | - | - | - |
| | අපහරණයන් | - | - | - | (2,185) | (254) | (2,439) |
| | ප්‍රත්‍යාගණනයන් | - | - | - | (73) | (2,278) | (2,351) |
| | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 39,519 | 130,390 | 97,112 | 154,831 | 441,853 |
| | | | | | | | |
| | **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 39,519 | 130,390 | 97,112 | 154,831 | 441,853 |
| | එකතු කිරීම් | - | - | - | 7,777 | 14,329 | 22,106 |
| | ගැළපීම් | - | - | - | (5,818) | (12,965) | (18,784) |
| | අපහරණයන් | - | - | - | (12) | - | (12) |
| | ප්‍රත්‍යාගණනයන් | | | | | | - |
| | **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 39,519 | 130,390 | 99,058 | 156,195 | 445,163 |
| | | | | | | | |
| | **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | |
| | **2016 ජනවාරි 01 දිනට ශේෂය** | - | 3,188 | 96,742 | 57,947 | 89,267 | 247,144 |
| | වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,285 | 7,498 | 5,876 | 7,026 | 22,685 |
| | අපහරණයන් | - | - | - | (2,006) | (2,348) | (4,354) |
| | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 5,472 | 104,240 | 61,817 | 93,945 | 265,475 |
| | | | | | | | |
| | **2017 ජනවාරි 01 දිනට ශේෂය** | - | 5,472 | 104,240 | 61,817 | 93,945 | 265,475 |
| | වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,220 | 5,824 | 6,284 | 7,988 | 22,316 |
| | අපහරණයන් | - | - | - | (4,790) | (11,423) | (16,213) |
| | **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 7,692 | 110,065 | 63,310 | 90,510 | 271,577 |
| | | | | | | | |
| | **ශුද්ධ පොත් අගය** | | | | | | |
| | **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 34,193 | 33,648 | 30,483 | 54,820 | 173,144 |
| | | | | | | | |
| | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 34,047 | 26,150 | 35,295 | 60,887 | 176,378 |
| | | | | | | | |
| | **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 20,000 | 31,827 | 20,326 | 35,748 | 65,685 | 173,586 |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 22 | **කල්බදු කළ දේපළ** | | | | | |
| | **පිරිවැය** | | | | | |
| | ජනවාරි 01 දිනට | | 20,910 | 20,910 | - | - |
| | එකතු කිරීම් | | - | - | - | - |
| | **දෙසැම්බර් 31 දිනට** | | **20,910** | **20,910** | **-** | **-** |
| | | | | | | |
| | **සම්මුච්චිත ක්‍රමක්ෂය** | | | | | |
| | **ජනවාරි 01 දිනට ශේෂය** | | | | | |
| | වර්ෂය සඳහා අයවීම් | | 15,334 | 14,637 | - | - |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | 697 | 697 | - | - |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **16,031** | **15,334** | **-** | **-** |
| | | | | | | |
| | **දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | | **4,879** | **5,576** | **-** | **-** |
| | | | | | | |
| 23 | **අස්පෘෂ්‍ය වත්කම්** | | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | 192 | 266 | 192 | 266 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය | | (53) | (74) | (53) | (74) |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **140** | **192** | **140** | **192** |
| | | | | | | |
| 24 | **ආයෝජන දේපළ** | | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | 3,400,000 | 3,200,000 | 3,400,000 | 3,200,000 |
| | සාධාරණ අගයේ වෙනස්කම් | | 412,500 | 200,000 | 412,500 | 200,000 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **3,812,500** | **3,400,000** | **3,812,500** | **3,400,000** |

## 25 පොලී දරන ණය ගැනුම්

**ලංකා ලුණු සමාගම**

| | | 2017 දෙසැම්බර් 31 දිනට | | | 2016 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල (රු. '000) | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල (රු. '000) | එකතුව (රු. '000) | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල (රු. '000) | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල (රු. '000) | එකතුව (රු. '000) |
| බැංකු ණය | 25.1 | - | - | - | 7,260 | - | 7,260 |
| මූල්‍ය කල්බදු | | 5,157 | 7,221 | 12,378 | 5,157 | 12,378 | 17,535 |
| බැංකු අයිරාව | | 170,667 | - | 170,667 | 202,329 | - | 202,329 |
| | | **175,824** | **7,221** | **183,045** | **214,746** | **12,378** | **227,124** |

## 25.1 බැංකු ණය

| | 2017.01.01 දිනට රු. '000 | ලබාගත් ණය රු. '000 | නැවත ගෙවීම් රු. '000 | 2017.12.31 දිනට රු. '000 |
|---|---|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව පීඑල්සී | 7,260 | - | 7,260 | - |
| ලංකා බැංකුව | - | - | - | - |
| | **7,260** | **-** | **7,260** | **-** |

## 26 ප්‍රදාන හා සහනාධාර

**ලංකා ලුණු සමාගම**

| | අයඩීනිත යන්ත්‍රය රු. '000 | ගොඩනැගිලි රු. '000 | පොම්පාගාරය රු. '000 | සේවක වන්දි රු. '000 | යන්ත්‍රය සඳහා අයඩීන් රු. '000 | එකතුව 2017 රු. '000 | එකතුව 2016 රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| ජනවාරි 01 දිනට | 19,515 | 41,124 | 1,387 | 4,260 | - | 66,287 | 68,837 |
| දෙසැම්බර් 31 දිනට | 19,515 | 41,124 | 1,387 | 4,260 | - | 66,287 | 68,837 |
| **ක්‍රමක්ෂය** | | | | | | | |
| ජනවාරි 01 දිනට | 18,058 | 9,853 | 335 | - | - | 28,246 | 27,579 |
| වර්ෂයේ ප්‍රත්‍යාවර්තනය | 1,457 | 1,028 | 35 | - | - | 2,520 | 3,217 |
| දෙසැම්බර් 31 දිනට | 19,515 | 10,881 | 370 | - | - | 30,766 | 30,796 |
| **කපා හළ අගය** | | | | | | | |
| දෙසැම්බර් 31 දිනට | - | 30,244 | 1,017 | 4,260 | - | 35,521 | 38,041 |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 27 | **නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | | | | |
| | ජනවාරි 01 දිනට ආරම්භ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | | 401,707 | 356,924 | 202,603 | 193,085 |
| | පොළී වියදම් | | 66,048 | 79,648 | 22,286 | 21,239 |
| | ප්‍රවර්තන සේවා ගාස්තු පිරිවැය | | 10,546 | 8,973 | 10,546 | 8,973 |
| | ප්‍රතිලාභ ගෙවීම් | | (35,591) | (43,337) | (21,643) | (20,195) |
| | බැඳියාව මත ආයු ගණන ලාභ/ අලාභ | | 11,599 | (500) | 11,599 | (500) |
| | **දෙසැම්බර් 31 දිනට අවසන් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | **454,311** | **401,707** | **225,391** | **202,603** |
| 28 | **ප්‍රවර්තන බදු බැරකම්** | | | | | |
| | **දළ බදු වගකීම** | | **2,761,084** | **2,584,325** | **2,705,842** | **2,394,498** |
| | ස්ථාවර තැන්පත් මත උපචිත රඳවා ගැනීමේ බදු | | 166,917 | 43,663 | 166,917 | 43,663 |
| | ජාතික බදු බැර | | (2,322,423) | (2,249,227) | (2,322,423) | (2,249,227) |
| | බදු ගෙවූ මූලාශ්‍රය | | (331,543) | (107,094) | (331,543) | (107,094) |
| | ගෙවූ ආර්ථික සේවා ගාස්තු | | (7,257) | (758) | (7,257) | (758) |
| | **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු** | | **266,777** | **270,909** | **211,536** | **81,082** |
| 29 | **අනෙකුත් බැරකම්** | | | | | |
| | ගෙවිය යුතු ගිණුම් හා විවිධ ණයගැතියෝ | 29.1 | 523,992 | 409,738 | 157,269 | 104,569 |
| | විලම්බිත බදු වගකීම් | 30.2 | 80,076 | 100,813 | - | - |
| | | | **604,068** | **510,550** | **157,269** | **104,569** |

| | | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2017 | 2016 |
| | | සටහන | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| 29.1 | **ගෙවිය යුතු ගිණුම් හා විවිධ ණය ගැතියෝ** | | | | | |
| | ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් මත රඳවාගත් බදු | | 35,487 | 15,214 | 35,487 | 15,214 |
| | වෙළඳ හා අනෙකුත් බැරකම් | 29.1.1 | 366,723 | 305,169 | - | - |
| | ප්‍රතිලාභ ගෙවීම් මත රඳවාගත් බදු | | 709 | 604 | 709 | 604 |
| | නොගෙවූ වේතන | | 6 | 6 | 6 | 6 |
| | වැටුප් ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | | 98 | 93 | 98 | 93 |
| | අධිකාරි සේවක අර්ථසාධක අරමුදල | | 13,601 | 11,796 | 13,601 | 11,796 |
| | විවිධ ණය හිමියෝ | | 57,830 | 38,772 | 57,830 | 38,772 |
| | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ | | 6,534 | 5,310 | 6,534 | 5,310 |
| | නොගෙවූ මරණ ප්‍රතිලාභ | | 10,171 | 9,992 | 10,171 | 9,992 |
| | ගෙවිය යුතු සේ නි භාර අරමුදල | | 1,632 | 1,415 | 1,632 | 1,415 |
| | උපයන විට ගෙවිය යුතු බදු | | 2,659 | 2,498 | 2,659 | 2,498 |
| | එකතු කළ අගය මත බදු | | 269 | 731 | 269 | 731 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | | 110 | 106 | 110 | 106 |
| | ඉල්ලුම් නොකළ ශිෂ්‍යත්ව අරමුදල් | | 1,865 | 2,113 | 1,865 | 2,113 |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | | 588 | - | 588 | - |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | | 17,341 | 16,087 | 17,341 | 16,087 |
| | පුස්තකාල අරමුදල | | 47 | 45 | 47 | 45 |
| | මණ්ඩලයේ සැමරුම් අරමුදල | | - | (308) | - | (308) |
| | සේ නි භාර අරමුදලේ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය | | 100 | - | 100 | - |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | | - | 14 | - | 14 |
| | අයිසා ව්‍යාපෘතිය | | 4,180 | - | 4,180 | - |
| | ආරක්ෂක තැන්පතු - රථ ගාල | | 3,958 | - | 3,958 | - |
| | වැටුප් අවකරණ නිශ්කාශන | | 75 | 80 | 75 | 80 |
| | කලින් ගෙවූ ආදායම් | | 9 | - | 9 | - |
| | | | **523,992** | **409,738** | **157,269** | **104,569** |

| 29.1.1 | වෙළඳ හා අනෙකුත් බැරකම් | ලංකා ලුණු සමාගම | |
|---|---|---|---|
| | | 2017 | 2016 |
| | | රු. '000 | රු. '000 |
| | **මූල්‍ය වගකීම්** | | |
| | වෙළඳ බැරකම් | 76,684 | 39,615 |
| | ගෙවිය යුතු ලුණු ප්‍රවහන වියදම් | 11,124 | 9,890 |
| | ගෙවිය යුතු තැන්පතු | 30,855 | 16,785 |
| | ගෙවිය යුතු ලාභාංශ | 1,258 | 18,952 |
| | ගෙවිය යුතු ඉඩම් කුලී | - | - |
| | **මූල්‍ය නොවන වගකීම්** | | |
| | උපචිත වියදම් | 174,794 | 127,803 |
| | ගෙවිය යුතු - වෙනත් | 12,784 | 26,640 |
| | එකතු කළ අගය මත බදු - ගෙවිය යුතු | 14,437 | 26,356 |
| | ගෙවිය යුතු කොන්ත්‍රාත් වියදම් | 44,787 | 39,129 |
| | | **366,723** | **305,169** |

| 29.2 | විලම්බිත බදු වගකීම | ලංකා ලුණු සමාගම | | | | |
|---|---|---|---|---|---|---|
| | | බදු කටයුතු සඳහා වූ ප්‍රාග්ධන දීමනා | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | ප්‍රදාන සහ සහනාධාර | බදු අලාභවලට ආරෝපණය කළ හැකි විලම්බිත බදු | එකතුව |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| | 2015 ජනවාරි 01 දිනට | 104,910 | (45,875) | (11,552) | (86,402) | (38,919) |
| | වර්ෂයේ ලාභයට හෝ අලාභයට ගැළපීම | 62,304 | (9,875) | 901 | 86,402 | 139,732 |
| | 2016 ජනවාරි 01 දිනට | 167,213 | (55,749) | (10,651) | - | 100,813 |
| | වර්ෂයේ ලාභයට හෝ අලාභයට ගැළපීම | (13,094) | (8,348) | 706 | - | (20,737) |
| | **2016 දෙසැම්බර් 31 දිනට** | **154,119** | **(64,097)** | **(9,946)** | **-** | **80,076** |
| | විලම්බිත බදු වගකීම | | | | (154,119) | (167,213) |
| | විලම්බිත බදු වත්කම | | | | 74,043 | 66,401 |
| | ඉදිරියට ගෙනා භාවිතා නොකළ ව්‍යාපාර අලාභ | | | | - | - |
| | **ශුද්ධ විලම්බිත බදු** | | | | **(80,076)** | **(100,813)** |

| 30 | ප්‍රතිපාදන | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| | | Rs. '000 | Rs. '000 | Rs. '000 | ප්‍රතිප්‍රකාශිත Rs. '000 |
| | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,810 | 1,990 | 1,810 | 1,990 |
| | දුරකථන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 255 | 709 | 255 | 709 |
| | විදුලි ගාස්තු සඳහා ප්‍රතිපාදන | 46 | 90 | 46 | 90 |
| | ජල ගාස්තු සඳහා ප්‍රතිපාදන | 34 | 105 | 34 | 105 |
| | සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන | 2,000 | 2,000 | 2,000 | 2,000 |
| | ප්‍රසාද දීමනා ප්‍රතිපාදන | 113 | 153 | 113 | 153 |
| | ලබා නොගත් නිවාඩු ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 11,492 | 10,488 | 11,492 | 10,488 |
| | තැපැල් ගාස්තු සඳහා ප්‍රතිපාදන | 302 | 779 | 302 | 779 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 65,844 | 71,528 | 65,844 | 71,528 |
| | 5 වසර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 15 | - | 15 | - |
| | | **81,910** | **87,841** | **81,910** | **87,841** |


AUDIT REPORT




04

# පරිපූරක තොරතුරු

# විගණකාධිපති වාර්තාව - 2017

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/බී/ඊටීඑෆ්/එෆ්ඒ/2017 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 23 දින

සභාපති,

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතයෙහි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි 2017 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක. සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය - සමූහය

---------------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය - මණ්ඩලය

------------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

--------------------------------------------------

මණ්ඩලයට සියයට 90 ක කොටස් හිමිකමක් පවතින පරිපාලිත සමාගමක් වන ලංකා සොල්ට් ලිමිටඩ් සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපති විසින් සෘජු විගණනයට භාජනය කරන ලද අතර එහිදී තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කරන ලදී.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - මණ්ඩලය

--------------------------------------------------

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

----------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 වන වගන්තිය ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පිරිවැය රු.441,163,000 ක්වූ ස්ථාවර වත්කම් තුළ වර්ෂ 25 කට අධික කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ තවදුරටත් ක්ෂය වෙමින් පවතින වත්කම් පැවතියද, එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ හඳුනාගත නොහැකි වූ ශේෂ ලෙස රු.588,000 ක් දක්වා තිබූ අතර මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 වර්ෂයේ සිට 2009 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව උසස් පෙළ සමත් සිසුන්ට ගෙවිය යුතු හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව මුදල් රු. 1,865,000 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. 10,170,557 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු. 17,341,449 ක් හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු. 6,534,199 ක් වශයෙන් එකතුව රු. 34,046,205 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

කෙසේ වුවද, සේවා නියුක්තයනගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයාගේ අදහස් දැක්වීම් අනුව 2018 ජනවාරි සිට ජුලි දක්වා කාලපරිච්ඡේදය තුළ හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ වලින් රු. 69,454 ක් ද රඳවාගත් ප්‍රතිලාභ වලින් රු. 4,499,697 ක් ද ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ වලින් රු. 2,514,785 ක් ද ගෙවීම් කර ඇති බව දන්වා තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට මණ්ඩලය වෙත අයවිය යුතු ලෙස විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබූ රු.7,515,346 ක ලැබිය යුතු දේපල ආදායම් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.5 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ - 1985 වගන්තිය III පරිච්ඡේදයේ 13.1 (ආ) | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ තනතුරක් නිත්‍ය වශයෙන් දරන්නා නැති අතර හෝ තාවකාලික ඇබැර්තුවක් පිරවීමට හෝ තම රාජකාරී වලට අමතර තනතුරක වැඩ බැලීමට පමණි. එසේ වුවද මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පැවති පූරප්පාඩු නොමැති පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා සහ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති තනතුරක් වන තැපැල් කළමනාකරු තනතුර සඳහා පිළිවෙලින් 2016 අප්‍රේල් 01 දින සහ 2014 නොවැම්බර් 03 දින සිට වැඩ බැලීමේ පත්කිරීම් සිදුකර තිබූ අතර පසුව එම තනතුරුවල 2016 ඔක්තෝබර් 01 දිනසිට ස්ථිර කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 9.3.1 (vii) වන වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව වැඩබැලීමේ පත්වීම් මාස 3 කට සීමා කලයුතු වුවද මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 7 දෙනෙකු එකී නියමයන්ට පටහැනිව වසර 1 ½ සිට වසර 4 දක්වා කාලයක් වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි. |

(ii) 9.14.2 වගන්තිය

මණ්ඩලයේ දැනට ක්‍රියාත්මක වන පරිපාලන හා විනය කාර්ය පරිපාටි සංග්‍රහය මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය රු.මිලියන 17,153 ක් හා මණ්ඩලයේ ලාභය රු. මිලියන 16,828 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 14,346 ක් හා රු.මිලියන 13,648 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 2,807 කින් හා රු.මිලියන 3,180 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 3,747 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ රු.මිලියන 14,913 ක් වූ ලාභය 2014 වර්ෂයේදී රු.මිලියන 17,072 ක් දක්වා වැඩි වී තිබුණද 2016 වර්ෂය වනවිට හා රු.මිලියන 13,648 ක් දක්වා අඩු වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 16,828 ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ආදායම් බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.මිලියන 15,905 ක්වූ මණ්ඩලයේ දායකත්වය 2016 වර්ෂයේදී රු.මිලියන 17,051 ක් දක්වා ද 2017 වර්ෂයේදී රු.මිලියන 20,610 ක් දක්වා ද වර්ධනය වී තිබූ අතර 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වයේ වර්ධනය සියයට 20.87 ක් විය.

### 3.2 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලය වෙත අයවිය යුතු රු. 1,902,318 ක මුදලක් අයකර ගැනීම වෙනුවෙන් පෞද්ගලික සමාගමකට එරෙහිව සහ රු. 166,687,328 ක දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් දිවයින පුරා අධිකරණවල නඩු 2,321 ක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

---------------

4.1.1 සැලසුම් කිරීම

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ "ශක්තීන්, අවස්ථා, දුර්වලතා හා තර්ජන විශ්ලේෂණය (SWOT) "අනුව, සඵලදායී මෙහෙයුම් ක්‍රියාවලියක් සඳහා පහසුකම් හිඟවීම, තමන්ගේම කාර්යාල සංකීර්ණයක් නොමැති වීම හා මෙහෙයුම් කටයුතු සඳහා දැනට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, ප්‍රමාණවත් නොවන දත්ත ගබඩාව, තීක්ෂණ දක්ෂතා ඇති වෘත්තිකයන් ආකර්ෂණය කර නොගැනීම, කාර්ය මණ්ඩලයේ ඉදිරි පුද්ගල දියුණුවට තිබෙන සීමා වීම් ආදී දුර්වලතා සහ ආයෝජන සම්බන්ධව ව්‍යාපාර ලෝකයේ තිබෙන අසීරුතා හා ඉහළ සඵලතාවයක් ලබා ගැනීම සඳහා ආයෝජන නොමැතිවීම යනාදී තර්ජන හානිකර සාධක ලෙස හඳුනාගෙන තිබුණද සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම බාධක ජයගැනීමේ ක්‍රමෝපායන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ආයෝජන අංශයේ 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේ අරමුණ ලඟාකර ගැනීමේ ක්‍රමෝපායන් යටතේ රජයේ සුරැකුම්පත් හා රාජ්‍ය බැංකුවල තැන්පතු ප්‍රතිශතය සියයට 87 ක පවත්වාගැනීමට සැලසුම්කර තිබුණි. එසේ වුවද, මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව, රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් හා රුපියල් ණය) වල පමණක් අවම වශයෙන් සියයට 87 ක ප්‍රතිශතයක් පවත්වාගත යුතුය. ස්ථාවර තැන්පතු, ණයකර හා වාණිජ පත්‍රිකා වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් යටතේ ගැනෙන අතර එම ආයෝජනයන්ගේ උපරිම සීමාව සියයට 5 ක් විය යුතුය. ඒ අනුව ආයෝජන අංශයේ කාර්යසාධනය මැනීම සඳහා කාර්යසාධන මිනුම්දඬු (KPI) නිවැරදිව හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී ස්වයං රැකියාලාභීන් 2000 ක් සාමාජික කර ගැනීමට සැලසුම් කර තිබුණද සාමාජිකත්වය ලබා දී තිබූ ස්වයං රැකියාලාභීන් සංඛ්‍යාව 996 ක් පමණක් විය.

(අ) 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතේ 7 වන වගන්තියෙන් සංශෝධිත 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ස්වයං රැකියාලාභීන් බඳවාගැනීමට ඉඩකඩ සලසා දී තිබුණි. එසේ වුවත් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, ශ්‍රී ලංකාවේ ස්වයං රැකියාලාභීන් ලෙස වාර්තා වී ඇති සංඛ්‍යාව 2,571,023 ක් වුවද මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ඉන් බඳවාගෙන තිබුණේ සාමාජිකයන් 40,265 ක් හෙවත් සියයට 1.57 ක් පමණක් විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුළ වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුළ උපායමාර්ග දක්වා තිබුණ ද, 2017 වර්ෂයේ අවසන් වන විට ඊට දැක්වූ අවධානය අවම මට්ටමක පැවතුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණ අංශයේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමේ ක්‍රමයන් දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීමේ ක්‍රමෝපායන්ගේ වර්ධනය සැලසුම්කළ මට්ටමට වඩා සියයට 30 ක් අඩුවෙන් ලඟාකරගෙන තිබුණි. එසේම මාසික දිරිදීමනා ක්‍රමය තනි පුද්ගල කාර්යසාධනයට සම්බන්ධ කිරීමේ ක්‍රමෝපායන්ගේ ළඟාකරගෙන තිබූ කාර්යසාධනය සියයට 25 ක් පමණක් විය.

(ඇ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය සහ 22 වන වගන්තිය ප්‍රකාරව, අරමුදලේ සාමාජිකයින්ට ගෙවිය යුතු වන පොලී ප්‍රතිලාභයන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සියයට 12.5 සිට සියයට 10 දක්වා පහත වැටී තිබූ අතර ඉකුත් වර්ෂ 2 කදී හා සමාලෝචිත වර්ෂයේදී එය සියයට 9 ක් බැගින් සමාන පොලී ප්‍රතිශතයක් ගෙන තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

මණ්ඩලය විසින් සකස් කර ඇති මූල්‍ය කාර්යය පරිපාටි සංග්‍රහය අධ්‍යක්ෂක මණ්ඩලයට හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 අරමුදල් ආයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයෝජන කළඹ හැසිරවීමේදී ආදායම උපරිම වන ලෙසත් අවදානම අවමවන ලෙසත් ආයෝජනයන් සිදු කළයුතු සංයුතිය පිළිබඳව මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 4 වන පරිච්ඡේදයේ දක්වා තිබේ. ඒ අනුව, රජයේ සුරැකුම්පත්හි සියයට 87 ක්, වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්හි (උපරිමය) සියයට 5 ක්, කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනුම්හි සියයට 2 ක් සහ කොටස් ආයෝජනයන්හි (උපරිමය) සියයට 6 ක් වශයෙන් සීමාවන් නිර්ණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක ආයෝජන කළඹ සකස් වී තිබූ ආකාරය පහත පරිදි වේ.

| ආයෝජන කළඹ | 2015 වටිනාකම | 2015 මුළු ආයෝජන කළඹේ ප්‍රතිශතයක් ලෙස | 2016 වටිනාකම | 2016 මුළු ආයෝජන කළඹේ ප්‍රතිශතයක් ලෙස | 2017 වටිනාකම | 2017 මුළු ආයෝජන කළඹේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | (රු.මිලියන) | % | (රු.මිලියන) | % | (රු.මිලියන) | % |
| (i) රජයේ සුරැකුම්පත් | 194,723 | **93.08** | 202,295 | **86.18** | 207,295 | **79.29** |
| (ii)වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් | 1,917 | **0.92** | 17,970 | **7.65** | 40,382 | **15.45** |
| (iii)කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම් | 1,751 | **0.84** | 2,846 | **1.21** | 2,940 | **1.12** |
| (iv)කොටස් වෙළඳපොළ | 10,803 | **5.16** | 11,636 | **4.96** | 10,828 | **4.14** |
| | **209,194** | | **234,747** | | **261,445** | |

ඒ අනුව, 2015 හා 2016 වර්ෂවල සමස්ත ආයෝජන කළඹෙන් පිළිවෙලින් සියයට 93 ක් හා සියයට 86 ක් වශයෙන් පැවති රජයේ සුරැකුම්පත්හි ආයෝජනය 2017 වර්ෂයේ දී සියයට 79 දක්වා අඩු වී තිබුණු අතර එය ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව තිබිය යුතු සීමාව වූ සියයට 87 ට වඩා සියයට 8 ක අඩු වීමක් බව නිරීක්ෂණය විය. තවද, 2015 වර්ෂයේ සියයට 0.92 ක් වශයෙන් පැවති වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්හි ආයෝජනය අනුමත සීමාව ඉක්මවා පිළිවෙලින් 2016 හා 2017 වර්ෂවලදී සියයට 7.65 ක් හා සියයට 15.45 දක්වා වැඩි වී තිබූ අතර 2015 වර්ෂයේ රු.මිලියන 70 ක් වූ ස්ථාවර තැන්පතුවල ආයෝජනය 2017 වර්ෂය වන විට රු.මිලියන 38,100 දක්වා වැඩිවීම ඒ සඳහා සෘජු ලෙස බලපා තිබුණි. ඒ අනුව, කෙටිකාලීන කල්පිරීම් සහිත සුරැකුම්පත්හි ආයෝජනය ඉහළ යෑමත් අඩු අවදානම් සහිත රජයේ සුරැකුම්පත්හි ආයෝජනය පහළ යෑමත් සමස්ත ආයෝජන කළඹේ අවදානම ඉහළ යාමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 16 ක් අතුරින් මිල ගණන් පිළිගත් වෙන්දේසි 15 ක් පැවති අතර මණ්ඩලය විසින් ඉන් වෙන්දේසි 14 කට සහභාගි වී තිබුණි. එලෙස සහභාගි වූ වෙන්දේසි 14 න් අවස්ථා 4 කදී මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසු සියල්ලමද අවස්ථා 4 කදී ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකමින් සියයට 90 කට වැඩි ප්‍රමාණයක්ද ප්‍රතික්ෂේප වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී වෙළඳපොල හැසිරීම පිළිබඳ මනා අධ්‍යනයකින් තොරව එක් ISIN අංකයක් යටතේ ඉදිරිපත් කරන ලංසු වටිනාකම කුඩා කොටස්වලට වෙන් කර එම එක් එක් කොටස සඳහා ඉහළ ඵලදා අනුපාතයන් යටතේ මිල ගණන් ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබේ. මෙසේ වෙළෙඳපොල තුල පවත්නා සාමාන්‍ය ඵලදා අනුපාතයන් ද ඉක්මවා ඉහළ ඵලදා අනුපාතයන් යටතේ ලංසු ඉදිරිපත් කිරීම හේතුවෙන් ද්විතියීක ලංසු ප්‍රතික්ෂේප වීමට හේතු වන බව නිරීක්ෂණය විය.

(ඈ) මණ්ඩලය විසින් ප්‍රාථමික හා ද්විතියීක වෙළඳපොළ හරහා මිලට ගනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර "පරිණත වීම තෙක් රඳවාගන්නා බැඳුම්කර" ලෙස වර්ගකර පවත්වා ගන්නා බැවින් ඒවා ද්විතියීක වෙළඳපොළ තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙළේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අත්කර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයෙන් පසුව භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොල ගනුදෙනු වලින් මණ්ඩලය ඉවත් වී තිබූ අතර 2018 ජුනි 30 දින වන විටත් නැවත ද්විතියික වෙළඳපොල ගනුදෙනුවලට අවතීර්ණ වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ ගැටළුකාරී තත්වයක් පවතින බවත් ඉහත 4.3 (අ) හි සඳහන් කළ පරිදි ආයෝජන කළඹ හැසිරවීමේදී අවදානම අඩු රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ අවස්ථාව අහිමි වන බවත් අනාවරණය විය. භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොලට සම්බන්ධවීමේදී අවශ්‍ය කරන තාක්ෂණික පහසුකම් වර්ධනය කිරීම, ආයෝජන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම හා මානව සම්පත් සංවර්ධනය කිරීම යන කාර්යයන් සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබූ බව ද නිරීක්ෂණය විය.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද සමාගම් 7 ක සිදුකර තිබූ සාමාන්‍ය පිරිවැය රු.200,402,855 ක් වූ ආයෝජනයන් සඳහා 2017 වර්ෂය සඳහා කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබූ අතර ඉන් සමාගම් 5 ක් සඳහා 2016 වර්ෂය සඳහා ද ලාභාංශ ලැබී නොතිබුණි.

## 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් 1981 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අයකරගෙන තිබූ 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,166,965,613 ක සහ 1996 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව හඳුනා නොගත් රු.1,307,367 ක දායක මුදල්, අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර වෙනත්

තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි. අදාල සාමාජික ගිණුම් හඳුනාගෙන එම ගිණුම්වලට බැර කිරීමෙන් තොරව මෙසේ රඳවාගෙන තිබීමෙන් අදාල සාමාජිකයන්ට තම මුදල් අහිමි වීමේ අවධානමක් පැවතුණි.

(ආ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචිවන සේවායෝජකයින් මණ්ඩලය විසින් අනුව්‍යාජ (Dummy) සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර තිබූ අතර 1984 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා එලෙස ලියාපදිංචි කරගෙන තිබූ අනුව්‍යාජ සේවායෝජකයින් සංඛ්‍යාව 14,139 ක් වී තිබුණි. මෙම අනුව්‍යාජ සේවායෝජකයින්ගේ දායක මුදල් පෞද්ගලික ගිණුම්වලට බැර නොකර 'XX' නමින් ගිණුමකට බැර කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු. 142,751,290 ක් විය. මෙලෙස අනුව්‍යාජ සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගන්නා සේවායෝජකයින් මණ්ඩලයේ සත්‍ය සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ සේවකයින්ට නවාතැන් ගැනීමට මණ්ඩලයේ වියදමින් පවත්වාගෙන යනු ලබන අනුරාධපුර නිවාඩු නිකේතනයෙන් දිගින් දිගටම අලාභදායී තත්වයක් වාර්තා වී ඇති අතර 2017 වර්ෂයේදී රු. 3,415,000 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. ඉකුත් වර්ෂවලදී එනම්, 2015 හා 2016 වර්ෂවලදී ලැබූ ශුද්ධ අලාභයන් පිළිවෙලින් රු.2,938,000 ක් හා රු. 2,817,000 ක් විය. මෙලෙස අලාභ ලැබීම මණ්ඩලයේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම සඳහා පවතින අරමුදල් අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

### 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මණ්ඩලය සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බව දක්වමින් අතිකාල පැයකට පැය එක හමාරක් සහ සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණවීමත් සමග දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී අතිකාල පිරිවැය රු. 22,238,000 ක් වී තිබුණි. එය 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 36 ක වර්ධනයකි. ඉහත පනත ප්‍රකාරව අතිකාල ලබා ගැනීමට මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් සීමාකර තිබුණද ඊට පටහැනිව නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබාදීම හා සතියකට දින 5 ක සේවයක් ඉටු කිරීමට ඉඩ දී තිබුණි.

## 4.6 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තනතුරු 19 ක පුරප්පාඩු පැවති අතර තනතුරු 16 ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි. පුරප්පාඩුව පැවති කාර්ය මණ්ඩලය තුල සාමාන්‍යාධිකාරී තනතුර 2013 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් මණ්ඩලයේ පරිපාලන කටයුතුවලට හා ඉහළ කළමනාකරණ අධීක්ෂණයට සෘජු බලපෑමක් සිදු කර තිබුණි.

(ආ) මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටියේ කළමනාකරණ සහකාර (MA 1-2) iii තනතුර සඳහා වූ බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පුරප්පාඩු ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවීම් කළයුතු වුවද ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ කාර්ය මණ්ඩල දරුවන්ගෙන් ලද අයදුම්පත් වලට අනුව එම තනතුරේ පුරප්පාඩු 39 ක් පිරවීමට කටයුතු කර තිබුණි.

(ඇ) පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශ චක්‍රලේඛ වලට අනුව, උසස්වීම් ලබාදීමේදී වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සහ විනයානුකූල ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සලකා බැලිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, තැපැල් අංශයේ කළමනාකරු ලෙස වැඩ බැලීමේ පත්වීමක් ලැබ සිටි නිලධාරියා සම්බන්ධයෙන් රාජකාරී උපදෙස් වලට අවනත නොවීම, කලාප කාර්යාලවලදී දිගින් දිගටම විනය විරෝධී සහ අකටයුතුකම් කර තිබීම, සේවායෝජකයින් සමග නිල වශයෙන් කටයුතු කිරීමේදී අවංකභාවය හා පාරදෘශ්‍යභාවය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් පැවතීම යන කරුණු තිබියදී 2016 ඔක්තෝබර් 01 දින සිට එම තනතුරේ ස්ථිර කර තිබුණි. තවද, එසේ ස්ථිර කිරීමේදී එම නිලධාරියාගේ අංශ ප්‍රධානියාගෙන් කාර්යසාධන වාර්තා ලබාගෙන තිබුණු බවට සාක්ෂි අනාවරණය නොවුණි.

(ඈ) 2013 වර්ෂයේ කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණයේදී තවදුරටත් අවශ්‍ය නොවන නමුත් දැනට සේවයේ නියුතු නිලධාරියාගේ සේවා කාලය අවසන්වන තෙක් පමණක් අනුමත කාර්ය මණ්ඩලය තුල පවත්වාගත යුතු තනතුරක් ලෙස "ස්වයං රැකියා කළමනාකරු" තනතුර හඳුනාගෙන තිබුණි. නමුත් එම කාලපරිච්ඡේදය තුල සේවයේ නියුතුව සිටි නිලධාරියාගේ සේවය අවසන් කිරීමෙන් පසුවද එම තනතුර ඉදිරියටත් පවත්වාගෙන යමින් 2015 වර්ෂයේ සිට ඒ සඳහා නව පත්වීමක් සිදුකර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක එන්පි/එස්පී/එස්ඩීජී/17 දරන ලිපිය හා එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතී. එසේ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

(අ) 2017 වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව, ලැයිස්තුගත කොටස් හා ලැයිස්තුගත නොවන කොටස් ආයෝජනයන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී එම කටයුතු ඉටුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයේ අවසන් ගිණුම්, වාර්ෂික අයවැය, වාර්ෂික වාර්තාව හා සංයුක්ත සැලැස්ම පිළිබඳව වාර්ෂිකව විමර්ශනයන් කළ යුතු වුවත්, ඒ පරිදි කටයුතු කර නොතිබූ අතර අරමුදලේ ප්‍රධාන කාර්යභාරය වන අරමුදල් ආයෝජනය හා එම ප්‍රතිලාභ වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

2017 වර්ෂය මණ්ඩලයේ සඳහා අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් සැසඳීමේදී මිල ප්‍රකාශිත කොටස් විකිණීමේ ලාභ හා දේපල ආදායම් බදු කුලී පිළිවෙලින් සියයට 84 ක් හා 28 ක් වශයෙන් අයවැයගත ප්‍රමාණයට වඩා අඩු වී තිබූ අතර වියදම් අයිතම 31 ක සියයට 25 ත් 200 ත් අතර විචලනයන් නිරීක්ෂණය විය. යන්ත්‍ර හා උපකරණ නඩත්තු වියදම්, වෙළඳ දැන්වීම් සඳහා වියදම්, විවිධ වියදම් හා කාර්යාලීය නඩත්තු හා අවශ්‍යතා වියදම් පිළිවෙලින් සියයට 200, සියයට 174, සියයට 149 සහ සියයට 69 බැගින් අයවැයගත ප්‍රමාණයට වඩා වැඩිවී තිබූ අතර වියදම් අයිතම 14 අධි ඇස්තමේන්තු හේතුවෙන් තථ්‍ය වියදම සියයට 35 සිට 95 දක්වා අඩුවී තිබුණි. ඒ අනුව අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැළකිය යුතු විචලනයන් අයවැය, කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.1,423,750 ක උපදේශන සේවා ලබාගෙන තිබුණද ඊට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීමේදී "උපදේශකයන් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කරවීම" සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් 2007 අගෝස්තු මාසයේදී නිකුත් කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබූ අවස්ථා පහත පරිදි වේ.

(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ඡේදය අනුව, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඉහත උපදේශන සේවාවන් ලබාගැනීමේ කාර්යයන් ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් වෙනුවෙන් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ද පිළියෙල කර නොතිබුණි.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.3 ඡේදය අනුව, මණ්ඩලයට උපදේශන සේවා ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබූ අතර ඉහත උපදේශන කාර්යයන් ඉටු කර ගැනීම එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 8 වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව උපදේශන සේවා ප්‍රසම්පාදන කමිටුවක ඇගයීමෙන් තොරව සිදුකර තිබුණි.

(iii) ඉහත උපදේශන සේවා ලබා ගැනීමේදී මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ඡේදය අනුව, උපදේශන කාර්යයේ අරමුණු හා විෂය පථය පැහැදිලිව විස්තර කරන ආකාරයට Terms of Reference (TOR) සකස් කර නොතිබූ අතර අවදානම තක්සේරු කිරීමේ කාර්යය නිම කිරීමට ගතවන කාලය හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනයට ලක්කර නොතිබීම හේතුවෙන් සත්‍ය මිලදී ගැනීම් හා සැලසුම්ගත මිලදී ගැනීම් අතර දැඩි විෂමතාවයන් පැවතුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 47 කදී මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අයිතම සැලසුම්ගත කාලය තුළ මිලදී නොගැනීම, අවස්ථා 15 කදී මිලදී ගැනීමට සැලසුම් කර නොතිබූ අයිතම මිලදී ගැනීම සහ වර්ෂය තුළදී අවස්ථා 5 කදී විශාල වශයෙන් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අයිතම ඉතා අඩු වශයෙන් මිලදී ගැනීම් සිදුකර තිබූ බව අනාවරණය වූයෙන්, මණ්ඩලය විසින් අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව 2017 වර්ෂයේ ප්‍රසම්පාදනයන් සැලසුම්කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයේ නිලධාරීන් සඳහා 2018 වර්ෂය වෙනුවෙන් පිරිවැය රු. 10,325,914 ක් නිල ඇඳුම් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදය ප්‍රකාරව, ඉහත ප්‍රසම්පාදන කාර්යය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ආ) ඡේදයට පටහැනි ලෙස ඇස්තමේන්තු වටිනාකම වෙනුවට ලංසු මිලෙන් ප්‍රතිශතයක් ලෙස ලංසු සුරක්ෂණය ඉල්ලුම් කර තිබුණි.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමේදී ලංසු ඉදිරිපත් කිරීමේ අවම කාලසීමාව දින 21 ක් ලබාදිය යුතු වුවද ඊට පටහැනි ලෙස ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 18 ක් පමණක් ලබාදී තිබුණි.

(ii) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.8.4 ඡේදය අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ගණන 3 ත් 5 ත් අතර විය යුතු වුවද ඉහත ප්‍රසම්පාදන කාර්යය සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණු අතර 2.8.4 (ඉ) ඡේදයට පටහැනිව එකම අංශයේ ප්‍රධානියා සහ ඔහුගේ යටත් නිලධාරියෙකු යන දෙදෙනාම තාක්ෂණික ඇගයීම් කමිටුව නියෝජනය කර තිබුණි.

(iii) ලංසු ඉදිරිපත් කර තිබූ ලංසුකරුවන් 10 දෙනාගෙන් 02 දෙනෙකු විසින් ලංසු සුරක්ෂණ වෙනුවට චෙක්පත් ඉදිරිපත් කර තිබූ අතර තවත් ලංසුකරුවන් 2 දෙනෙකු විසින් ලංසු වටිනාකමින් සියයට 1 ට වඩා අඩු ප්‍රතිශතයකින් යුත් ලංසු සුරක්ෂණයන් ඉදිරිපත් කර තිබුණි. ලංසු ලේඛන අනුව දින 120 දක්වා වූ වලංගු කාලයක් සහිත ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවද ආයතන 4 ක් විසින් ඊට වඩා අඩු වලංගු කාලයක් සහිතව ලංසු සුරක්ෂණයන් ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 ඡේදය අනුව ලංසු ඇගයීමට ලක් නොකර තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ගේ මනාපය පරිදි ලංසුකරුවන් තෝරාගෙන තිබූ හෙයින් විශාල බැහැර වීම් තිබූ ආයතන 3 කින් කලිසම් රෙදි සඳහා ද විශාල බැහැරවීම් තිබූ එක් ආයතනයකින් කමිස සඳහා ද සාම්පල් ලබා ගැනීමට තීරණය කර තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) ඡේදය අනුව, ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ රැස්වීම් වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියට අනුව වාර්තාගත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ) ඡේදය අනුව, සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් නිල ඇඳුම් භාවිතා කරන්නන්ගේ මනාපය පරිදි කලිසම් රෙදි හා සාරි තෝරා ගැනීම සිදුකර තිබුණි. ඒ අනුව පිරිවිතරයන්ට අනුකූල නොවූ නිල ඇඳුම් මිලදීගෙන තිබූ අතර එම නිල ඇඳුම් තත්ත්ව පරීක්ෂණයේදී අසමත් වී තිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලය විසින් සමාගම් දෙකක ණයකරවල කරන ලද ආයෝජනය වෙනුවෙන් 2006 දෙසැම්බර් 31 දක්වා ලැබිය යුතු රු. 27,497,905 ක පොලී ආදායම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයවී නොතිබුණි. තවද, එය අයකර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව හෝ අයකරගැනීමට ඇති හැකියාව හෝ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ

ප්‍රමිති 37 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් කිරීම හෝ අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් රු. 25,227,541 ක් ආයෝජනය කරන ලද ලැයිස්තුගත සමාගම් 02 ක් ඈවර කර තිබූ අතර එම ආයෝජනයන්ගේ වටිනාකම නැවත අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි.

(ඇ) චනික් සමාගමේ පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබුණු රු.12,174,382 ක් හා ණයකරවල ආයෝජනය කර තිබුණු රු. 7,450,259 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි වියයුතුව තිබූ නමුත්, එම මුදල් උපලබ්ධි කර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් මණ්ඩලයට හැකි වී නොතිබුණි.

(ඈ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු බවට දක්වා තිබූ වගන්ති සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දිනැති පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ කර තිබූ නමුත් 2018 මැයි 31 වන විටත් ඊට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) සාමාජික අරමුදල් කළමනාකරණය | (i) මණ්ඩලයේ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට මේ දක්වා බැරවී නොමැති දායක මුදල් එම ගිණුම්වලට කඩිනමින් බැර නොකිරීම හා රඳවාගත් ප්‍රතිලාභ අදාළ හිමිකරුවන්ට අප්‍රමාදව ගෙවීමට කටයුතු නොකිරීම |

| | | |
|---|---|---|
| | | (ii) සේවාදායකයින්ගෙන් එකතු කර ගන්නා මුදල් ඉහල සුරක්ෂිතතාවයක් හා වැඩි ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් ආයෝජනය නොකිරීම |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත ආදායම් හා වියදම් වලට අනුගතව කටයුතු නොකිරීම |
| (ඇ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු නොකිරීම |
| (ඈ) | කාර්යමණ්ඩල පරිපාලනය | මනා කාර්ය මණ්ඩල පරිපාලනයක් මණ්ඩලය තුළ ක්‍රියාත්මක නොකිරීම |
| (ඉ) | සැලසුම් කිරීම | ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථාවන් හා බාධක හඳුනාගෙන ඒ අනුව ක්‍රමෝපායන් හඳුනා නොගැනීම |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# OBSERVATION OF THE BOARD

for the Auditor General's Report 2017

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

විගණන විමසුමෙහි සඳහන් පිරිවැය රු. මිලියන 441 ක්වූ ස්ථාවර වත්කම් වල සමුච්ත ක්ෂය අඩුකල පසු ශුද්ධ අගය රු. මිලියන 173 පමණක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 හි 30 වන වගන්තියෙහි ප්‍රකාරව මණ්ඩලයේ දේපල පිරියත හා උපකරණ පිරිවැය ආකෘතිය (Cost Model) යටතේ ගිණුම්ගත කරන බැවින් විගණන විමසුමෙහි සඳහන් පරිදි ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 34 වන වගන්තිය අදාල නොවේ.

තවද, මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලෙස දක්වා ඇත්තේ සාමාන්‍ය කාර්යාල කටයුතුවලදී භාවිතා කරන දේපල, යන්ත්‍ර හා පිරියත වන අතර, එකී අයිතමයන් වල ප්‍රමාණාත්මක මිල වෙනස්වීමක් සිදුනොවන අතර, එහි වත්කමින් විකිණීමක් සිදුකිරීමද සිදුනොවේ. එබැවින් ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත භාවිතය සඳහා ඇති උපදේශන ප්‍රකාරව මණ්ඩලයේ ස්ථාවර වත්කම් හඳුනාගැනීම හා මිණුම්කරණයට (Recognition and Measurement) ප්‍රශස්තම ක්‍රමය පිරිවැය ආකෘතිය (Cost Model) වන අතර, එය අඛන්ඩව පසුගිය වසර 37 ක් පුරාවට භාවිතාකර ඇත.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

ජංගම වගකිම් යටතේ දක්වා ඇති හඳුනා නොගත් ශේෂවල වටිනාකම රු. 588,000 කි. මෙම ශේෂයන්වල අන්තර් ගත වන්නේ දායක මුදල් එක්රැස්කිරීම් වලට අදාල මුදල් පොත් සාරාංශ 9ක හඳුනා නොගත් දායක මුදල් ලැබීම් වල එකතුව වේ. ඉදිරි ගිණුම් කාල පරිච්ඡේද තුල මෙම දායක මුදල් හඳුනා ගැනිමෙන් පසු නිවැරදිව ගිණුම්ගත කරන අතර, සාමාජිකයන්ගේ ගිණුම් වලටද බැර කරනු ලැබේ.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 1994 වර්ෂයේ සිට 2009 දක්වාවූ කාලච්ඡේදයට අදාලව හිමිකම් නොපෑ උසස්පෙළ සමත් සිසුන්ට ගෙවිය යුතු ශිෂ්‍යත්ව මුදල රු. 1,865,000 ක් ගිණුම් තුලින් අනාවරණය නොවේ. 2017 ගිණුම් වර්ෂය තුලදී 1994 වර්ෂයේ සිට 2009 දක්වාවූ කාලච්ඡේදයට අදාලව උසස් පෙළ සමත් සිසුන්ට ගෙවිය යුතු මුදලක් නොමැති අතර සියලුම හිමිකම් ගෙවා ඇත.

(ආ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2017.12.31 දිනට පැවති ශේෂය රු. 10,170,557.24 කි. (ප්‍රතිලාභ අයදුම්කරුවන් - 841) සාමාජිකයින්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම් ලාභීන් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම් ලාභීන් සියළු දෙනාම එකවර ඉදිරිපත් නොවීම සහ ඇතැම් අයට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවයන් නිසා ඔවුන්ගේ කොටස්, මණ්ඩල ගිණුමේ රඳවාගෙන, ලේඛණ ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්ථමානයේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග වේ. ඒ අනුව 2018 ජනවාරි සිට 2018 සැප්තැම්බර් මස දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු. 69,454.13 ක මුදලක් හිමිකරුවන් 04 දෙනෙකු වෙත ගෙවා ඇති අතර, 2018.09.30 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු. 10,101,103.11 ක් වේ. (මරණ ප්‍රතිලාභ අයදුම්පත් 837)

ආපසු එවන ලද ප්‍රතිලාභ (Returned Benefits - Slips) ගිණුමේ 2017.12.31 දිනට ශේෂය රු. 17,341,449.36 කි. (ප්‍රතිලාභීන් 1061) මෙම සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ මුදල් අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත යවා ඇතත්, එම ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම් විස්තර වල පැවති දෝෂ සහිත භාවය නිසා අදාල බැංකු විසින් හරවා එවා ඇති මුදල මෙම ගිණුමට ගිණුම්ගතවී ඉහත මුදල සැකසී ඇත.

මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් අතුරින්, 2018 ජනවාරි මස සිට 2018 සැප්තැම්බර් මාසය දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් 245 දෙනෙකු විසින් ඉල්ලුම් කර ඇති රු. 5,669,220.77 ක මුදල් ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති අතර, 2018.09.30 දිනට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු. 11,672,248.59ක් වේ. (ප්‍රතිලාභීන් 816)

ඉල්ලුම් නොකල ප්‍රතිලාභ (Returned Benefits - Cheques) ගිණුමේ 2017.12.31 දිනට ශේෂය රු.6,534,199.35 කි. (ප්‍රතිලාභීන් 1004) අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම් කිරීමට ගිණුම් විස්තර නොමැති ප්‍රතිලාභ අයදුම්කරුවන් 1004 දෙනෙකු වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකල චෙක්පත්, එම ප්‍රතිලාභ අයදුම්කරුවන් විසින් බැංකුගත නොකිරීම හේතුවෙන් ඉල්ලුම් නොකල ප්‍රතිලාභ ගිණුමේ ශේෂයෙන් පෙන්නුම් කෙරේ.

මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් 1004 දෙනා අතරින් ප්‍රතිලාභීන් 482 දෙනෙකුට 2018 ජනවාරි මස සිට 2018 සැප්තැම්බර් මාසය දක්වා රු. 4,199,314.54 ක මුදලක් නැවත ගෙවීම් කර ඇති අතර නොගෙවූ ප්‍රතිලාභීන්ට තව දුරටත් 2018.09.30 දිනට ගෙවීමට ඇති වටිනාකම රු.2,334,884.81 ක් වේ. (ප්‍රතිලාභීන් 522)

2015.12.09 දින පැවති කළමණාකරන කමිටු රැස්වීමේදී එළඹි තීරණයකට අනුව 2001 සිට 2005 දක්වා මෙම ලෙජර්වල පවතින ගිණුම් ශේෂයන් අදාල සාමාජිකයන්ගේ සාමාජික ගිණුම් සක්‍රීයකර ඒ ඒ ගිණුම් යාවත්කාලීන කිරීමට ක්‍රියාකර

එහි වට්නාකම් ලෙජරයේ ඇති සාමාජික ගිණුමට මාරුකිරීමට පියවර ගත් අතර, ඒ අනුව ආපසු එවන ලද ප්‍රතිලාභ (Returned Benefits - Slips) ලෙජරයේ සාමාජිකයින් 223 දෙනෙකුගේ (රු. 1,818,867.42) සාමාජික ගිණුම් සක්‍රීය කර ඒ ඒ ගිණුම් වල වට්නාකම් ලෙජරයේ ඇති සාමාජික ගිණුමට මාරුකර ඇත. ඉල්ලුම් නොකල ප්‍රතිලාභ (Returned Benefits - Cheques) ලෙජරයේ සාමාජිකයින් 67 දෙනෙකුගේ (රු. 118,719.57) සාමාජික ගිණුම් සක්‍රීය කර ඒ ඒ ගිණුම් වල වට්නාකම් ලෙජරයේ ඇති සාමාජික ගිණුමට මාරුකර ඇත.

2018.07.23 දින පැවති විගණන කමිටු රැස්වීමේදී එළඹි තීරණයකට අනුව 2005 සිට 2015 දක්වා මෙම ලෙජර්වල පවතින ගිණුම් ශේෂයන් අදාල සාමාජිකයන්ගේ සාමාජික ගිණුම් සක්‍රීයකර ඒ ඒ ගිණුම් යාවත්කාලීන කිරීමට ක්‍රියාකර එහි වට්නාකම් ලෙජරයේ ඇති සාමාජික ගිණුමට මාරුකිරීමට පියවර ගනු ඇත.

(ඇ) මෙම මුදල ඇසට් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ආයතනයෙන් ලැබිය යුතු රු. 7,512,346 ක මුදලකි. මණ්ඩලය වෙත අයකර ගැනීමට දැනටමත් හොරණ දිසා අධිකරණයේ නඩු අංක 9109/එම් යටතේ නඩුවක් ගොනුකර ඇති අතර, මීළඟ නඩු විභාගය 2018/11/27 දිනට යෙදී ඇත.

## 2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(a) වැඩබැලීමේ පත්වීම්

අප මණ්ඩලයේ ක්‍රියාත්මක කිරීමට නියමිත EISA සහ ICTA ව්‍යාපෘතින්ට සමගාමීව මානව සම්පත් සංවර්ධනය විධිමත්ව හා අඛණ්ඩව සිදුකිරීමේ අරමුණින් එම කාර්ය සඳහා වෙනම කළමනාකරුවෙකු යටතේ පුහුණු හා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කළයුතු බවට කළමනාකාරීත්වය තීරණය කරන ලදි. ඒ අනුව මණ්ඩලයේ පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශය පහත අයුරින් ඒකක තුනකට වෙන් කරන ලදි.

- පරිපාලන ඒකකය
- මානව සම්පත් සංවර්ධන ඒකකය
- මානව සම්පත් කළමනාකරණ ඒකකය

ඒ අනුව දැනට අනුමත සේවක ඇස්තමේන්තුවෙහි කළමනාකරු තනතුරු ඉක්මවා නොයන පරිදි කළමනාකරුවන් තිදෙනෙකු යටතේ එම ඒකක ක්‍රියාත්මක කිරීමට කටයුතු සලස්වන ලදි. ඒ සඳහා මෙම වැඩ බලන පත්වීම සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව කුසලතාවය පදනම් කරගෙන ප්‍රමුඛතාවය මත 2 ස්ථානය ලබාගත් නිලධාරියාට ලබාදී ඇත. පසුව ඔහුගේ වාර්ෂික කාර්ය සාධන වාර්ථා සතුටුදායක මට්ටමක තිබුන බැවින් 2016.10.01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඔහුව තනතුරෙහි ස්ථිර කර ඇත.

එලෙසම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත කළමනාකරු තනතුරකට උසස්වීම් ලබානොදීම සම්බන්ධයෙන් නිලධාරියෙකු කරන ලද පැමිණිල්ලකට ලබාදුන් නිර්දේශයට අනුව අනුමත සමස්ථ කළමනාකරු තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අදාල නිලධාරියා වැඩබැලීමේ පදනමින් කළමනාකරු තනතුරකට 2014.11.03 වන දින සිට පත්කොට ඔහු සේවය කරමින් සිටි තැපැල් අංශයේම ස්ථානගත කර ඇත. පසුව ඔහුගේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සතුටුදායක මට්ටමක තිබුන බැවින් 2016.10.01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඔහුව තනතුරෙහි ස්ථිර කර ඇත. ඔහුගේ පත්වීම සඳහා නියෝග මණ්ඩලයට බාහිරින් ලැබී ඇති නිසා එය මණ්ඩලයේ පාලනයෙන් තොරව සිදුකළ එකකි.

(ආ) වැඩබැලීමේ පත්වීම් කාලය සඳහන්ව ඇති ආයතන සංග්‍රහයේ විධිවිධාන සෘජුවම අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස මණ්ඩලය ගුරුකොට නොගනී. කෙසේ වෙතත් වැඩබැලීමේ කාලය දීර්ඝ කිරීම නතර කිරීම හෝ වැඩබැලූ තනතුර ස්ථිර කිරීම යනාදිය සිදුකරනු ලබන්නේ නිලධාරියාගේ කාර්ය සාධනය හා හැසිරීම ඇතුලත් බහුවිධ සාධක සතුටුදායක මට්ටමේ තිබේ නම් පමණි. එමනිසා එක් එක් නිලධාරියගේ වැඩබැලීමේ කාලය එම සාධක මත වෙනස් වනු ඇත.

(ii) මණ්ඩලයේ පරිපාලන හා විනය කාර්ය පටිපාටිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර ඒවා යාවත්කාලීන කොට භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

එකඟ වේ.

### 3.2 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලය විසින් රු.1,902.318 ක මුදලක් අයකර ගැනීම වෙනුවෙන් එක් පෞද්ගලික සමාගමක එරෙහිව ගොනු කර ඇති නඩුව දැනට සමථයක් සඳහා විත්තිකරුගේ නීතිඥයින් විසින් අධිකරණයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර,

සමථ කොන්දේසි ලිඛිතව මණ්ඩලය වෙත ලබාදීම සඳහා නියෝගයක් අධිකරණය විසින් ලබා දුන් අතර, එසේ ලිඛිත සමථ කොන්දේසි 2018.08.28 දිනට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළහොත් විභාගය සඳහා 2018.11.27 දින නියම කරන ලදී.

රු.166,687.328 ක දායක හා අධිභාර මුදල් අයකර ගැනීම වෙනුවෙන් දිවයින පුරා නඩු 2321 ගොනු කර තිබීම.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

(අ) ඉදිරි වර්ෂ 3 සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ සඳහන් ශක්තීන්, අවස්ථා, දුර්වලතා හා තර්ජන, විශ්ලේෂණයේදී (SWOT) හඳුනාගත් මණ්ඩලයට පාලනය කල හැකි දුර්වලතා හා තර්ජන වලට මණ්ඩලය විසින් ගනු ලැබිමට අපේක්ෂිත සියළුම උපක්‍රමයන් ඉදිරි වර්ෂ 3 සඳහා පිළියෙල කල සංයුක්ත සැලැස්මේ විස්තරාත්මකව දක්වා ඇත.

මානව සම්පත් සංවර්ධනය, නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීමල දේශිය හා විදේශිය පුහුණු වැඩසටහන්ල නව ආයෝජන උපක්‍රම හඳුන්වා දීම, නව ගොඩනැගිල්ලකටට ස්ථාන ගතවීම හා බඳවා ගැනිමේ ප්‍රතිපත්තියට හඳුන්වාදී ඇති නව වෙනස්කම් ඉහත සඳහන් දුර්වලතා මඟහැරීමට මණ්ඩලය අපේක්ෂිත ඉලක්ක වලින් කිහිපයක් පමණක් වේ. එකී ඉලක්ක ඉටුකර ගන්නා ආකාරය, දින වකවානු, මුල්‍යමය වටිනාකම හා වගකිම් දරණ අයවලුන්ගේ විස්තර ආදිය සංයුක්ත සැලැස්මේ විස්තරාත්මකව දක්වා ඇත.

(ආ) මණ්ඩලය විසින් විධිමත් ආයෝජන ප්‍රතිපත්තියක් පිළියෙල කර ඇත්තේ 2012 දී වන අතර, එය අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. පසුකාලීනව අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන් අනුව රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල කරනු ලබන ආයෝජන, ආයෝජන ප්‍රතිපත්තියේ 5% කොටසෙන් පරිභාහිරව සැලකීමට තීරණය කරන ලදි. එයට හේතු වූයේ රාජ්‍ය බැංකුවල තැන්පතුවල අවධානම නොසැලකියයුතු මට්ටමක ඇති බව සලකාය. තවද 2017 වසරේ සිට ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකු තුනෙහි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සීමාවන් තුලය. ආයෝජන ප්‍රතිපත්තියට කරන ලද ඉහත සංශෝධන අනුව 87% අවම ප්‍රතිශතය රාජ්‍ය සුරැකුම්පත් හා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල එකතුව ලෙස සලකයි. මේ අනුව කාර්ය සාධනය මැනීම සඳහාකාර්ය සාධන මිණුම් දඬු (KPI) නිවැරදිව හඳුනාගෙන තිබුණි.

තවද 2012 වසරේ ආයෝජන ප්‍රතිපත්තිය හඳුන්වා දුන් කාලය වනවිට අප මණ්ඩලයට (Private Placement) යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රාථමික වෙළදපොලෙන් රාජ්‍ය සුරැකුම්පත් මිළදී ගැනිමේ ක්‍රමය හඳුන්වා දී තිබුණි. එම ක්‍රමය (Private Placement) යටතේ 100% වුවද අවශ්‍ය නම් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කල හැකිව තිබුණි. එයට හේතුව නම් අප සතුව ඇති ඕනෑම මුදල් ප්‍රමාණයකට ඕනෑම දිනයකදී මහ බැංකුව විසින් ඒදිනට පවතින පොලී අනුපාතයන්ට (Weight Average Yield) අප ආයතනයට රාජ්‍ය සුරැකුම්පත් විකිණීමයි. ඒ අනුව 87% ක් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමටත්, වැඩි පොලියක් ලබාගැනීමට ඇති අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා 5%ක් වෙනත් ස්ථාවර පොලී අනුපාතයන් සහිත ආයෝජනයන්හි යෙදවීමටත් තීරණය කර ඇත. එහෙත් 2015 මාර්තු මාසයෙන් පසුව මෙම Private Placement ක්‍රමය අහෝසි කල අතර අනිවාර්යයෙන්ම ලංසු ඉදිරිපත් කර රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසියට සහභාගි වී රාජ්‍ය සුරැකුම්පත් මිලදී ගැනීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදි.

ඒ අනුව මණ්ඩලයට රාජ්‍ය සුරැකුම්පත් මිලදී ගත හැකි වන්නේ 2015 සිට වෙන්දේසි ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රාථමික වෙළදපොලෙන් හා තරගකාරී ද්විතියික වෙළදපොලෙන් පමණි. 2016 පැවැති වාතාවරණය අනුව ද්විතියික වෙළදපොලෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවන ලදි. ඒ අනුව ප්‍රාථමික වෙළදපොලෙන් ලංසු ප්‍රතික්ෂේප වූ අවස්ථාවලදී හා බැඳුම්කර වෙන්දේසියක් නොපැවත්වෙන අවස්ථාවන්හිදී ඇති අරමුදල් ආයෝජනය කිරීමට ඇති එකම විකල්පය වූයේ ප්‍රධාන රාජ්‍ය බැංකු 03හි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමයි. තවද 87% තුල මුලින් සඳහන් වූ රුපියල් ණය නිකුත් කිරීම මහා බැංකුව විසින් නවත්වා ඇත. එසේම මණ්ඩලය විසින් භාණ්ඩාගාර බිල්පත් වල පොලිය අඩු බැවින් එම ප්‍රාථමික වෙළදපොලෙහි ආයෝජනය නොකරන ලදි. එමෙන්ම 87% ප්‍රතිශතය තුල භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කිරීම සඳහා කිසිඳු සීමාවක් නොමැත. එසේ නමුත් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබන්නේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් පූර්ව අනුමත කරන ලද ආයෝජන සීමාවන් යටතේය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) ශ්‍රී ලංකාව පුරා විසරී සිටින ස්වයං රැකියා ලාභීන්, මණ්ඩලයේ ස්වයං රැකියා සාමාජිකත්වයට බඳවා ගැනීම සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධිකරණයෙන් වැඩ සටහන් සකස්කර ක්‍රියාකාරී සැලැස්මට අනුව ස්වයං රැකියා ලාභීන් දැනුවත් කිරීමේ හා බඳවා ගැනීමේ විවිධ ව්‍යාපෘති සිදුකරන ලදි. ස්වයං රැකියා ලාභීන් දැනුවත්කරන රැස්වීම් සඳහා සැලකිය යුතු පිරිසක් සහභාගී වන නමුත් මේ සම්බන්ධව කොපමණ දැනුවත් වුවත් සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන්නේ ඉන් සුළු පිරිසකි.

1988 අංක 47 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතේ 7 වන වගන්තිය අනුව ස්වයංරැකියා ලාභීන් බඳවා ගැනීමට ඉඩකඩ සලසාදී තිබුනත් සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්යවී නොමැති බැවින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන අයපමණක් සාමාජිකත්වය ලබාගනී.

සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්වයංරැකියා ලාභීන් 2000ක් සාමාජික කර ගැනීමට සැලසුම් කලද 996 දෙනෙකු බඳවා ගෙන ඇත්තේ ඔවුන්ගේ ස්වකැමැත්තෙන් ඉදිරිපත්වන ප්‍රවණතාවය තුලයි. දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල 18 මගින් විවිධ ප්‍රදර්ශණ, ජංගම සේවා හා දැනුවත් කිරීම් වැඩසටහන්වලදී ස්වයංරැකියා ලාභීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති අතර, ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන අය බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(අ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව 2017 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකාවේ ස්වයංරැකියා ලාභීන් 2,571,023 වාර්තා වී ඇතත්, පලාත් හා දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය කොට්ඨාශ තුල ස්ථානගත වී ඇති ස්වයං රැකියා ලාභින් ඒකරාශි කර ගෙන මෙම සාමාජිකත්වය ලබා ගැනීමෙන් ඔවුන්ට අත්වන සුරක්ෂිතභාවය පිළිබඳ නිවරැදි අවබෝධයක් ලබා දුන්නද සාමාජිකත්වය ලබා ගැනීම අනිවාර්ය නොවන නිසා ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන පිරිස අවම මට්ටමක පවතින නිසාත් බඳවා ගැනීම අඩු වී ඇත.

ස්වයංරැකියා ලාභීන් සේ.නි.භා.අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමට අනිවාර්යය වන නීති සම්පාදන කටයුතු රාජ්‍ය මට්ටමින් සිදු කිරීම තුළින් සියලු ස්වයංරැකියා ලාභීන්ට සාමාජිකත්වය ලබා දිය හැකි බව යෝජනා කරමි.

(ආ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැළැස්ම තුළ දැනට ක්‍රියාත්මක සේවක කාර්ය සාධන ඇගයීම් ක්‍රමය වැඩිදියුණු කිරීම සහ මාසික දිරිදීමනා ක්‍රමය සේවක කාර්ය සාධනයට සම්බන්ධ කිරීම මණ්ඩලීය සමස්ථ කාර්ය සාධනය දියුණු කිරීමේ උපක්‍රමිකයක් ලෙස දක්වා ඇති අතර, එම කාර්යය ඉටුකිරීම සඳහා බාහිර උපදේශක කණ්ඩායමක් පත් කොට ඇත. ඒ අනුව ඔවුන් එකී පැවැරුම් සම්පූර්ණ කරමින් පවතින අතර අප එකී පැවරුම්වල ප්‍රගතිය 30% හා 25% වශයෙන් දක්වා ඇත. එම ව්‍යාපෘතින් 100% මට්ටමට සම්පූර්ණ වීමට සැළකිය යුතු කාලයක් ගතවනු ඇත.

(ඇ) 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 සහ 22 වන වගන්තිය ප්‍රකාරව පොළි හා ලාභාංශ ගෙවනු ලබනුයේ වාර්ෂික ඉපයීම් වලිනි. මණ්ඩලයේ ආයෝජන සංයුතියේ 95% ක් ම නියෝජනය වන්නේ රජයේ සුරැකුම්පත් හා රාජ්‍ය බැංකු වලින් උපලබ්ධි වන පොළි ආදායම් වලින් වන බැවින් රටේ පවත්නා පොළි අනුපාත මණ්ඩලයේ ලාභය මත සෘජුවම බලපෑමක් ඇතිකරයි. විගණන විමසුමෙහි සඳහන් පරිදි 2010 වර්ෂයේදී 12.5% ක ප්‍රමාණයක් ගෙවීමට හැකිවී ඇත්තේ එවකට ආයෝජන සංයුතිය (Investment Portfolio) ඉහළ පොළි අගයන් ගෙවනු ලබන රජයේ සුරැකුම්පත් වලින් සමන්විතව තිබූ බැවින් හා 2017 වන විට ක්ෂය පොලි අනුපාත 10% ක් පමණ දක්වා අඩු අගයක් ගත් බැවින් මණ්ඩලයේ ඉපයීම් ද සමානුපාතිකව අඩු අගයන් ගෙන ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සෘජුවම මණ්ඩලයේ ඉපයීම් කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින් මණ්ඩලයේ වාර්ෂික ඉපයීම් ඵලදායිතාවය වාර්ෂිකව උච්චාවචනය වේ.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරිකම්

මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් මුල්‍ය ගනුදෙණු වලදී මුල්‍ය රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඒ ආකාරයෙන්ම භාවිතා කරනු ලැබේ. එසේ වුවත් මෙහෙයුම් කටයුතු ඉටුකරගැනිමේ පහසුව තකා අභ්‍යන්තරව සකසන ලද මුල්‍ය කාර්යය පරිපාටියක් සකසා ඇති අතර, එය හුදෙක්ම උපදෙස් මාලාවක් මිස නිතිමය ලියවිල්ලක් ලෙස භාවිතා නොවේ. එසේ වුවද, විගණන විමසුමෙහි සඳහන් මුලය කාර්ය පරිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ඇතිව මහා භාණ්ඩගාරයේ අවසරය සඳහා එය පිළියෙල කරන ලද වර්ෂයේදීම යොමු කර ඇත.

## 4.3 අරමුදල් ආයෝජනය

(a) ඉහත 4.1.1 (ආ) පිළිතුර මෙයටද අදාල වේ.

තවද ආයෝජන ප්‍රතිපත්තිය අනුමත කර ඇත්තේ අධ්‍යක්‍ෂක මණ්ඩලය විසිනි. කාලීන අවශ්‍යතාවයන් මත එය සංශෝධනය කරන ලබන්නේද අධ්‍යක්‍ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිවය. පවතින ව්‍යාපාරික පරිසරය තුල අභියෝග ජය ගැනීම සඳහා මණ්ඩලයට හිතකර පරිදි එය වෙනස් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කලයුත්තකි. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කරනු ලබන සංශෝධනවලට අනුව කරනු ලබන ආයෝජන, ආයෝජන කළඹේ අවදානම අවම කර ගැනීමටත් ආදායම උපරිම කර ගැනීමත් සිදුකරනු ලබයි. තවද වාර්ෂික ආයෝජන සිදුකරනු ලබන්නේ ක්‍රියාකාරි සැලැස්මට හා සංශෝධිත ආයෝජන ප්‍රතිපත්තියට අනුවය. ඒ අනුව අවම 87% ප්‍රතිශතය යටතේ රාජ්‍ය සුරැකුම්පත් සහ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු සලකනු ලැබේ. ඒ අනුව 2017 අවසානය වනවිට මෙම රාජ්‍ය සුරැකුම්ත් හා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු අංශයේ ආයෝජන ප්‍රතිශතයේ එකතුව 93.87% වූ අතර එය 87% වඩා ඉහළ අගයකි. 2017 වසර අවසාන වනවිට රාජ්‍ය සුරැකුම්පත්වල පමණක් කරනු ලැබූ ආයෝජනය 79.29% විය. 2017 අවසාන වනවිට වැඩි අවධානමක් සහිත වෙනත් ස්ථාවර සුරැකුම්පත්වල ආයෝජනය 0.88% පමණි. එහෙත් ඒ සඳහා අනුමත ප්‍රතිශතය 5% කි. ඒ තුල පාවිච්චි නොකරන ලද ප්‍රතිශතය 4.12% කි. කෙටිකාලින ප්‍රතිමිලදී ගැනීම් සඳහා වෙන්කර ඇති ප්‍රතිශතය 2% වන අතර පාවිච්චි කරන ලද ප්‍රතිශතය 1.12% කි. එහි පාවිච්චි නොකරන ලද ප්‍රතිශතය 0.88% කි. කොටස් වෙළඳපොල සඳහා වෙන්කර ඇති ප්‍රතිශතය 6% වන අතර පාවිච්චි කරන ලද ප්‍රතිශතය 4.14% කි. භාවිතා නොකරන ලද ප්‍රතිශතය 1.86 කි. එසේ පාවිච්චි නොකරන ලද ප්‍රතිශතයන්ද යොදා ගනිමින් 2017 අවසාන වනවිට රාජ්‍ය සුරැකුම්පත් හා රාජ්‍ය බැංකුවල ආයෝජන ප්‍රතිශතය ඉහළින් පවත්වා ගෙන යන ලදී.

2017 වර්ෂයේ සිට මණ්ඩලය ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලබන්නේ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට අනුමත කර ඇති සීමාවන් ඇතුලතය. එසේම එය සිදුකරනු ලබන්නේ ලංකාවේ ප්‍රධානම රාජ්‍ය බැංකු 03 සමගිනි. එසේ වුවද රාජ්‍ය සුරැකුම්පතක් වශයෙන් සැලකෙන වර්ෂයකට හෝ ඊට වඩා අඩු කාලයකින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීමට කිසිදු සීමාවක් නොමැත. ඒ අනුව භාණ්ඩාගාර බිල්පත් සහ රාජ්‍ය බැංකුවල තැන්පතු යන දෙවර්ගයේම ආයෝජනයන් වසරකට හෝ ඊට වඩා අඩු කෙටිකාලීන ආයෝජන වේ. ඒ අනුව පැවැති ආයෝජන පරිසරය තුල ස්ථාවර තැන්පතුවල ආයෝජනය වෙනුවට විකල්ප ආයෝජනයක් වීමට ඉඩ තිබුනේ පහළ පොලී අනුපාතයක් ඇති භාණ්ඩාගාර බිල්පත්ය. තවද ද්වීතියක වෙළඳ පොලේ මිලදී ගැනීම් ආරම්භ කල විට රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජන ප්‍රතිශතය ක්‍රමානුකූලව වර්ධනය කිරීමෙන් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ප්‍රතිශතය ක්‍රමානුකූලව අඩු කල හැක.

(ආ) වෙන්දේසියට ඉදිරිපත් කරන ලංසු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වීම සහ ඉහළ ප්‍රතිශතයකින් ප්‍රතික්ෂේප වීම සාමාන්‍ය වෙළඳපොල තත්වයකි. එසේ සිදුවන්නේ අනපේක්ෂිත ලෙස W.A.Y එක පහත වැටීම හෝ අපේක්ෂිත ලෙස එම W.A.Y ඉහළ නොයාම නිසයි. ඉහත අවස්ථා කිහිපයේදී හැර අනෙකුත් අවස්ථාවල ඉහළ ලංසු පිළිගැනීමේ ප්‍රතිශතයකින් රදවා ගෙන ඇත.

(ඇ) ද්විතියික වෙළඳපොලේ පවත්නා සාමාන්‍ය ඵලදා අනුපාතයන් ප්‍රාථමික වෙළඳපොලේ ඵලදා අනුපාතයන් තීරණය කිරීම කෙරෙහි බලපාන එකම සාධකය නොවේ. සමහර අවස්ථාවලදි ද්වීතියික වෙළඳපොලේ ඵලදා අනුපාතයන්ට වඩා ඉහළ මට්ටමකින් ප්‍රාථමික වෙළඳපොලේ ඵලදා අනුපාතයන් තීරණය වේ. යම් යම් අවස්ථාවලදී කුඩා කොටස්වලට වෙන්කර ඉහළ අනුපාතයක් යටතේ ලංසු කිහිපයක් ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රාථමික වෙළඳපොලේ මිල ගණන් ඉහළ යාමේ අපේක්ෂාවෙන් හා ඉහළ ගිය විට එයින් උපරිම ප්‍රයෝජන ලබා ගැනිමේ අරමුණිනි. මණ්ඩලය සැමවිටම ලංසු ඉදිරිපත් කරනු ලබන්නේ වෙළඳපොළ පිළිබඳ මනා අධ්‍යනයකින් පසුවය. එසේ වුවත් විවිධවූ හේතූන් මත අදාල වෙන්දේසි වලදී මිල ගණන් අනපේක්ෂිත ආකාරයට හැසිරිය හැක.

(ඈ) අරමුදලට ඇත්තේ දිගුකාලීන දැක්මකි. ඒ අනුව ඉහළ පොලී අනුපාතයක් සහිතව මිළට ගෙන ඇති බැඳුම්කර ඒ ආකාරයෙන්ම තබා ගැනීමෙන් බැඳුම්කරය කල් පිරෙනතෙක්ම එම ඉහළ පොලී අනුපාතය අප මණ්ඩලයට ලැබේ. ඉහළ පොලී සහිත බැඳුම්කර විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලැබීමට නම් එම පොලී අනුපාතයට වඩා වෙළඳපොල පොලී අනුපාත අඩුවිය යුතුය. එසේ පොලී අනුපාත අඩු අවස්ථාවලදී පමණක් ලාභ ලැබීම සඳහා විකිණිය යුතුය. එවිට ලාභයක් ලැබෙන නමුත් විකිණීමෙන් ලැබෙන මුදල් නැවත අඩු පොලී සහිත බැඳුම්කරවල ක්ෂණිකව ආයෝජනය කිරීමට සිදුවේ. ඒ 87% ක ප්‍රතිශතය රඳවා ගැනීමට දායකවීම සඳහා වේ. මෙවැනි තත්වයක් දිගටම ඇති වුවහොත් අරමුදලෙහි ඉතිරි වනුයේ අඩු පොලී සහිත බැඳුම්කර පමණි. යම් උපායමාර්ගික අවස්ථාවලදී පමණක් එසේ විකිණීමක් කල හැකි වුවද ප්‍රතිපත්තියක් ලෙස දිගුකාලිනව කිරීම නොගැලපෙන කාර්යයකි.

කෙසේ නමුත් ද්විතියක වෙළඳපොලේ මිලදී ගැනිම් ආරම්භ කිරීමෙන් අනතුරුව ද්වීතියික වෙළඳපොලේ බැඳුම්කර විකිණීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබද ප්‍රායෝගිකව අධ්‍යනයක් කිරීමට නියමිතය.

(ඉ) මේ සම්බන්ධයෙන් මහ බැංකුවෙන් ඉල්ලීමක් කර ඇති අතර අවස්ථා කිහිපයකදීම සිහි කැඳවීම් කර ඇත. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවේ. දැනට පවතින ක්‍රමය අනුව ඒ සඳහා අමතර පිරිවැයක් දැරීමට අවශ්‍ය නොවේ. එසේ නමුත් Direct Bidding Facility ලබා ගැනීමට අවශ්‍ය පරිසරය සකසා ගැනිම සඳහා කටයුතු කරමින් පවතී. ආයෝජන අංශය පුළුල් කිරීම සදහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලැබී ඇති අතර වැඩිදුර අනුමැතිය සදහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. ඒ අනුව මහ බැංකුවේ අනුමැතිය ලද විගස හා අවශ්‍ය සේවකයින් බඳවා ගැනීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙය ක්‍රියාත්මක කල හැක.

(ඊ) මේ සඳහා අවශ්‍ය පසුබිම සකස් කරගනිමින් පවතී. මනා අභ්‍යන්තර පාලනයකින් හා අවධානම අවම කර ගනිමින් ව්‍යාපාර කටයුතු කිරීම සඳහා අවශ්‍ය අමතර මානව සම්පත් ලබා ගැනීමට හා ආයෝජනයට අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. අදාල සේවකයන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. එමෙන්ම සේවකයන් වර්තමාන ව්‍යාපාරික ලෝකයට ගැලපෙන ලෙස පුහුණු කරමින් පවතී. මීට අමතරව පරිගණක මිලදී ගැනිමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන මිලදී ගැනිම සඳහා යොමුකර ඇත. තවද ද්වීතියික වෙළඳ පොලේ ගනුදෙනුවලට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා ගැනිමට අවශ්‍ය පසුබිම සකස් කරගෙන ඇත.

(උ) සමාගම් මඟින් ලාභ ලැබීම හෝ නොලැබීම ඒ ඒ සමාගම් වල ක්‍රියාකාරිත්වය මත රඳා පවතී. එයට අභ්‍යන්තර හා බාහිර සාධක බලපාන අතර මෙම අවදානම් තත්වය කොටස් වෙළඳ පොලේ කරනු ලබන ආයෝජන වලට ආවේනික සාමාන්‍ය තත්වයයි. එමෙන්ම අදාල සමාගම් 7 හි පිරිවැය රු මිලියන 200 ක් ලෙස ගත්විට එය කොටස් වෙළඳපොලතුළ මණ්ඩලයේ මුළු ආයෝජන වටිනාකමින් 1.68% ක පමණ සුළු ප්‍රමාණයකි. තවද, එම සමාගම් 7 න් එක් සමාගමක් හැර අනෙක් සමාගම් සියල්ලෙහි ආයෝජන පැරණි ආයෝජනයන් වන අතර, එම සමාගම් 7 සඳහා සමාලෝචිත වර්ෂයේදී ලාභාංශ ලැබී නැති නමුදු සමාගම් 5කින් ආයෝජිත දින සිට විවිධ වර්ෂ වලදී ලාභාංශ ලෙස රු 42,789,484 ක මුදලක් ලැබී ඇත. තවත් සමාගම් 3ක් සඳහා 2018 වසරේ මාර්තු මාසයේදී ලාභාංශ ලෙස රු 5,850,004 ක් ලැබී ඇත. තවද, විගණන විමසුමේ සඳහන් කොටස් වල වෙළඳපොල මිල ඉහල යාමේ ප්‍රවණතාවයක් පවතින අවස්ථා වලදී ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට බලාපොරොත්තු වේ.

### 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) 1981 වර්ෂයේ සිට 2016.12.31 දින දක්වා කාලය තුල දායක මුදල් ලෙස රු. මිලියන 174,184 ලැබී ඇති අතර, 2017.12.31 දිනට එක් එක් සාමාජක ගිණුම් වලට බැර කිරිමට ඉතිරිව ඇති වටිනාකම රු. මිලියන 2,167 කි. එම වටිනාකම ලැබී ඇති සාමාජික මුදල් වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස ගත්කල 1.24% ක් වේ.

2017.12.31 දිනට එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරිමට ඉතිරිව ඇති වටිනාකමින් 2018.01.01 දින සිට 2018.10.01 දින දක්වා ගිණුම්වලට බැරකර ඇති වටිනාකම රු. මිලියන 653 ක් වනු ඇත. ඒ අනුව 2018.10.01 වන දිනට 2016.12.31 දින දක්වා ලැබී ඇති සාමාජික මුදල් වලින් පහත සඳහන් හේතුන් මත සාමාජික ගිණුම්වලට බැර කිරිමට ඇති වටිනාකම රු. මිලියන 1,532 ක් වනු ඇත. මෙම වටිනාකම ලැබී ඇති සාමාජික මුදල් වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස ගත්කල 0.88% ක් වේ.

1. සේවායෝජකයින් සාමාජික මුදල් ගෙවා ඇතත්, එම මුදල් බැර කිරිමට අවශ්‍ය සේවක විස්තර ලබා නොදීම.

2. ආයතන කිහිපයක් සඳහා එක් චෙක්පතක් මගින් සාමාජික මුදල් ගෙවා ඇති අවස්ථා වලදී එම මුදල් වෙන් වෙන් වශයෙන් ආයතන සඳහා විභජනය කළ යුතු ආකාරය පැහැදිලිකර ගැනීමට අපහසුවීම. (අදාල සේවා යෝජක ආයතන දැනට අක්‍රීය තත්වයේ පැවතීම)

3. ආයතන විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික වාර්තාවල ඇතුලත් දත්ත අපැහැදිලි වීම. (අදාල සේවා යෝජක ආයතන දැනට අක්‍රීය තත්වයේ පැවතීම.)

4. ආයතන වල කළමනාකාරිත්වය වෙනස්වීම නිසා, ඊට පෙර කාලවලට අදාල තොරතුරු ලබාගැනීමට නොහැකි වීම සහ එම කාලවල පැනනැගී ඇති ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා නව කළමනාකාරීත්වය සහයෝගය ලබා නොදීම.

5. විශේෂයෙන් වතු ආශ්‍රිත ආයතන වල සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් නොමැතිවීම නිසා සහ නම්වල කොටස් පමණක් සේවා යෝජකයින් ලබාදීම හේතුවෙන් නිවැරදි සාමාජිකයින් හඳුනා ගැනීමේ ගැටළු පැවතීම.

තවද සාමාජික ගිණුම් වලට ගැලපීමට ඇති සාමාජික මුදල් සඳහා නිවැරදි සාමාජික විස්තර සේවායෝජක ආයතන වලින් ලබාගෙන සාමාජික ගිණුම් වලට ගැලපුම් කිරිමට සඳහා වෙනම විශේෂ ඒකකයක් 2016.01.10 දින ආරම්භ කර අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) 2017 සිට කම්කරු දෙපාර්තමේන්තුව සේවක අර්ථසාධක අරමුදල සමග මාසිකව ලියාපදිංචි සේවායෝජක තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රියාවලියක් සිදුවන අතර, එම තොරතුරු පදනම් කරගෙන අනුව්‍යාජ අංක (Dummy) ස්ථිර සේවායෝජක අංකවලට මාරු කිරීම සිදු කරයි.

තවද, මෙම මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල විසින් ආයතන පරීක්ෂණ කිරීමේදී ලබා ගන්නා ස්ථිර සේවායෝජක අංක අනුවද සේවායෝජකයින් විසින් සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වීමෙන් අනතුරුව එම තොරතුරු අප වෙත දැනුම් දෙන අවස්ථා ද තිබෙන අතර එවිට දල අනුව්‍යාජ අංක (Dummy) යටතේ ගෙවීම් කරන දායක මුදල් ස්ථිර සේවායෝජක අංකවලට මාරු කිරීම සිදුකරනු ලබයි.

(ඇ) මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට ප්‍රතිලාභයක් ලෙස නවාතැන් ගැනීම සඳහා අනුරාධපුර නගරයේ පිහිටුවා ඇති නිවාඩු නිකේතනය හුදෙක්ම ලාභ ඉපැයීමේ පරමාර්ථයෙන් ආරම්භ කල ව්‍යාපෘතියක් නොවේ. එය මිලියන 2.6 ක් පමණ වූ මණ්ඩලීය සාමාජිකයන්ට හුදෙක්ම ඔවුන්ගේ සුභසාධනය සඳහා ලබාදී ඇති ප්‍රතිලාභයකි. මෙම නිවාඩු නිකේතනය මේවන විට මණ්ඩලය විසින් සාමාජිකයන්ට හදුන්වා දී ඇති සෞඛ්‍ය, නිවාස සහ අධ්‍යාපන සඳහා වූ ප්‍රතිලාභ 10 ට අමතරව ලබාදී ඇති සුවිශේෂ ප්‍රතිලාභයකි. එම නිසා මෙම නිවාඩු නිකේතනය පවත්වා ගැනීමේදී සුභසාධන මූලධර්ම මත පිහිටා ක්‍රියාත්මක කරනවා විනා පිරිවැය ප්‍රතිලාභ හා ශුද්ධ ලාභ මූලධර්ම පදනමින් පවත්වා ගෙන යනු නොලබයි.

### 4.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානවල සදහන් වන්නේ අතිකාල ගෙවීම පැයකට පැය 1 1/2 ක අනුපාතයකින් වියයුතු බවයි. එසේම එම පනතට අනුව දිනක වැඩකළයුතු කාලය පැය 08 නොඉක්මවිය යුතු බවත් සතියක වැඩකළයුතු කාලය පැය 45 නොඉක්මවිය යුතු බවත් දක්වා ඇත. මේ අනුව දිනකට පැය 08 කට වඩා අඩුවෙන් වැඩ කිරීමට ද සතියකට පැය 45 කට වඩා අඩුවෙන් වැඩ කිරීමට ද කාර්යාල පරිචය තුළ හදුන්වා ඇත්නම් එය නීත්‍යානුකූලවනු ඇති බව ලංකා හාම්පුතුන්ගේ සංගමය නිකුත් කොට ඇති Monograph - 17 ට අනුව දක්වා ඇත.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) මණ්ඩලයේ එක් එක් තනතුරු කාණ්ඩවල අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නොයන පරිදි අවශ්‍ය අංශවලට සහ කොට්ඨාශවලට සේවකයින් ස්ථානගත කරනු ලබයි. එය මණ්ඩලීය කාර්යයන් සුමටව පවත්වා ගැනිමේ අවශ්‍යතාවය

මත සිදුවේ. මණ්ඩලයේ පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර පිරවීම සඳහා කිප අවස්ථාවකදීම ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකලත් සුදුසුකම්ලත් අපේක්ෂයන් ඉල්ලුම් කොට නොමැති වීම දක්නට ලැබුනි. සමහර අවස්ථාවල එනම් 2016.12.27 හා 2017.01.06 යන දිනවල සුදුසුකම්ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණවලට ලක්කළත් ඔවුන්ගේ පසුබිම හා චර්යාවන් විපරම් කිරීමේ දී ඔවුන් නුසුදුසු බවට තොරතුරු ලැබූ හෙයින් එම තනතුර පිරවීමට නොහැකි විය.

එසේ වුවත් මණ්ඩලයේ ධූරාවලිය තුල සභාපති ප්‍රධාන/විධායක නිලධාරි සහ අතිරේක සාමාන්‍යාධිකාරි තනතුර සක්‍රීයව ක්‍රියාත්මකව පවතින බැවින් මණ්ඩලයේ පරිපාලන කටයුතු වලට හා ඉහළ කළමනාකරණ අධීක්ෂණයන්ට දැඩි බලපෑමක් සිදුවී නොමැත.

(ආ) මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම සදහා වූ ප්‍රභවයන් සංශෝධනය කරමින් ඒ සදහා පහත සඳහන් නව ප්‍රභවයන් හඳුන්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අප වෙත අවසර ලබා දී ඇත.

- ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම්
- වෙබ් අඩවි
- රැකියා සොයන්නන් ලියාපදිංචි කරගත් ආයතන
- රැකියා බැංකු

ඒ අනුව 2017 වසරේ කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සදහා එම අනුමත ප්‍රභවයන් තුලින් අයඳුම්පත් ලබාගෙන ඇත.

(ඇ) මේ සම්බන්ධයෙන් මෙම ලිපියේ 2.2.4 (අ) පිළිතුරට වැඩිමනත්වයි. එම නිලධාරියාගේ වැඩබැලීමේ තනතුර ස්ථිර කිරීමේ දී අංශ ප්‍රධානියාගෙන් කාර්ය සාධන වාර්තා ලබාගෙන තිබේ.

(ඈ) පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන ලද දුක්ගැණවිල්ලකට ලබාදුන් නිර්දේශය පරිදි එවකට ස්වයංරැකියා අංශයේ සේවය කල නිලධාරියාට අනුමත සමස්ථ කළමනාකරු තනතුරු සංඛ්‍යාව නොඉක්මවන පරිදි ස්වයංරැකියා කළමනාකරු තනතුරට පත් කොට ඇත. මෙය මණ්ඩලයේ පාලනයෙන් තොර කරුණක් නිසා සිදුවුවකි.

## 5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

දැනට මේ පිළිබඳව අධ්‍යනය කරමින් පවතින අතර ඉදිරියේදි මණ්ඩලයට අදාල ඉලක්ක හඳුනාගැනිමට නියමිතය.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

(අ) සාමාජික ප්‍රතිලාභ, වියන හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය ප්‍රතිපූර්ණය, සේවක දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ඉතිරි නිවාඩු සඳහා ගෙවීම්, සේවය අවසන් කිරීමේදී ගෙවිය යුතු මුදල්, සේවක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය යනාදිය කළමනාකාරිත්වයේ අවශ්‍යතාව මත පූර්ව විගණනයට ලක්වනු ලැබේ.

මෙකී පූර්ව විගණනයට අමතරව පහත දැක්වෙන ප්‍රශ්චාත් විගණනයන් සිදුකර වාර්තා ඉදිරිපත් කර තිබේ.

ගම්පහ ප්‍රාදේශිය කාර්යාල පරීක්ෂාවල කාර්ය මණ්ඩල පැමිණිමේ හා පිටවිමේ ලේඛන පිළිබඳ පරීක්ෂාවල දායකත්ව හා අධිභාර අදායම් ප්‍රගතිය පිළිබඳ පරික්ෂාවල වාහන මිලදී ගැනිම සඳහා ණය, මණ්ඩලීය සේවය අවසන් කරන ලද සේවකයින්ගේ අයවිය යුතු මුදල්, පරිගණක ගත ලැබීම් මුදල් පොත පවත්වා ගැනීම, හම්බන්තොට ප්‍රාදේශිය කාර්යල විගණනය, වාහන අනතුරු පිළිබඳ රක්ෂණ වන්දි ලබා ගැනීම, ස්වයං රැකියා සදහා වන අධිභාර අයකිරීම, ලදුපත් නිකුත් කිරීම හා තැන්පත් කිරීම.

(ආ) මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කරන වාර්ෂික ගිණුම් වාර්ෂිකව අභ්‍යන්තර විගණනයට ලක් කරන අතර, වාර්ෂික වාර්තාවක සඳහන් වන අනෙකුත් සර්ව ආර්ථික විස්තර කිරීම් හා අනෙකුත් විස්තරාත්මක පැහැදිලි කිරීම් පොදු කරුනු බැවින් අභ්‍යන්තර විගණනයට භාජනය කිරීමේ අවශ්‍යතාවයක් නොවේ. සංයුක්ත සැලැස්ම යනු ඉදිරි වර්ෂ 3 සඳහා මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු ඉදිරිපත් කරන ලියවිල්ලක් වන අතර, එය සියළුම අංශයන් විසින් ඉදිරි වර්ෂ 3 දී සිදුකිරීමට අපේක්ෂිත කරුණු විනා අභ්‍යන්තර විගණනයක් සඳහා යොමුකල යුතු තත්‍ය තොරතුරු වලින් සමන්විත වූ ලියවිල්ලක් නොවේ. එබැවින් සංයුක්ත සැලැස්මද විගණනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.

### 6.2 අයවැය ලේඛණමය පාලනය

මණ්ඩලයේ අයවැයගත ආදායම 94% ක් පමණම රඳා පවතින්නේ අවදානම් රහිත රජයේ සුරැකුම්පත් වල ආයෝජනය හා අනෙකුත් ස්ථාවර පොළී ආදායම් සහිත ආයෝජන උපලබ්ධි වන දිනට මූල්‍ය වෙළඳපොලේ පවතින මූල්‍ය අනුපාතයන් හා වෙළඳපොල ලැයිස්තුගත සමාගම් වලින් ලැබෙන ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ නිසාය. ඒ අනුව, එක් එක් ආයොජන අයිතමයන්ගේ ලැබෙන ආදයම් අයවැයට වඩා තත්‍ය අගය වෙනස් විය හැකි වුවත් ආයෝජන සංයුතියක් ලෙස සලකා (Investment Portfolio) අයවැය ගත ආදායමට ළඟාවීම මණ්ඩලයේ උපක්‍රමයයි (Stratergy). ඒ අනුව, 2017 වර්ෂයේදී අයවැයගත මුළු දළ ආදායම හා තත්‍ය මුළු දල ආදායම අතර වෙනස 7.12% වාසිදායක ලෙස පවත්වා ගැනීමට මණ්ඩලයට හැකිවිය.

විගණන විමසුමෙහි සඳහන් පරිදි වියදමෙහි විචලනය සලකා බැලීමේදී මණ්ඩලයට පාලනය කලහැකි සියළු වියදම් ඉතා දැඩි පාලනයක් (Tight Control) යටතේ කළමනාකරණය කරන අතර, සාමාජික ප්‍රතිලාභ වැනි සමහර වියදම් මණ්ඩලයට  කිසිසේත් පාලනයකල නොහැක. වාර්ෂික අයවැය පිළියෙල කිරීමේදී සාමාජික ප්‍රතිලාභ මණ්ඩලයට ඉදිරි වර්ෂයේ වියදම් කිරීමට අපේක්ෂිත අගයන් සඳහන් කරන මුත්, තත්‍ය වියදම තීරණය කරනුයේ සාමාජිකයන් විසින් එකී ප්‍රතිලාභ ඉල්ලුම් කරනු ලැබුනහොත් පමණි. සාමාජික ප්‍රතිලාභ සම්බන්ධයේ අයවැය ගත වියදම හා තත්‍ය වියදම සසඳා බලා අයවැය කළමනාකරණ පාලන උපක්‍රමයක් ලෙස භාවිතා නොවන බව ප්‍රකාශ කිරීම ප්‍රායෝගික නොවේ.

කෙසේ වුවත්, වර්ෂයේ අයවැය ආදායම සහ වියදම හා තත්‍ය ආදායම සහ වියදම අතර වෙනස, පිලිවෙලින් 7.12% හා 18.25% අතර පවත්වාගෙන යාමෙන් සනාථ වනුයේ ඉතා හොඳ අයවැය පාලනයක් මණ්ඩලය සතු බවයි.

තවද අයවැයගත ආදායම් හා වියදම් හා තත්‍ය වියදම් අතර සංසන්දනාත්මක වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව යොමුකරන අතර, එහිදී විචල්‍යතාවයන් පිළිබඳව (Variances) දීර්ඝව සාකච්ඡා කර එකී විචලනයන් මණ්ඩලයට වාසිදායක ලෙස වෙනස් කර ගැනිමට අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලබයි.

### 6.3 ප්‍රසම්පාදනයන්

(a) i, ii, iii

- අවදානම තක්සේරු කිරීම සඳහා උපදේශන සේවය ලබා ගැනිම (රු. 1,050,000)

රුපියල් බිලියන 263 ක් ඉක්මවූ මූල්‍ය ආයෝජනයද, රු. බිලියන 274 ක් ඉක්මවූ සාමාජික ගිණුම් ශේෂයන් සඳහාවූ වගකීම්ද සහිතවූ සේවා නියුකත්යන්ගේ භාර අරමුදල මුහුණ දෙන අවධානම සැලකිල්ලට ගත් විගණන කමිටුව විසින් ලබාදුන් නිර්දේශ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව පිළිගත් සමාගම් 04 කින් මෙකී සේවය සඳහා ප්‍රසම්පාදන අංශය විසින් මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. (2016.02.25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 09/2016). මෙකී මිල කැඳවීම් ප්‍රකාරව සමාගම් 2 ක් පමණක් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. (Ernst & Young, BDO Partners)

අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව මෙකී කාරණය ඉටු කරනු ලබන ආකාරය පිළිබඳ පැමිණ ඉදිරිපත් කිරීමක් (Presentation) සිදුකරන ලෙස යථොක්ත සමාගම් 2ක වෙත දැනුම් දෙන ලදුව Ernst & Young සමාගම පමණක් පැමිණ අදාල ඉදිරිපත් කිරම සිදු කරන ලදි. ඉදිරිපත් කිරීම පිළිබඳව සෑහිමකට පත්වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් Ernst & Young සමාගම වෙතින් මෙකී සේවය ලබාගැනිමට තිරණය කරන ලදි. (2016.10.27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 194/2016)

මේ වන විට යථෝක්ත සමාගම විසින් සියලුම කටයුතු නිමකර තිබූ අතර, පහත දැක්වෙන ලේඛණ අපවෙත ඉදිරිපත් කර තිබේ.

1. අවදානම් කළමනකරණ ප්‍රතිපත්ති (Risk Management Policy)
2. අවදානම් තක්සේරුව හා ලේඛණය (Risk Assessment Dev. Risk Register)

මේ වන විටත් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත අවදානම් කළමනාකරන කමිටුව (RMC) සහ කළමනාකරන අවදානම් කමිටුව (MRC) ද පත්කර තිබෙන අතර ඉදිරි කටයුතු සිදුකරනු ලබයි.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා උපදේශන සේවය ලබා ගැනීම (රු. 293,250)

උක්ත සේවය ලබාගැනිමේ අවශ්‍යතාවය හදිසියේ ඇතිවූ අවශ්‍යතාවයක් බැවින් 2017 වර්ෂයට අදාල 2016 වර්ෂයේදී පිළියෙල කරනු ලබන ප්‍රසම්පාදන සැලසුමට මෙම කාර්යය ඇතුලත් කර නොතිබුණි.

එසේ වුවද, මෙම උපදේශන සේවාව සති 2 ක් වැනි ඉතා කෙටි කාලයකින් නිමකර ගත යුතු නිසාත්, විගණකාධිපතුමා සමඟ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමික්ෂණ මණ්ඩලය (SLAASMB) හි නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම, එකි පාර්ශවයන් දෙක සමඟම ලිඛිත ගණුදෙනු සිදුකිරීම හා එකී පාර්ශව දෙකෙහි නිර්දේශ අනුව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට උපදෙස් ලබාදිම හෝ එකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම හෝ පිළියෙල නොකිරීම

ආදි පූර්ව නිශ්චය කල නොහැකි ඉතා සංකීර්ණ එහෙත් සති 2 ක් වැනි ඉතා කෙටි කාලයකින් නිමකල යුතු උපදේශන සේවාවක් වූ බැවින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13.1 හි ප්‍රකාරව ඒක පාර්ෂවික (Sole Source Selection) තෝරාගැනිමක් මත මෙකී උපදේශන සේවාව ලබාගන්නා ලදි.

තවද, මෙම උපදේශන සේවාව ලබාගැනීම වෙනුවෙන් පුළුල් ලෙස අර්ථනනය කල විෂය පතය (TOR) උපදේශන සේවා ආයතනය වෙත ලබාදී තිබූ අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ලබා ගන්නා ලදි. එමෙන්ම සේ නි හා අරමුදල් මණ්ඩලය හා උපදේශන සේවා ආයතනය සමඟ විධිමත් ගිවිසුමකට එළැඹිනි.

එබැවින්, මෙකී උපදේශන සේවාව සඳහා උපදේශකයෙකු පත් කර ගැනීම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව හා මණ්ඩලයේ වැඩ කටයුතු වලට බාධාවක් නොවන පරිදි ප්‍රසස්ථ ආකාරයෙන් හා විනිවිද භාවයකින් සිදුකර ඇත.

- ආයුගණන විශ්ලේෂකගේ සේවය ලබා ගැනීම (රු. 80,500)

තරඟකාරි ලංසු ලබාගැනීම ප්‍රායෝගික නොවන නිසාත්, වෘත්තිය ආයුගණක විශ්ලේෂකයෙකු සොයා ගැනිම ඉතාමත් අපහසුකාර්යයක් වන නිසාත්, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13.1 (C) ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික පාරිතෝෂික වගකීම නිර්ණය කිරිම හා සහතික කිරිම සඳහා මෙකී උපදේශන සේවාව ලබාගෙන ඇත.

එබැවින් ආයුගණක විශ්ලේෂකයෙකුගේ සේවය ලබාගැනීම සඳහා වියදම් වූ රු. 80,500 ක් උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ විතැන් වීමක් ලෙස සැලකිය නොහැකි බව අපගේ නිගමනයයි.

(ආ) වාර්ෂික ප්‍රසම්පාදන සඳහා සැලසුම් කලද, එකී අරමුදල් ප්‍රසම්පාදන සඳහා සත්‍ය වශයෙන්ම භාවිතා නොකල විට එම අරමුදල් මණ්ඩලයේ ආයෝජන සඳහා යොමු වේ. එබැවින් ප්‍රසම්පාදන සැලසුම් කල ආකාරයට සිදුනොවීම නිසා මණ්ඩලයට මුල්‍යමය වාසියක් මිස මූල්‍යමය අවාසියක් කිසිසේත් සිදු නොවේ. තවද මණ්ඩලය වාර්ෂික ලාභය උපරිමයකර සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභයන් ලබාදිමේ අරමුණෙන් පිරිවැය පාලනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බැවින් ප්‍රසම්පාදන සිදුකිරිමේදි දැඩි පාලනයක් (Tight Control) පවත්වාගෙන යනු ලබයි. සැමවිටම නව මිළදී ගැනිම් කෙරෙහි නැඹුරුතාවයට වඩා පවත්නා උපකරන අරපිරිමැස්මෙන් භාවිතා කිරිමට නිලධාරින් උනන්දු කරවන අතර, දෝෂ සහිත වූ විට අළුත්වැඩියාකර භාවිතා කිරිමට පොළඹවයි. එබැවින් අයවැයගත ප්‍රසම්පාදනයට වඩා තත්‍ය ප්‍රසම්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වාගෙන යාමට මණ්ඩලය උත්සාහ ගනී. විගණන විමසුමෙහි සඳහන් පරිදි අයවැය ගත අගයට වඩා අඩු අගයක් ප්‍රසම්පාදනය සඳහා කැපකිරීම යන මණ්ඩලයේ "පිරිවැය පාලනය" යථා පරිදි සිදුවී ඇති බවට නිදසුනකි.

(ඇ)

(i) නිල ඇඳුම් තෝරාගැනිම භාවිතා කරන්නන්ගේ රුචිය හා කැමැත්තට ප්‍රමුඛතාවය ලබාදී සිදුකරන බැවින් හා එහි ගුණාත්මක භාවය තෝරාගන්නා අමුද්‍රව්‍ය මිශ්‍රණය හා සන්නාමය යනාදි කරුණු රෙදිපිළි තෝරාගැනිමට ප්‍රථම තක්සේරු කලනොහැකි නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ට අනුව විස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙල නොකලද, වාර්ෂික අයවැය පිළියෙල කිරිමේදි අපේක්ෂිත සේවක සංඛ්‍යාව හා එක් එක් නිලධාරියා සඳහා උපරිම වියදම් සලකා අයවැය ඇස්තමේන්තුවෙන් සිදුකරනු ලබයි.

(ii) ලංසු කැඳවීමේ නිවේදන 2017 ජුනි මස 20 සහ 21 දිනයන් වල ප්‍රසිද්ධ පුවත්පත් වල දැන්වීම් පලකල අතර ලංසු කැඳවීම 2017/07/12 වන දින අවසන් කර ඇත. ඒ අනුව පුවත්පත් දැන්වීමේ සිට දින 22 ක කාලයක් ලංසු විවෘත කිරිමට තබා ඇත.

(iii) ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් 03-05 දක්වා වේ. අප මණ්ඩලයේ නිල අඳුම් මිලදී ගැනිමේදී වඩාත් විනිවිද භාවයෙන් සහ උසස් ප්‍රමිතියෙන් යුතු රෙදිපිළි ලබාගැනීම සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂවරු රෙදිපිළි සම්බන්ධ විශේෂඥයෙකු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු, සහකාර සාමාන්‍යාධිකාරිවරු සහ වෘත්තීය සමිති නියෝජනය කරමින් එක් එක් සමිති නියෝජනය සඳහා දෙදෙනෙකු බැගින් සමන්විත විශාල කණ්ඩායමක් (20 දෙනෙකුගෙන් පමණ) සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ගනු ලබයි.

(iv) මණ්ඩලයේ ලංසු ඇපකරය බැංකුවක් හරහා ඉදිරිපත් කරන ලද එකක් විය යුතු බවට ප්‍රකාශ කර ඇත. ඉන්ශ්‍රී ඇපරල් සහ සළුසල ආයතන බැංකුව සමඟ යම් ප්‍රශ්ණයකට මුහුණ දී ඇති බැවින් එයට විකල්පයක් වශයෙන් මුදල් ලබාගන්නා ලෙස මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇත. ලංසු ඇපකර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7 (5.3.11) අනුව නැවත ලබාදෙන ලෙස මුදල් ඇපකරයක් ලබාගත හැකි බව සඳහන් කර ඇත. එයට අදාල චෙක්පතක් ලබාගෙන ඔවුන් මිල ගණන් ඉදිරිපත් කිරිමට සුදුසුකම් ලබා ගන්නා ලදි. ප්‍රසම්පාදන මාර්ග උපදේශන සංග්‍රහයේ 5.3.10 අනුව ලංසු සුරක්ෂණය දින 90 ක් විය යුතුය. තත්ව සුරක්ෂණය දින 120 ක් අප විසින් ඉල්ලා ඇත්තේ වඩාත් ඵලදායිව කර ගැනීමටයි. සියළු ලංසුකරුවන් අවම දිනගණන් අතර සිටින බැවින් සියළුම ලංසු කරුවන් මාර්ගෝපදේශ සංග්‍රයේ 5.3.10 යෙන් විතැන් විමක් සිදුවී නොමැත.

(v) නිලඇඳුම් තෝරාගැනිමේදි මිලට වඩා සේවක අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දැන්වීම අනුකූලව වාර්තාව පිළියෙල කර ඇත.

(vi) රෙදිපිලි සඳහා ප්‍රසිද්ධ ආයතන ගණනාවක් මෙම ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූ අතර, අවසානයේ මේ කිසිඳු සැපයුම්කරුවෙකුටම 100% පිලිවිතරයන්ට අනුව සැපයීමට නොහැකිවී ඇත. මෙය අප මණ්ඩලයේ වරදක් නොව පිලිවිතරයන්ට අදාල මිලදී ගැනීමට හැකිතාක් උත්සාහ දැරුවත්, වෙළඳපොලේ නොමැතිවිම කණගාටුවට කරුණකි. අවසාන වශයෙන් ගතහැකි හොඳම දේ තුලින් සෑහිමට පත්වීමට සිදුවේ.

## 6.4 නොවිසදී ඇති විගණන ජේද

(අ) මෙහි සදහන් මුදල වන රු. 27,497,905/- අදාල වන්නේ සමාගම් දෙකකට අදාල ණයකර ආයෝජනයන් සම්බන්ධවය. එක් සමාගමකට රු. 12,291,556/- සහ අනෙක් සමාගමට රු. 15,206,349/- වශයෙන් වේ. රු. 12,291,556/- වන සමාගමට එරෙහිව ඈවර කිරීමේ නඩුවක් පවතී. මණ්ඩලයට අදාල මුදල් අයකර ගැනීම සදහා මණ්ඩලයද මැදිහත් පාර්ශවකරුවකු ලෙස පෙනී සිටී.

අනෙක් සමාගමට අදාල මුදල වන රු. 15,206,349/- අයකර ගැනීම සදහා සාකච්ඡා වට කිහිපයක් පවත්වා මෙම මුදල වාරික වශයෙන් ගෙවිමට එකග වූ නමුත් මූල්‍ය දුෂ්කරතාවයන් නිසා එම ආයතනය වාරික කිහිපයක් ගෙවා ඉතිරි වාරික ගෙවිම අත්හිටුවන ලදී. මෙම ආයතනය දැනටමත් ක්‍රියාත්මක තත්වයේ පවතින බැවින් මුදල් අයකර ගැනීමට තවදුරටත් අපේක්ෂා කරමි. තවද මෙම සමාගම රජයට අනුබද්ධ ආයතනයක් බැවින් අදාල මුදල් අයකර ගැනීමේ අරමුණින් මණ්ඩලයට අදාල රේඛීය අමාත්‍යාංශ හරහා වරින්වර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහයෝගය ඉල්ලා ඇත. අවසන් වරට මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කර ඇත්තේ 2018 ජූලි 20 දින දීය.

පළමු සමාගමට අදාලව පවතින නීති ක්‍රියාමාර්ග ගිණුම් වාර්තාවේ සඳහන් කල හැකි අතර දෙවන සමාගමෙන් මුදල් අයකර ගැනිමට ගන්නා ලද පියවරද, ඒ ආකාරයෙන් සඳහන් කල හැක.

(ආ) සමාගම් 2 ක රු. 25,227,541 ක කරන ලද ආයෝජනය ඉතා පැරණි ආයෝජනයක් වේ. මෙම සමාගම් 2 ක ඈවරකරණයට ලක් කර ඇති අතර, ඒවාට අදාල නඩු තවමත් විභාග වෙමින් පවතී. ඉහත ආයෝජිත මුදල් උපලබ්ධි කරගත නොහැකි ආයෝජනයක් ලෙස සලකා පොත් වලින් ලියා හැරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. එම තීරණය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ඉල්ලා රේඛිය ආමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ තීරණය අනුව ඉදිරියේදී මේ සම්බන්ධව ක්‍රියා කිරීමට බලාපොරොත්තු වේ.

(c) මෙම සමාගම ඈවර කිරීම සදහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවතී.

2008 වසරේදී ඈවර කිරීම සදහා නියෝගය ලැබී ඇත. ඉන් අනතුරුව එම නියෝගයට විරුද්ධව ඉහළ අධිකරණවල අභියාචනා පෙත්සම් 03ක් විවිධ පාර්ශවයන් මගින් ගොනු කරන ලදී. එකී අභියාචනා පෙත්සම් නිශ්ප්‍රභා වී ඇත. ඉන් පසුව මෙම නඩුව දිසා අධිකරණයේ 2018-02-14 දින ඈවරකරුවකු පත් කිරීම සදහා කැඳවන ලදී. ඉන්පසු මෙම නඩුව 2018-03-28 කැදවා පෙත්සම්කරු විසින් ඈවරකරුවකු පත් කිරීමට පියවර ගන්නා තෙක් බහා තබන ලදී.

අදාල නඩුවට මැදිහත් පාර්ශවයන් ලෙස මණ්ඩලයද සහභාගිව සිටී. ඈවරකිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු මණ්ඩලයට අයකර ගත හැකි මුදල් ප්‍රමාණයක් තිබේද යන්න හා අයකර ගත හැකි මුදල් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත නිගමනයකට පැමිණිය හැක.

(ඇ) පනත සංශෝධනය කලයුතු අකාරය පිළිබඳව අධ්‍යනය කරගෙන යන අතර ඉදිරියේදි සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ

## 7. පද්ධති හා පාලනයන්

(අ) (i) මණ්ඩලයේ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට මේ දක්වා බැරවී නොමැති දායක මුදල්.

(ii) අරමුදල් ආයෝජනය

මණ්ඩලය සෑමවිටම පවත්නා බාහිර ව්‍යාපාර පරිසරය තුල ඉහළ සුරක්ෂිතතාවයක් හා වැඩි ප්‍රතිලාභයක ලැබෙන අයුරින් ආයෝජන කරනු ලබයි. 2017 වසර අවසාන වන විට භාණ්ඩාගාර බැඳුම්කර හා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල කරන ලද ආයෝජන ප්‍රතිශතය 93.87% කි. භාණ්ඩාගාර බැඳුම්කරවල පමණක් කරන ලද ආයෝජනයන්ගේ ප්‍රතිශතය 79.29% කි. තවද වැඩි අවධානමක් ඇති වෙනත් ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය 0.88% පමණී. කොටස් වෙළඳපොල වැනි වැඩි අවධානම් සහිත ආයෝජනයන්හි ප්‍රතිශතය 4.14% ක් වැනි අවම ප්‍රතිශතයක පවත්වා ගන්නා ලදි. තවද වර්ෂය තුළ ඉපයුම් අනුපාතය 11% ක් ලෙස පවත්වාගෙන යන ලදි. ඉහළ සුරක්ෂිතතාවයක් හා වැඩි ප්‍රතිලාභයක් ලැබීම සඳහා පවත්නා ව්‍යාපාර පරිසරයට ගැලපෙන අයුරින් ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩව වෙනස්කිරීම් වලට භාජනය කරනු ලබයි.

(ආ) අයවැය පාලනය

වර්ෂයේ අයවැය ආදායම සහ වියදම හා තත්‍ය ආදායම සහ වියදම අතර වෙනස, පිලිවෙලින් 7.12% හා 18.25% අතර

පවත්වාගෙන යාමෙන් සනාථ වනුයේ ඉතා හොඳ අයවැය පාලනයක් මණ්ඩලය සතු බවයි.

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මණ්ඩලයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනුයේ එකී වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පදනම් කරගෙනය. මණ්ඩලයේ වාර්ෂික අයවැය පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් ලෙස දැනටමත් භාවිතා කරන, එහෙත් ඉතා පැරණි වත්කම්වල දෝෂ සිදුවුවහොත් එකී වත්කම් ප්‍රතිස්ථාපනය (Replacement) කිරීමටද ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කරනු ලැබේ.

ඒ අනුව 2017 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී නව අයිතම (New Item) හා ප්‍රතිස්ථාපන අයිතම (Replacement Item) ප්‍රසම්පාදනය සඳහා සැලසුම් සිදුකරනු ලැබිණි. 2017 වර්ෂයට ප්‍රතිස්ථාපනය (Replacement) ලෙස සැලැසුම් කල බොහෝමයක් අයිතම දෝෂ රහිත වූ නිසා හෝ අළුත්වැඩියා කර පැරණි භාණ්ඩම භාවිතා කිරීම සිදුකල බැවින්, එවැනි අයිතම මිලදී ගැනීම සිදු නොකරන ලදී. තවද, නව අයිතම ලෙස වර්ෂය මුලදී ප්‍රසම්පාදන සැලසුම් කලද, නව අයිතම තබාගැනීමට ඉඩකඩ සීමාවීම, සැලසුම්කල පරිදි භෞතික වෙනස්කම් සිදුනොකිරීම, රාජකාරි ස්ථානයන් වෙනස් වීම, පිරිවැය අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ගැනීම ඉදිරි වර්ෂයට කල්තැබීම ආදී කරුණු නිසා සමහර නව අයිතම (New Item) 2017 වර්ෂයේදී සැලසුම් කලපරිදි මිලදී ගැනීමක් සිදු නොවුනි.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලන

මණ්ඩලීය කාර්ය මණ්ඩලය පරිපාලනය සදහා පරිපාලන හා විනය කාර්ය සංග්‍රහය හඳුන්වා දී ඇති අතර සේවකයින් හා සම්බන්ධ අනෙකුත් අණපනත් වල විධිවිධානවලට අනුව සේවක පරිපාලන හා විනය කටයුතු පවත්වා ගෙන යනු ලබයි. ඒ අතර සේවක ඵලදායකත්වය ඉහළ නැංවීම සඳහා වූ කළමනාකරණ ක්‍රම උපායන් ලෙස සමුච්චිත සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය, රැකියා විස්තර හඳුන්වා දීම, අනුප්‍රාප්තික සැලසුම් හඳුන්වා දීම සේවකයන් සදහා කාර්ය සාධන ඉලක්ක හඳුන්වා දීම හා ඒවා සැසදීම වැනි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කොට ඇත.

(ඉ) සැලසුම් කිරීම

ඉදිරි වර්ෂ 3 දී මණ්ඩලය ඉටුකරගැනීමට අපේක්ෂිත සියළු ඉලක්ක හා එය ලඟාකර ගන්නා ආකාරය සහ දිනවකවානු ඇතුලත් විස්තරාත්මක සැලැස්මක් 2018-2021 සංයුක්ත සැලැස්මේ දක්වා ඇත.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය